කාර්ය සාධන වාර්තාව

2022



ශ්‍රී ලංකා පොලීසිය

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ශ්‍රී ලංකා පොලීසිය
වැය ශීර්ෂ අංකය :- 225

අන්තර්ගතය

පරිච්ඡේදය - 01	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය
පරිච්ඡේදය - 02	ප්‍රගතිය හා ඉදිරි දැක්ම
පරිච්ඡේදය - 03	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය
පරිච්ඡේදය - 04	කාර්ය සාධන දර්ශක
පරිච්ඡේදය - 05	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය
පරිච්ඡේදය - 06	මානව සම්පත් පැතිකඩ
පරිච්ඡේදය - 07	අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය 01
ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය.

1.1 හැඳින්වීම

1865 අංක 16 දරන පොලිස් ආඥා පනතට අනුව බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මහජනතාව ට වඩාත් සංවිධානාත්මක සේවාවක් ලබා දීමේ අරමුණින් පොලිස් සේවාව 1866 සැප්තැම්බර් මස 03 වන දින ආරම්භ කරන ලදි. එදා සිට මේ දක්වා වසර 156 කට අධික කාලයක් ශ්‍රී ලංකා පොලීසිය "රටේ නීතිය හා සාමය" සුරක්ෂිත කොට පවත්වා ගෙන යාමේ භාරදූර වගකීම ඉටු කරමින් සිටී.

ජන ජීවිතයේ සෑම අංශයක ම ආරක්ෂාව සහතික කරමින් සමාජ සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ පෘථුල වගකීම ශ්‍රී ලංකා පොලීසිය වෙත පැවරී ඇත. සමාජ සාමය සහ යහපැවැත්ම සඳහා පාදක වන අපරාධ මර්දනය හා නිවාරණය, මත් උවදුර මැඩලීම, දූෂණ මර්දනය, රථවාහන පාලනය, පරිසර ආරක්ෂණය, ආපදා අවස්ථාවන් හිදී ජනතාවට සහන සැලසීම සහ ප්‍රභූ ආරක්ෂාව යන ප්‍රධාන කාර්යභාරයන් පොලීසියේ විෂය පථයට අදාළ වේ. මීට අමතරව නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම මෙන්ම මහජනයාට ඉතා සමීපව සම්බන්ධ වන 119 හදිසි ඇමතුම් සේවාව ඔස්සේ මහජන පැමිණිලි වලට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමේ සේවාව ක්‍රියාත්මක වන අතර එමගින් ජනතාව වෙත පොලීසියේ සේවාවන් ඉතා ඉක්මණින් ලබා ගැනීමේ ඉඩකඩ පුළුල් කර ඇත.

ඉතා විධිමත්ව සැකසුණු නිල ධූරාවලියකින් සැදුම්ලත් ශ්‍රී ලංකා පොලීසිය සිය සංවිධානාත්මක ව්‍යූහය මගින් ආයතනයේ ක්‍රියාකාරීත්වය මනා සහසම්බන්ධතාවයකින් යුක්තව ඔජනංවා ඇත.

සංවිධානාත්මක ව්‍යුහයේ ඉහළින්ම ක්‍රියාත්මක වන තනතුර වන පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ව්‍යුහයේ අනිකුත් තනතුරු ක්‍රියාත්මක වන අතර, ඒ අනුව පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, පොලිස් අධිකාරි, සහකාර පොලිස් අධිකාරි, ප්‍රධාන පොලිස් පරීක්ෂක, පොලිස් පරීක්ෂක, උප පොලිස් පරීක්ෂක, මහ සැරයන්, පොලිස් සැරයන්, පොලිස් සැරයන් රියදුරු, පොලිස් කොස්තාපල්, පොලිස් කොස්තාපල් රියදුරු ලෙස නිල ධූරාවලිය ඉහළ සිට පහළට ක්‍රියාත්මක වේ. මෙම නිල ධූරාවලිය ආයතනගත ව්‍යුහයක් මගින් ක්‍රියාත්මක කරනු ලබන අතර, එම ව්‍යුහය ප්‍රධාන වශයෙන් ජනතාව සමඟ සෘජුවම සම්බන්ධ වන ප්‍රාදේශිය පොලිස් කොට්ඨාස සහ එම ප්‍රාදේශීය කොට්ඨාස වල රාජකාරි සඳහා පරිපාලනමය හා සහයෝගාත්මක සේවාවන් සපයනු ලබන ක්‍රියාකාරී කොට්ඨාස ලෙස වර්ග දෙකකට බෙදා දැක්විය හැකිය.

ප්‍රාදේශීය කොට්ඨාස ව්‍යුහයේ ඉහළින් ම පළාත් නියෝජනය වන අතර එහි කටයුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. පළාතට අයත් සෑම දිස්ත්‍රික්කයක් භාරවම නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු පත්කොට ඇති අතර ඔහු යටතේ පවතින දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස කිහිපයකට බෙදා පාලනය කෙරේ. මෙම ප්‍රාදේශීය පොලිස් කොට්ඨාසයක් භාරව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකු හෝ පොලිස් අධිකාරිවරයෙකු පත්කොට ඇති අතර එබඳු ප්‍රාදේශිය පොලිස් කොට්ඨාස 45 ක් දිවයින තුළ ක්‍රියාත්මක වේ. එම ප්‍රාදේශිය පොලිස් කොට්ඨාසයක් පොලිස් දිස්ත්‍රික්ක කිහිපයකට බෙදා එම දිස්ත්‍රික්කයක් සහකාර පොලිස් අධිකාරිවරයෙකු යටතට පත්කොට ඇති අතර, එබඳු පොලිස් දිස්ත්‍රික්කයකට පොලිස් ස්ථාන කිහිපයක් ඇතුළත් කොට ඇත. මෙවැනි පොලිස් දිස්ත්‍රික්ක 160 ක් දිවයින තුළ පිහිටා ඇති අතර 2022.12.31 දිනට එම පොලිස් දිස්ත්‍රික්ක වලට අයත් පොලිස් ස්ථාන 607 ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ.

සියළු පොලිස් ස්ථාන, මූලස්ථාන පොලිස් ස්ථාන හා සාමාන්‍ය පොලිස් ස්ථාන ලෙස වර්ගකොට සෑම පොලිස් ස්ථානයක්ම විවිධ මට්ටම් යටතේ ශ්‍රේණිගත කර ඇත. ඒ අනුව A1 අධිශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 46 ක් ද A1 ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 83 ක්ද A2 ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 55 ක්ද A3 ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 129 ක්ද B ශ්‍රේණියේ පොලිස් ස්ථාන 184 ක් ද C ශ්‍රේණියේ පොලිස් ස්ථාන 31 ක් ද සහ D

ශ්‍රේණියට අයත් පොලිස් ස්ථාන 79 ක් ද ලෙස 2022.12.31 දිනට මෙම පොලිස් ස්ථාන 607 ශ්‍රේණිගත කර ඇත. මූලස්ථාන පොලිස් ස්ථානයක් භාරව ප්‍රධාන පොලිස් පරීක්ෂක වරයෙකු සහ අනෙකුත් පොලිස් ස්ථාන භාරව ස්ථානාධිපතිවරයෙකු ලෙස ප්‍රධාන පොලිස් පරීක්ෂක වරයෙකු හෝ පොලිස් පරීක්ෂක වරයෙකු පත් කොට ඇති අතර ඔවුන් විසින් තමන් යටතේ සේවය කරනු ලබන පොලිස් පරීක්ෂකවරුන්, පොලිස් සැරයන්වරුන් සහ පොලිස් කොස්තාපල්වරුන් මගින් සෘජුවම මහජනතාව වෙත පොලීසියේ සේවාවන් ක්‍රියාත්මක කරනු ලබයි.

පොලීසියේ කාර්යභාරයට අදාළ විවිධ විෂයයන් සම්බන්ධයෙන් ද නිල ධූරාවලියක් ක්‍රියාත්මක වේ. ඒ අනුව අපරාධ, මත්ද්‍රව්‍ය අපරාධ, රථ වාහන, ප්‍රභූ ආරක්ෂාව, සහායක සේවා, ප්‍රචර්ථන ආදී විෂයයන් භාරව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුන් පත්කොට ඇති අතර ඔවුන් යටතේ දිසාවන් ලෙස විෂයයන් එකක් හෝ කිහිපයක් එක්කොට එබඳු දිසාවක් භාරව නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු පත් කර ඇත. එම දිසාවන් යටතට ගැනෙන ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස 79 ක් 2022.12.31 දින වන විට ක්‍රියාත්මකව පවතින අතර එම කොට්ඨාස භාරව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකු හෝ පොලිස් අධිකාරිවරයෙකු, අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කොට අදාළ කොට්ඨාසයේ පරිපාලන කටයුතු ක්‍රියාත්මක කෙරේ.

ශ්‍රී ලංකා පොලීසිය සතු විශේෂිත අංශයක් වන විශේෂ කාර්ය බලකාය ද සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබන අංශයකි. නියෝජ්‍ය පොලිස්පති වරයකු යටතේ ක්‍රියාත්මක වන විශේෂ කාර්ය බලකාය විවිධ වැටලීම් මගින් ඉතා කාර්යක්ෂම සේවයක් ලබා දෙමින් ශ්‍රී ලංකා පොලීසිය වෙත ඔවුන්ගේ දායකත්වය හිමි වන අතර විශේෂ කාර්ය බලකාය සතු නිලධරයන් සංඛ්‍යාව 8272 කි.

පොලිස් රාජකාරී සඳහා අවශ්‍ය විවිධ විශේෂඥ දැනුම ලබා ගැනීම සඳහා පොලිස් සහායක සේවාවක්ද ක්‍රියාත්මකව පවතින අතර ඒ යටතේ වෛද්‍ය, ඉංජිනේරු, සූපවේදී, කාර්මික, තොරතුරු තාක්ෂණ වැනි විශේෂිත සේවාවන් සඳහා 1272 කට ආසන්න නිලධරයන් සංඛ්‍යාවක් සුවිශේෂී රාජකාරියක නියැලී සිටී. මීට අමතරව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සහ, රජයේ විවිධ සේවාවන්ට අයත් වෛද්‍ය, ඉංජිනේරු, ගණකාධිකාරී, පරිපාලන නිලධාරී, භාෂා පරිවර්තක, සංවර්ධන නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරී, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර, කාර්යාල කාර්ය සහායක වැනි දෙපාර්තමේන්තු ගත නොවන තනතුරු වලට අයත් නිලධරයන් සහ අපරාධ විද්‍යාඥ, පර්යේෂණ නිලධාරී, සංවර්ධන සහකාර නිලධාරී සහ විවිධ කම්කරු වෘත්තීන්ට අයත් දෙපාර්තුමේන්තුගත නිලධරයන්ද ඇතුළත් සිවිල් කාර්ය මණ්ඩල නිලධරයන් 4279 කට අධික පිරිසක් පොලිස් රාජකාරී සඳහා සුවිශේෂී සහයක් ලබා දෙමින් සේවයේ යෙදී සිටී.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර



දැක්ම

අපරාධ සහ ප්‍රචණ්ඩත්වය
පිළිබඳව බියකින් තොරව
විශ්වාසයෙන් යුතුව
ජීවත් වීමට හැකි සාමකාමී
පරිසරයක් බිහි
කිරීම.

මෙහෙවර

සැමට සමාන,
කිසිවකුටත් අගතියක්
සිදුකිරීමකින් තොරව
අපරාධ සහ
ත්‍රස්තවාදය
වැළැක්වීමටත්, සාමය
ආරක්ෂා කරගැනීමටත්,
දිවයිනේ නීතිය
පවත්වාගෙන යාමටත්,
එය ක්‍රියාත්මක කිරීමටත්
ශ්‍රී ලංකා පොලිසිය
විශ්වාසයෙන් යුතුව ක්‍රියා
කිරීමට ඇප කැප වී සිටියි.

1.3 ප්‍රධාන කාර්යයන්

- මහජන ආරක්ෂාව හා සාමය පවත්වාගෙන යාම.
- අපරාධ පාලනය හා වැළැක්වීම.
- අපරාධ විමර්ශනය හා නඩු මෙහෙයවීම.
- මාර්ග ආරක්ෂාව හා රථවාහන පාලනය.
- ප්‍රභූ ආරක්ෂාව.
- පරිසර ආරක්ෂණ කටයුතු සහ ආපදා අවස්ථාවන්හි දී අදාළ අංශ වෙත සහාය ලබාදීම.
- කැරළි හා දූෂණ මර්දන සහ විවිධ පැමිණිලි විසඳීම.
- පොලිස් නිෂ්කාශන හා පසුබිම් වාර්තා අදාළ අංශ සහ පුද්ගලයින් වෙත නිකුත් කිරීම.

1.4 සංවිධාන සටහන


පොලිස්පති
ක්‍රියාකාරී කොට්ඨාස
ප්‍රාදේශීය කොට්ඨාස
ජ්‍යෙ.නි.පො.ප. පරිපාලන
නි.පො.ප. පොලිස් මූලස්ථානය
නි.පො.ප. අගමැති ආරක්ෂක දිසාව
නි.පො.ප. විශේෂ ආරක්ෂක දිසාව
අධ්‍යක්ෂ සිවිල් පරිපාලන
ප්‍රධාන ගණකාධිකාරි ශ්‍රී ලංකා පොලිසිය
ජ්‍යෙ.නි.පො.ප. සහායක සේවා
නි.පො.ප ප්‍රචර්ථන
නි.පො.ප. ප්‍රවාහන හා සංදේශ
නි.පො.ප. බඳවා ගැනීම් හා පුහුණු
නි.පො.ප. සුභසාධක
විධායක අධ්‍යක්ෂ ජාතික පොලිස් අභ්‍යාස ආයතනය
ජ්‍යෙ.නි.පො.ප. අපරාධ හා රථවාහන
නි.පො.ප. අපරාධ
නි.පො.ප. මත්ද්‍රව්‍ය කාර්යාංශය
නි.පො.ප ප්‍රජා පොලිස් හා පරිසර ආරක්ෂණ
නි.පො.ප. නාවික හා සංචාරක
නි.පො.ප. රථවාහන කළමණාකරන හා මාර්ග ආරක්ෂාව
ජ්‍යෙ.නි.පො.ප. පොලිස් මූලස්ථානය
නි.පො.ප. ක්ෂේත්‍ර බලකා මූලස්ථානය
නි.පො.ප පර්යේෂණ හා තොරතුරු තාක්ෂණ
නි.පො.ප. පොලිස්පතිගේ මාණ්ඩලික
නි.පො.ප . විශේෂ කාර්යාංශය
නි.පො.ප. නීති
නි.පො.ප. අ.ප. දෙපාර්තමේන්තුව
නි.පො.ප. මානව සම්පත් කළමණාකරණ
නි.පො.ප. මාධ්‍ය
අණ දෙන නිළධාරි පොලිස් විශේෂ කාර්ය බලකාය
ජ්‍යෙ.නි.පො.ප බස්නාහිර පළාත
නි.පො.ප. කොළඹ
නි.පො.ප. ඛ/ප උතුර
නි.පො.ප. ඛ/ප දකුණ
නි.පො.ප. කළුතර
නි.පො.ප. ඛ/ප අපරාධ
නි.පො.ප. ඛ/ප රථවාහන
නි.පො.ප. ඛ/ප ප්‍රජා පොලිස් හා පරිසර ආරක්ෂණ
ජ්‍යෙ.නි.පො.ප දකුණු පළාත
නි.පො.ප. ගාල්ල
නි.පො.ප. මාතර හා හම්බන්තොට
ජ්‍යෙ.නි.පො.ප සබරගමුව පළාත
නි.පො.ප. රත්නපුරය
නි.පො.ප. කෑගල්ල
ජ්‍යෙ.නි.පො.ප උතුරු මැද පළාත
නි.පො.ප. අනුරාධපුරය
නි.පො.ප. බදුල්ල
නි.පො.ප. මොණරාගල
ජ්‍යෙ.නි.පො.ප ඌව පළාත
නි.පො.ප. ත්‍රිකුණාමලය
නි.පො.ප. අම්පාර
නි.පො.ප. මඩකලපුව
ජ්‍යෙ.නි.පො.ප නැගෙනහිර පළාත
නි.පො.ප. මහනුවර
නි.පො.ප. නුවරඑළිය
නි.පො.ප. මාතලේ
ජ්‍යෙ.නි.පො.ප මධ්‍යම පළාත
නි.පො.ප. කුරුණෑගල
නි.පො.ප. පුත්තලම
ජ්‍යෙ.නි.පො.ප වයඹ පළාත
නි.පො.ප. යාපනය
නි.පො.ප. කිලිනොච්චිය
නි.පො.ප. වන්නි
ජ්‍යෙ.නි.පො.ප උතුර පළාත

1.5. ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන අංශ

❖ ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ව්‍යුහය (2022.12.31 දිනට ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ප්‍රමාණය 45 කි.)



❖ **ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස ව්‍යුහය (2022.12.31 දිනට ක්‍රියාකාරී පොලිස් කොට්ඨාස ප්‍රමාණය 75 කි.)**



❖ විශේෂ කාර්ය බලකායේ ව්‍යුහය.



1.6 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පළාත් සභාව යටතේ පවතින ආයතනගත / අරමුදල්

වගු අංක - 01

අනු අංකය	අරමුදලෙහි නම	2022.12.31 වන දිනට ශේෂය
1	පොලිස් ත්‍යාග අරමුදල	**52,571,185.00**
2	පොලිස් අනුග්‍රහ අරමුදල	**31,105,080.97**
3	පොලිස් සුබ විහරණ අරමුදල	**15,067,938.04**

මූලාශ්‍රය - ගණකාධිකාරී මුදල් , පොලිස් මූලස්ථානය

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

වගු අංක - 02

1	අ) ව්‍යාපෘතියේ නම	China Grant
	ආ) දායක නියෝජිතායතනය	Hytera communication cooperation limited
	ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	චීන රජයේ ආධාර
	ඈ) ව්‍යාපෘති කාල සීමාව	කාල සීමාව දක්වා නොමැත
2	අ) ව්‍යාපෘතියේ නම	CCTV
	ආ) දායක නියෝජිතායතනය	MAG ආයතනය
	ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු.841850.00
	ඈ) ව්‍යාපෘති කාල සීමාව	2022.04.06 සිට සතියක්
3	අ) ව්‍යාපෘතියේ නම	අවි රාක්ක
	ආ) දායක නියෝජිතායතනය	MAG ආයතනය
	ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ලබා දී නොමැත
	ඈ) ව්‍යාපෘති කාල සීමාව	2022.08.01 සිට 2022.10.01

4	**අ) ව්‍යාපෘතියේ නම**	අවි රාක්ක
	ආ) දායක නියෝජිතායතනය	MAG ආයතනය
	ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ලබා දී නොමැත
	ඈ) ව්‍යාපෘති කාල සීමාව	මාස 03යි.
5	**අ) ව්‍යාපෘතියේ නම**	ශ්‍රී ලංකා රිය අනතුරු කළමණාකරණ දත්ත පද්ධතිය. (SLADMS)
	ආ) දායක නියෝජිතායතනය	ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
	ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ඇස්තමේන්තු ගත කර නොමැත
	ඈ) ව්‍යාපෘති කාල සීමාව	මෙම කාලයට අදාලව අවබෝධතා ගිවිසුම් අත්සන් කර නොමැත.
6	**අ) ව්‍යාපෘතියේ නම**	Fiber optic තාක්ෂණ ව්‍යාපෘතිය
	ආ) දායක නියෝජිතායතනය	ජාත්‍යන්තර පොලිස් මූලස්ථානය
	ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ඩොලර් 25000
	ඈ) ව්‍යාපෘති කාල සීමාව	2022 සිට වසර 05ක්
7	**අ) ව්‍යාපෘතියේ නම**	අවි ගාරය (කන්ටේනර්)
	ආ) දායක නියෝජිතායතනය	MAG ආයතනය
	ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	ලබා දී නැත
	ඈ) ව්‍යාපෘති කාල සීමාව	2022 වර්ෂය
8	**අ) ව්‍යාපෘතියේ නම**	ඉන්දියානු ණය යෝජනා ක්‍රමය
	ආ) දායක නියෝජිතායතනය	ඉන්දියානු EXIM බැංකුව
	ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	මූල්‍යකරණය 12 3,300,000,000.00
		මූල්‍යකරණය 12 14,100,000,000.00
	ඈ) ව්‍යාපෘති කාල සීමාව	2021 - 2023

මූලාශ්‍ර - විශේෂ කාර්ය බලකාය, කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලය, පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය, රථවාහන පාලන හා මාර්ග ආරක්ෂණ කොට්ඨාසය, මහජන සාමය කළමනාකරණ කොට්ඨාසය

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය - 2022

2.1 අපරාධ, මත්ද්‍රව්‍ය අපරාධ, සුරාබඳු සහ වෙනත් වැරදි.

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන අපරාධ, විමර්ශන කාර්යයන් සඳහා මූළිකවම බරපතල ගණයේ සහ බරපතල නොවන ගණයේ අපරාධ ලෙස වර්ග කෙරේ. මෙම බරපතල ගණයේ අපරාධ බල අපරාධ නැතහොත් ග්‍රහණ අපරාධ ලෙසද හඳුන්වනු ලබන අතර එබඳු අපරාධ කාණ්ඩ 26 කට ඇතුළත් කොට ඇත.

බරපතල නොවන අපරාධ සුළු අපරාධ ලෙසද හඳුන්වනු ලබන අතර ඒවා පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ සහ දේපළ වලට එරෙහි සුළු අපරාධ ලෙසද බෙදා දක්වනු ලැබේ.

තවද මෙම පරිච්ඡේදය යටතේ ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ විග්‍රහයට බඳුන් කෙරෙන අතර එමගින් හෙරෝයින් ඇතුළු නිද්‍රාජනක ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත. එමෙන්ම සුරාබඳු වැරදි යටතේ නීති විරෝධී මත්පැන් සම්බන්ධ වැරදි ඇතුළත් කර ඇති අතර විවිධ ව්‍යවස්ථාපිත පනත් මඟින් තහනම් කරන ලද වැරදි සහ ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන දූෂණ වැරදිද මෙම පරිච්ඡේදය මගින් විග්‍රහයට බඳුන් කර ඇත.

2.1.1 බල අපරාධ

බල අපරාධ යනු දරුණු ගණයේ අපරාධයි. පෙර කී පරිදි මෙම අපරාධ ග්‍රහණ අපරාධ ලෙසද හඳුන්වනු ලබන අතර දෙපාර්තමේන්තු නියෝග සී.2 මගින් වාර්තා කළ යුතු අපරාධ ලෙස හඳුන්වා ඇත. මෙබඳු අපරාධ කාණ්ඩ 26 ක් ලෙස බෙදා දක්වා ඇති අතර 2022 වසරේ මෙම අපරාධ වල වාර්තා වීම් සහ විසඳීම් සම්බන්ධව ප්‍රගතිය 2020 සහ 2021 වසර හා සංසන්දනාත්මකව පහත වගු මගින් දක්වා ඇත.

බල අපරාධ වගුවෙහි අනු අංක 04, 16, 17, 25 යටතේ එන අපරාධ වල මූල්‍යමය වටිනාකම් වල 2021 වසරෙහි පැවති අගයන් සංශෝධනය වී ඇති අතර, මෙම වගුවෙහි එම සංශෝධිත මූල්‍යමය වටිනාකම් සහ ප්‍රමාණයන් ඇතුළත් කර ඇත. ඒ අනුව 2021 වසරේ රු.25000 ලෙස පැවති මූල්‍යමය අගයන් රු.50000 ලෙසද, රු.300000 ක් ලෙස පැවති මූල්‍යමය අගය රු.500000 ලෙසද සංශෝධනය වී ඇත. තවද පෙර පැවති හෙරොයින් ග්‍රෑම් 2 ක ප්‍රමාණය ග්‍රෑම් 5 දක්වා වැඩි කර ඇති අතර, නිද්‍රාජනක ද්‍රව්‍යයක් වන මෙත් ඇම්පිටමින් (අයිස්) ග්‍රෑම් 10 ක් ලෙස අළුතින් ඇතුළත් කර ඇත.

වගු අංක - 03 **බල අපරාධ**

	ග්‍රහණ අපරාධ	2020				2021				2022			
		වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
1	අපහරණය	633	563	70	89%	629	536	93	85%	582	509	73	87%
2	පැහැරගෙන යාම	166	149	17	90%	172	155	17	90%	174	154	20	89%

	ග්‍රහණ අපරාධ	2020				2021				2022			
		වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
3	ගිනි තැබීම හෝ පුපුරණ ද්‍රව්‍ය වලින් අනර්ථය සිදුකිරීම	338	255	83	75%	361	287	74	80%	509	396	113	78%
4	රු50000 ට වැඩි අලාභ ඇති වන පරිදි සිදු කෙරෙන අනර්ථය	323	292	31	90%	265	234	31	88%	532	433	99	81%
5	ගෙවල් බිඳීම	6499	3791	2708	58%	6840	3759	3081	55%	8645	4846	3799	56%
6	බරපතල තුවාල සිදුකිරීම	892	872	20	98%	854	812	42	95%	923	873	50	95%
7	අන්තරාදායක ආයුධවලින් (පිහි ආදිය) තුවාල කිරීම)	1962	1891	71	96%	1843	1740	103	94%	1888	1750	138	93%
8	මනුෂ්‍ය ඝාතනය	464	438	26	94%	521	495	26	95%	559	507	52	91%
9	මනුෂ්‍ය ඝාතනයට තැත්කිරීම / සියපණ හානිකර ගැනීමට අනුබලදීම	103	102	1	99%	105	97	8	92%	113	101	12	89%
10	ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට වැඩි)	300	282	18	94%	256	245	11	96%	257	236	21	92%
11	ව්‍යස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට අඩු) චින්දිතයාගේ කැමැත්ත ඇතිව	1292	1262	30	98%	1377	1341	36	97%	1391	1336	55	96%
	ව්‍යස්ස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට අඩු) චින්දිතයාගේ කැමැත්ත නොමැතිව	361	333	28	92%	344	319	25	93%	338	322	16	95%
12	නීති විරෝධී රැස්වීම / කැරළි කෝලාහලය	30	29	1	97%	15	13	2	87%	210	169	41	80%
13	කොල්ලකෑම	2148	1442	706	67%	2277	1557	720	68%	3065	1950	1115	64%
14	අස්වාභාවික වැරදි හා බරපතල ලිංගික අපයෝජනය	677	661	16	98%	649	625	24	96%	571	543	28	95%
15	බලෙන් ලබා ගැනීම (යම් දේපළක් හෝ වටිනා ඇපයක් හෝ වටිනා ඇපයකට හැරවිය හැකිව අත්සන් කරනු ලැබූ හෝ මුද්‍රා තබනු ලැබූ යමක්)	120	108	12	90%	115	92	23	80%	86	74	12	86%
16	රුපියල් 500000/- කට (රුපියල් පන් ලක්ෂයකට) වඩා වටිනාකමකින් යුතු සාපරාධී සාවද්‍ය පරිහරණය, සාපරාධී විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීම	2891	1506	1385	52%	2207	971	1236	44%	2339	1165	1174	50%
	රුපියල් 50000 ට වැඩි වටිනාකම ඇති වැවිලි දුව්‍ය සොරකම	59	51	8	86%	63	50	13	79%	52	45	7	87%
	රුපියල් 50000 ට වැඩි වටිනාකම ඇති ගව සොරකම	524	415	109	79%	365	298	67	82%	726	552	174	76%
17	රුපියල් 50000 ට වැඩි වටිනාකම ඇති දේපළ සොරකම	4073	2770	1303	68%	4801	3167	1634	66%	5404	3542	1862	66%
18	ව්‍යාජ මුදල් නෝට්ටු සන්තකය හා මුද්‍රණය	68	64	4	94%	40	40	0	100%	36	36	0	100%
19	රාජ්‍ය විරෝධී අන්දමින් සිදු කෙරෙන වැරදි	1	1	0	100%	1	1	0	100%	0	0	0	0%
20	ළමුන්ට කෲර ලෙස සැළකීම	76	74	2	97%	87	84	3	97%	83	82	1	99%
21	ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම	26	25	1	96%	15	15	0	100%	25	25	0	100%
22	කුට්ටනය කිරීම හා තැනැත්තන් වෙළඳාම් කිරීම	28	16	12	57%	32	30	2	94%	10	10	0	100%
23	පීඩාකාරී ආයුධ ආඥා පනත යටතේ ගැනෙන වැරදි	110	109	1	99%	100	98	2	98%	169	165	4	98%
14	ස්වයංක්‍රිය ගිනි අවි හෝ රිපීටර් තුවක්කු ලඟතබා ගැනීම	34	34	0	100%	22	21	1	95%	27	26	1	96%
25	හෙරොයින්, කොකේන්, මෝෆින් කිසියම්ම ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම, වෙළඳාම් කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හෝ හෙරොයින් ග්‍රෑම් 2 ක් හෝ ඊට වැඩි කොකේන් ග්‍රෑම් 02 ක් හෝ ඊට වැඩි මෝෆින් ග්‍රෑම් 03 ක් හෝ ඊට වැඩි ඔපියම් ග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි ගංජා කි.ග්‍රෑම් 5 ක් හෝ ඊට වැඩි හා හෂිස් කි.ග්‍රෑම් 1 ක ප්‍රමාණයක් වූ අන්තරාදායක මත්ද්‍රව්‍ය ලඟ තබා ගැනීම	6811	6789	22	100%	10959	10945	14	100%	8268	8204	64	99%
26	පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීම	89	88	1	99%	97	95	2	98%	170	167	3	98%
	එකතුව	**31098**	**24412**	**6686**	**79%**	**35412**	**28122**	**7290**	**79%**	**37152**	**28218**	**8934**	**76%**

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

(**සැ.යු.** මෙහි " විසඳූ" යන්න මගින් පොලීසිය විසින් විමර්ශන අවසන් කළ සංඛ්‍යාව, අධිකරණයේ විභාග වන සංඛ්‍යාව සහ අධිකරණය විසින් විභාග කොට අවසන් කළ සංඛ්‍යාව යන සියල්ල අදහස් වේ.)

වගුවෙහි සඳහන් වසර තුන තුළ අපහරණය වැරදි වල අනුක්‍රමික අඩුවීමක් දක්නට ලැබේ. 2020 වසරට සාපේක්ෂව අපහරණය වැරදි 633 සිට 629 දක්වා 2021 වසරේ 1% කින්ද, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී 582 ක් දක්වා 7% කින්ද පහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2020 වසරේ 89% සිට 2021 වසරේ 85% දක්වා පහළ යාමක් දක්නට ඇතත් 2022 වසරේ 87% ක් දක්වා සුළු ඉහළ යාමක් දක්නට ලැබේ.

පැහැර ගැනීම් අපරාධ 2020 වසරේ 166 ක් සහ 2021 වසරේ 172 ක් වාර්තා වී ඇති අතර, 2022 වසරේද සුළු වැඩි වීමක් පෙන්නුම් කරමින් 174 ක් වාර්තා වී ඇත. එය 2021 වසරට සාපේක්ෂව 1% ක ඉහළ යාමකි. 2021 වසරේ පැහැර ගැනීම් අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 90% ක් ලෙස දැක්වෙන අතර, එම ප්‍රතිශතය 2022 වසරේදී 89% දක්වා අඩුවී ඇත.

ගිනි තැබීම් හෝ පුපුරණ ද්‍රව්‍ය වලින් අනර්ථය සිදු කිරීම් අපරාධ 338 ක් 2020 වර්ෂයේ වාර්තා වූ අතර 2021 වසරේ එය 361 ක් දක්වා 7% කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේ මෙම අපරාධ 509 ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 41% ක සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කර ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 80% සිට 2022 වසරේ 78% ක් දක්වා තරමක පහළ යාමක් දක්නට ලැබේ.

වගුවට අනුව රු 50000 ට වැඩි අනර්ථය සිදු කිරීම් අපරාධ 2021 වසරේ 265 ක් වාර්තා වූ අතර, ඊට සාපේක්ෂව 2022 වසරේ 532 ක් දක්වා 100% ක ඉහළ යාමක් දැකිය හැකිය. 2021 වසරේ මෙම අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 88% ක් වූ අතර, 2022 වසරේ 81%ක් දක්වා පහත වැටී ඇත.

වගුවට අනුව බහුල ලෙස වාර්තා වන අපරාධයක් වන ගෙවල් බිඳීම සළකා බැලීමේදී 2020 වසරේ වාර්තා වූ අපරාධ 6499 ට සාපේක්ෂව 2021 වසරේ 6840ක් දක්වා 5%ක වැඩි වීමක් දක්නට ලැබේ. 2022 වසරේ වාර්තා වූ ප්‍රමාණය 8645ක් ලෙස දක්වා ඇති අතර, එය පෙර වසරට සාපේක්ෂව 26%ක ඉහළ යාමකි. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 55%ක් වූ අතර, 2022 වසරේ 56% ක් ලෙස දැක්වේ.

බරපතල තුවාල සිදු කිරීම් අපරාධ ගත් විට වගුවට අනුව 2021 වසරේ වාර්තා වූ ප්‍රමාණය 854කි. එය 2020 වසරේ වාර්තා වූ අපරාධ 892ට වඩා සුළු අඩුවීමක් උවද, 2022 වසරේ 923ක් දක්වා 8%ක නැවත ඉහළ යාමක් දක්නට ඇත. 2021 සහ 2022 වසරවල මෙම අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 95% ලෙස නොවෙනස්ව පවතී.

අන්තරාදායක ආයුධ වලින් තුවාල කිරීමේ අපරාධ 1843ක් 2021 වසරේ වාර්තා වූ අතර එය 2022 වසරේ 1888ක් දක්වා 2% කින් ඉහළ ගොස් ඇත. මෙම අපරාධ වල 2021 වසරේ විසඳීමේ ප්‍රතිශතය 94% වූ අතර, 2022 වසරේ 93%ක් ලෙස දැක්වේ.

වගුවට අනුව මනුෂ්‍ය ඝාතන අපරාධ පිළිබඳ විමසීමේ දී අඛණ්ඩ ඉහළ යාමක් වසර තුනෙහිම දක්නට ලැබේ. 2020 වසරේ අපරාධ 464ක් වාර්තා වූ අතර, එය 521ක් දක්වා 2021 වසරේ 12% ක ඉහළ යාමක් හඳුනා ගත හැකිය. 2022 වසරේ මනුෂ්‍ය ඝාතන අපරාධ 559ක් වාර්තා වූ අතර, එය 2021 වසරට සාපේක්ෂව 7%ක වර්ධනයකි. මනුෂ්‍ය ඝාතන අපරාධ වල විසඳීම් ප්‍රතිශතය 2021 වසරේ 95% ක් වූ අතර 2022 වසරේ 91% ක් දක්වා පහත වැටී ඇත.

වගුවට අනුව ස්ත්‍රී දූෂණ අපරාධ සැළකිල්ලට ලක් කිරීමේ දී ත්‍රිවිධ වර්ගීකරණයක් ඉදිරිපත් කර ඇත. එනම් වයස 16ට වැඩි ස්ත්‍රීන් දූෂණය කිරීමේ අපරාධ, වයස 16ට අඩු වින්දිතයින්ගේ කැමැත්ත සහිත ස්ත්‍රී දූෂණ අපරාධ, වයස 16ට අඩු වින්දිතයන්ගේ කැමැත්ත නොමැති ස්ත්‍රී දූෂණ අපරාධ යනුවෙන් වර්ග කර දක්වා ඇත.

ඒ අනුව වයස 16 ට වැඩි ස්ත්‍රීන් දූෂණය කිරීමේ අපරාධ විමසා බැලීමේ දී 2020 වසරේ අපරාධ 300 සිට 2021 වසරේ අපරාධ 256ක් දක්වා 15% ක පහළ යාමක් දක්නට ලැබේ. 2022 වසරේ වාර්තා වූ ප්‍රමාණය 257කි. විසඳීමේ ප්‍රතිශතය ගත් විට 2020 වසරේ විසඳීම් ප්‍රතිශතය 94% ක් වූ අතර 2021 වසරේ විසඳීමේ ප්‍රතිශතය 96% ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙම ප්‍රතිශතය 2022 වසරේ 92%ක් දක්වා යම් පහළ යාමක් පෙන්නුම් කර ඇත.

විනිදිතයාගේ කැමැත්ත සහිතව සිදු කරන ලද වයස අවුරුදු 16 ට අඩු ස්ත්‍රී දූෂණ අපරාධ එනම් ස්ත්‍රී දූෂණ අපරාධ වල වැඩිපුරම වාර්තා වන අපරාධ පිළිබඳ සැළකීමේ දී වගුවෙහි ඇතුළත් වසර තුනෙහිදීම ඉහළ යාමක් දක්නට ලැබේ. 2020 වසරේ අපරාධ 1292 ක් වාර්තා වී ඇති අතර, ඊට සාපේක්ෂව 2021 වසරේ එම අපරාධ ප්‍රමාණය 1377 ක් දක්වා 7% කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේ 1391ක් දක්වා 1% කින් තවදුරටත් ඉහළ ගොස් ඇත. මෙම අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 2020 වසරේ 98% ක් වූ අතර 2021 සහ 2022 වසර වල පිළිවෙලින් 97% සහ 96% ක් ලෙස දැක්වේ.

වයස 16 ට අඩු විනිදිතයාගේ කැමැත්ත නොමැතිව සිදු කරන ලද ස්ත්‍රී දූෂණ අපරාධ වගුවෙහි සඳහන් වසර තුනෙහිම ක්‍රමික පහළ යාමක් හඳුනාගත හැකිය. 2020 වසරේ 361 සිට 2021 වසරේ 344 දක්වා 5%ක අඩු වීමක්ද, 2022 වසරේ 338ක් දක්වා නැවතත් 2%ක අඩු වීමක්ද දැකිය හැකිය. විසඳීමේ ප්‍රතිශතය ක්‍රමිකව ඉහළ ගොස් ඇති අතර, ඒ අනුව වසර තුනෙහි පිළිවෙලින් 92%ක්, 93%ක් සහ 95%ක් ලෙස දක්වා ඇත.

වගුවට අනුව බල අපරාධ වල ඉතා බහුල ලෙස වාර්තා වන අපරාධ වර්ගයක් ලෙස කොල්ලකෑම් හඳුනා ගත හැකිය. දිගින් දිගටම ඉහළ යන අපරාධ වර්ගයක් ලෙස 2020 වසරේ මෙම අපරාධ 2148ක් වාර්තා වූ අතර, 2021 වසරේ 2277ක් දක්වා 6%ක වර්ධනයක් දැකිය හැකිය. ඊට සාපේක්ෂව 2022 වසරේ 3065ක් දක්වා 35%ක සැලකිය යුතු වර්ධනයක් දක්නට ඇත. කොල්ලකෑම් අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 2020 වසරේ 67% ක් සහ 2021 වසරේ 68% ක් ලෙස දැක්වේ. 2022 වසරේ එම ප්‍රතිශතය 64%කි.

බරපතල ලිංගික අපයෝජනය යටතට ගැනෙන අපරාධ 677 ක් 2020 වසරේ වාර්තා වී ඇති අතර ඊට සාපේක්ෂව 2021 වසරේ එම අපරාධ 649 ක් දක්වා 4% කින් පහත වැටී ඇත. 2022 වසරේ 571ක් දක්වා 12% කින් තවදුරටත් පහළ ගොස් ඇති අතර, විසඳීමේ ප්‍රතිශතයද 2021 වසරේ 96% සිට 2022 වසරේ 95% දක්වා පහළ ගොස් ඇත.

වගුවට අනුව රුපියල් ලක්ෂ පහට වැඩි සාපරාධි සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩ කිරීම හා වංචා කිරීම යටතේ ගැනෙන අපරාධ සැළකිය යුතු ප්‍රමාණයක් පොලිසිය වෙත වාර්තා වේ. 2020 වසරේ වාර්තා වූ ප්‍රමාණය 2891 කි. 2021 වසරේ 2207ක් දක්වා 24%කින් පහත වැටී ඇත. 2022 වසරේ 2339ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 6%කින් ඉහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 44% සිට 2022 වසරේ 50% දක්වා වර්ධනය වී ඇත.

රු.50000 ට වැඩි ගව සොරකම සළකා බැලීමේදී යම් උච්ඡාවචනය වීමක් වගුවෙහි ඇතුළත් වසර 3 තුළ දැකිය හැකිය. 2020 වසරේ ගව සොරකම් 524ක් වාර්තා වී ඇති අතර, 2021 වසරේ එම ප්‍රමාණය 365ක් දක්වා 30%කින් පහළ ගොස් ඇත. 2022 වසරේ නැවතත් 726 දක්වා 99% කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 82%ක්ද, 2022 වසරේ 76%ක්ද ලෙස දැක්වේ.

වගුවේ දත්ත වලට අනුව රු. 50000/- ට වැඩි දේපළ සොරකම් අපරාධ 4073 ක් 2020 වසරේ වාර්තා වී ඇති අතර එය 4801 ක් දක්වා 2021 වසරේ 18% කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේද මෙම

දේපළ සොරකම් තවදුරටත් 5404 ක් දක්වා 13% කින් ඉහළ ගොස් ඇත. මෙම අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 2021 සහ 2022 වසර වල 66% ක් ලෙස නොවෙනස්ව පවතී.

ළමයින්ට කaaර ලෙස සැළකීමේ අපරාධ, වගුවට අනුව 2020 වසරේ 76 ක් වාර්තා වී ඇති අතර, 2021 වසරේ එම ප්‍රමාණය 87 ක් දක්වා 14% ක ඉහළ යාමක් පෙන්නුම් කර ඇත. කෙසේ වුවද 2022 වසරේ වාර්තා වී ඇති අපරාධ ප්‍රමාණය 83කි. එනම් පෙර වසරට සාපේක්ෂව 5%ක පහත වැටීමක් දක්නට ලැබේ. විසඳීමේ ප්‍රතිශතය 2020 හා 2021 වසර දෙකෙහිම 97% ක්ද, 2022 වසරේ 99%ක්ද ලෙස දැක්වේ.

වගුවට අනුව කුට්ටනය කිරීම හා තැනැත්තන් වෙළඳාම අපරාධ 32ක් 2021 වසරේ වාර්තා වී ඇති අතර, 2022 වසරේ එම ප්‍රමාණය 10ක් දක්වා 69%ක පහත වැටීමක් හඳුනාගත හැකිය. 2021 වසරේ විසඳීමේ ප්‍රතිශතය 94%ක් ද, 2022 වසරේ 100%ක්ද ලෙස වසර දෙකෙහිම ඉහළ මට්ටමක පවතී.

දිගින් දිගටම ඉහළ යන අපරාධ වර්ගයක් ලෙස සැළකෙන මත්ද්‍රව්‍ය අපරාධ සම්බන්ධයෙන් වගුවට අනුව කරුණු සළකා බැලීමේ දී 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ මත්ද්‍රව්‍ය අපරාධ වල ඉතා සැළකිය යුතු ඉහළ යාමක් හඳුනාගත හැකිය. ඒ අනුව 2020 වසරේ මත්ද්‍රව්‍ය අපරාධ 6811 ක් වාර්තා වී ඇති අතර 2021 වසරේ එය 10959 ක් දක්වා 61% කින් ඉහළ ගොස් ඇත. එසේ වුවද 2022 වසරේ මෙම මත්ද්‍රව්‍ය අපරාධ

වාර්තා වීමේ පහළ යාමක් දක්නට ලැබේ. ඒ අනුව වාර්තා වූ ප්‍රමාණය 8268ක් එනම් 25%ක අඩු වීමකි. වසර තුනෙහිම මත්ද්‍රව්‍ය අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 99% මට්ටම ඉක්මවා ඇත.

වගුවෙහි සඳහන් සමස්ථ බල අපරාධ පිළිබඳ සන්සන්දනාත්මකව විමසා බැලීමේදී 2020 වසරේ වාර්තා වූ අපරාධ 31098ට සාපේක්ෂව 2021 වසරේ 35412ක් දක්වා 14%ක වැඩි වීමක්ද, 2022 වසරේ 37152ක් දක්වා තවදුරටත් 5%ක වර්ධනයක්ද දක්නට ඇත. 2022 වසරේ සමස්ථ බල අපරාධ වල විසඳීම් ප්‍රතිශතය 76%කි.

♦ කාන්තාවන්ට එරෙහි බල අපරාධ.

පහත වගුව මගින් කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තාවීම් පසුගිය වසර තුනකට අදාලව සන්සන්දනාත්මකව විග්‍රහ කොට දක්වා ඇත. ඒ යටතේ 2020 සහ 2021 වසර දෙකට සාපේක්ෂව 2022 වසරේ කාන්තාවන්ට එරෙහි අපරාධ වාර්තා වීමේ සහ එම අපරාධ විසඳීමේ ප්‍රගතිය හඳුනාගත හැකිය.

වගු අංක - 04 **කාන්තාවන්ට එරෙහි බල අපරාධ**

වරද		2020				2021				2022			
		වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
1	මිනීමැරීම	82	25	57	30%	79	24	55	30%	102	98	4	96%
2	සියපණ හානිකර ගැනීමට අනුබල දීම	3	2	1	67%	0	0	0	0%	0	0	0	0%
3	මිනීමැරීමට තැත්කිරීම	10	2	8	20%	12	1	11	8%	11	11	0	100%
4	ස්ත්‍රී දූෂණය	237	98	139	41%	187	82	105	44%	182	177	5	97%
5	ව්‍යභිචාරය	7	0	7	0%	7	1	6	14%	3	3	0	100%
6	බරපතල තුවාල සිදු කිරීම	174	64	110	37%	121	51	70	42%	154	154	0	100%
7	පිහි ආදියෙන් තුවාල සිදුකිරීම	0	0	0	0%	73	18	55	25%	74	74	0	100%
8	අස්වාභාවික වැරදි/ තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා	5	2	3	40%	3	2	1	67%	1	1	0	100%
9	බරපතල ලිංගික අපයෝජනය	15	5	10	33%	24	11	13	46%	21	21	0	100%
10	අපහරණය	1	0	1	0%	3	1	2	33%	1	1	0	100%
11	පැහැරගෙනයාම	38	13	25	34%	49	18	31	37%	43	43	0	100%
12	කාමුක සංසර්ගය සඳහා ස්ත්‍රීන් සැපයීම	6	3	3	50%	1	0	1	0%	1	1	0	100%
13	තැනැත්තන් වෙළඳාම (කුට්ටනය)	0	0	0	0%	3	1	2	33%	2	2	0	100%
14	වෙනත්	17	5		29%	6	3	3	50%	5	5	0	100%
එකතුව		**595**	**219**	**364**	**37%**	**568**	**213**	**355**	**38%**	**600**	**591**	**9**	**99%**

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

(සැ.යු. මෙහි " විසඳූ " යන්න මගින් පොලිසිය විසින් විමර්ශන අවසන් කළ සංඛ්‍යාව, අධිකරණයේ විභාග වන සංඛ්‍යාව සහ අධිකරණය විසින් විභාග කොට අවසන් කළ සංඛ්‍යාව යන සියල්ල අදහස් වේ. 2022 වසරේ ඉහත නිර්ණායක වලට අමතරව පොලීසිය විසින් සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇති නමුත් තවදුරටත් විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාවද විසඳූ යන්නට ඇතුළත් වේ.)

වගුවට අනුව සළකා බැලීමේදි කාන්තාවන්ට එරෙහි මිනී මැරුම් අපරාධ වල වැඩිවීමක් 2021 වසරට සාපේක්ෂව හඳුනාගත හැකිය. ඒ අනුව 2021වසරේ වාර්තා වූ අපරාධ 79ට සාපේක්ෂව 2022 වසරේ මෙම මිනී මැරුම් 102ක් දක්වා 29% කින් ඉහළ ගොස් ඇත. කෙසේ වුවද 2021 වසරේ මෙම අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 30% ක් වැනි පහළ මට්ටමක පැවතියද 2022 වසරේ 96% දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇත.

වගුවේ දත්ත වලට අනුව මිනී මැරීමට තැත් කිරීමේ අපරාධ 12 ක් 2021 වසරේ වාර්තා වී ඇති අතර එම ප්‍රමාණය 11 ක් දක්වා 8% කින් 2022 වසරේ පහළ ගොස් ඇත. 8% ක්ව පැවති 2021 වසරේ විසඳීමේ ප්‍රතිශතය 2022 වසරේ 100% ක් දක්වා ඉහළ ගොස් ඇත.

කාන්තාවන්ට එරෙහි බිහිසුණු අපරාධයක් වන ස්ත්‍රී දූෂණ අපරාධ, වගුවෙහි සඳහන් වසර තුනට අදාළව පහළ යාමක් දැකිය හැකිය. 2020 වසරේ වාර්තා වූ සංඛ්‍යාව 237කි. එම සංඛ්‍යාව 2021 වසරේ 187ක් දක්වා 21%කින් පහළ ගොස් ඇත. 2022 වසරේ වාර්තා වූ ස්ත්‍රී දූෂණ සංඛ්‍යාව 182ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 3% කින් තවදුරටත් පහළ යාමකි. වගුවට අනුව ස්ත්‍රී දූෂණ අපරාධ වල 2021 වසරේ විසඳීමේ ප්‍රතිශතය 44% ක් වූ අතර 2022 වසරේ 97% ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

කාන්තාවන්ට එරෙහි බරපතල තුවාල සිදුකිරීම් 2021 වසරේ 121 ක් සහ 2022 වසරේ 154 ක් වාර්තා වී ඇත. ඒ අනුව 2022 වසරේ මෙම අපරාධ වාර්තා වීම 2021 වසරට සාපේක්ෂව 27%ක වැඩි වීමකි. වගුවට අනුව මෙම අපරාධවල 2021 වසරේ 42% ක් වූ විසඳීමේ ප්‍රතිශතය 2022 වසරේ 100%ක් දක්වා වර්ධනය වී ඇත. බරපතල ලිංගික අපයෝජනය වරද ගත්විට, කාන්තාවන්ට එරෙහි මෙබඳු අපරාධ 24 ක් 2021 වසරේ වාර්තා වී ඇති අතර 2022 වසරේ එය 21 ක් දක්වා 13% කින් පහළ ගොස් ඇත. මෙම අපරාධ වල විසඳීමේ ප්‍රතිශතයද 2021 වසරේ 46% සිට 2022 වසරේ 100%ක් දක්වා ඉහළ යාමක් දැකිය හැකිය.

වගුවට අනුව 2022 වසරේ කාන්තාවන්ට එරෙහි පැහැරගෙන යාම් අපරාධ 43 ක් වාර්තා වී ඇති අතර එය 2021 වසරේ වාර්තා වූ අපරාධ 49 ට සාපේක්ෂව 12% ක පහළ යාමකි. මෙම පැහැරගෙන යෑම් අපරාධවල විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 37% ක් වූ අතර 2022 වසරේ 100% ක් දක්වා ඉහළ ගොස් ඇත. කාන්තාවන්ට එරෙහි බල අපරාධ පිළිබඳ වගුවෙහි දත්ත සළකා බැලීමේදී 2021 වසරේ වාර්තා වූ සමස්ථ අපරාධ 568 ට සාපේක්ෂව 2022 වසරේ සමස්ථ අපරාධ 600 ක් දක්වා 6% ක වැඩි වීමක් දක්නට ලැබේ. එසේ උවද වගුවට අනුව 2021 වසරේ සමස්ථ කාන්තාවන්ට එරෙහි බල අපරාධ විසඳීමේ ප්‍රතිශතය 38%ක් ලෙස දැක්වෙන අතර, 2022 වසරේ එම ප්‍රතිශතය 99% ක් දක්වා විශාල ලෙස වර්ධනය වී ඇති බව දැකිය හැකිය.

♦ ළමයින්ට එරෙහි බලඅපරාධ.

ළමයින්ට එරෙහි බලඅපරාධ කාණ්ඩ 15 ක් යටතේ පහත වගුව මගින් දක්වා ඇත. ඒ යටතේ පසුගිය 2020, 2021 සහ 2022 වසර තුනට අදාලව එම අපරාධ වාර්තාවීම් සහ විසඳීම්වල ප්‍රගතිය සන්සන්දනාත්මකව, වගු අංක 05 මඟින් විග්‍රහ කර ඇත.

වගු අංක - 05 **ළමයින්ට එරෙහි බල අපරාධ**

වරද			2020				2021				2022			
			වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීම් ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීම් ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීම් ප්‍රතිශතය
1	මිනී මැරුම		22	6	16	27%	27	8	19	30%	18	18	0	100%
2	සියපණ හානිකරගැනීමට අනුබල දීම		0	0	0	0%	0	0	0	0%	0	0	0	0%
3	මිනී මැරීමට තැත්කිරීම		9	0	9	0%	9	3	6	33%	13	13	0	100%
4	ස්ත්‍රී දූෂණය	වයස අවු 16 ට අඩු කැමැත්ත ඇතිව	1292	493	799	38%	1376	610	766	44%	1369	1366	3	100%
		වයස අවු 16 ට අඩු කැමැත්ත නොමැතිව	315	74	241	23%	281	122	159	43%	324	322	2	99%
		වයස අවු 16 - 18 අතර	51	13	38	25%	50	24	26	48%	54	54	0	100%
5	ව්‍යභිචාරය		50	22	28	44%	73	34	39	47%	54	54	0	100%
6	බරපතල තුවාල සිදු කිරීම		32	5	27	16%	24	4	20	17%	34	34	0	100%
7	පිහි ආදියෙන් තුවාල සිදු කිරීම		0	0	0	0%	0	0	0	0%	7	7	0	100%
8	අස්වාභාවික වැරදි/පුද්ගලයින් අතර දැඩි අශිෂ්ට ක්‍රියා		10	5	5	50%	6	3	3	50%	3	3	0	100%

වරද		2020				2021				2022			
		වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
9	බරපතල ලිංගික අපයෝජනය	615	267	348	43%	580	252	328	43%	535	535	0	100%
10	අපහරණය (කුට්ටනය)	632	233	399	37%	611	184	427	30%	575	568	7	99%
11	පැහැරගෙනයාම	17	1	16	6%	20	5	15	25%	30	30	0	100%
12	තැනැත්තන් වෙළඳාම (කුට්ටනය)	10		10	0%	24	23	1	96%	5	5	0	100%
13	ළමයින්ට කෲර ලෙස සැළකීම	76	33	43	43%	87	33	54	38%	83	82	1	99%
14	අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම	27	4	23	15%	15	2	13	13%	11	11	0	100%
15	වෙනත්	4	2	2	50%	0	0	0	0%	1	1	0	100%
එකතුව		3162	1158	2004	37%	3183	1307	1876	41%	3116	3103	13	100%

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

(සැ.යු. මෙහි ‘‘විසඳූ’’ යන්න මගින් පොලීසිය විසින් විමර්ශන අවසන් කළ සංඛ්‍යාව, අධිකරණයේ විභාග වන සංඛ්‍යාව සහ අධිකරණය විසින් විභාග කොට අවසන් කළ සංඛ්‍යාව අදහස් වේ. 2022 වසරේ ඉහත නිර්ණායක වලට අමතරව පොලීසිය විසින් සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇති නමුත් තවදුරටත් විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාවද විසඳූ යන්නට ඇතුළත් වේ.)

වගුවෙහි ඇතුළත් දත්ත විමසා බැලීමේදි පෙනී යන්නේ 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ ළමයින්ට එරෙහි මිනී මැරුම් අපරාධවල පහළ යාමක් සිදුව ඇති බවයි. ඒ අනුව 2021 වසරේ වාර්තා වූ මිනී මැරුම් අපරාධ 27 ට සාපේක්ෂව 2022 වසරේ අපරාධ 18 ක් දක්වා 33% කින් පහළ ගොස් ඇත. මෙම ළමයින්ට එරෙහි මිනී මැරුම් අපරාධවල විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 30% ක් වූ අතර 2022 වසරේ 100% ක් දක්වා වර්ධනය වී ඇත.

ළමයින්ට එරෙහි අපරාධ අතර ඉතා බරපතල අපරාධ කාණ්ඩයක් වන ස්ත්‍රී දූෂණ අපරාධ, වයස අවුරුදු 16 ට අඩු විත්දිතයින්ගේ කැමැත්ත සහිත ස්ත්‍රී දූෂණ, වයස 16 ට අඩු විත්දිතයින්ගේ කැමැත්ත රහිත ස්ත්‍රී දූෂණ සහ වයස අවුරුදු 16 -18 ත් අතර ස්ත්‍රී දූෂණ ලෙස කොටස් තුනකට වර්ගකොට වගුව මගින් දක්වා ඇත.

ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ අපරාධ අතරින් වයස 16 ට අඩු විත්දිතයින්ගේ කැමැත්ත සහිත ස්ත්‍රී දූෂණ බහුල ලෙස වාර්තා වී ඇත. 2020 වසරෙහි මෙම අපරාධ 1292 ක් වාර්තා වී ඇති අතර එම සංඛ්‍යාවෙහි 7% ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2021 වසරේ ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ අපරාධ 1376 ක් වාර්තා වී ඇත. 2022 වසරේ අපරාධ 1369 ක් වාර්තා වී ඇති අතර එය 2021 වසරට සාපේක්ෂව 1% ක අවම පහළ යාමකි.

විත්දිතයාගේ කැමැත්ත රහිතව වයස අවුරුදු 16 ට අඩු ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ අපරාධ වල වැඩි වීමක් 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දැකිය හැකිය. ඒ අනුව 2021 වසරේ මෙබඳු අපරාධ 281 ක් වාර්තා වී ඇති අතර 2022 වසරේ එම ප්‍රමාණය 324 ක් දක්වා 15% කින් ඉහළ ගොස් ඇත. මෙම අපරාධවල විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 43% ක් වන අතර, 2022 වසරේ 99% ක වර්ධනයක් වගුවට අනුව දක්වා ඇත.

2022 වසරේ ළමයින්ට එරෙහි බරපතල තුවාල සිදුකිරීමේ අපරාධ ගත් විට 2021 වසරට සාපේක්ෂව ඉහළ යාමක් දක්නට ලැබේ. ඒ අනුව 2021 වසරෙහි අපරාධ 24 ක් වාර්තා වූ අතර 2022 වසරේ එම ප්‍රමාණය 34 ක් දක්වා 42% කින් ඉහළ ගොස් ඇත. මෙම අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 2021 වසරෙහි 17% ක් වූ අතර 2022 වසරේ 100% ක් දක්වා ඉහළ යාමක් දක්නට ලැබේ.

බරපතල ලිංගික අපයෝජනය ගත්විට, ළමයින්ට එරෙහි මෙම අපරාධ වල අඩු වීමක් වගුවෙහි සඳහන් කාල සීමාව තුළ හඳුනා ගත හැකිය. ඒ අනුව 2020 වසරේ අපරාධ 615ක් වාර්තා වූ අතර, 2021 වසරේ 580 ක් දක්වා 6%කින් පහත වැටී ඇත. 2022 වසරේ මෙම අපරාධ 535ක් වාර්තා වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 8%ක අඩු වීමකි. මෙම අපරාධ වල 2022 වසරේ විසඳීමේ ප්‍රතිශතය 100% ක මට්ටමේ පවතී.

ළමයින්ට එරෙහි බරපතල අපරාධ යටතට ගැනෙන අපහරණය නැමැති වැරදි 632ක් 2020 වසරේ වාර්තා වී ඇති අතර 2021 වසරේ වාර්තා වූ ප්‍රමාණය 611කි. එනම් පෙර වසරට සාපේක්ෂව 3% ක අඩු වීමකි. 2022 වසරේ අපරාධ 575ක් වාර්තා වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 6%ක පහළ යාමකි. විසඳීමේ ප්‍රතිශතය 2022 වසරේ 99% ලෙස දැක්වේ.

පැහැරගෙන යාමේ අපරාධ 17ක් 2020 වසරේ වාර්තා වී ඇති අතර, 2021 වසරේ එම අපරාධ 20ක් දක්වා 18%කින් වර්ධනය වී ඇත. එමෙන්ම 2022 වසරේ ළමයින්ට එරෙහි පැහැරගෙන යාමේ අපරාධ 30ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 50%ක වැඩිවීමක් හඳුනාගත හැක. විසඳීමේ ප්‍රතිශතය 2022 වසරේ 100%ක් ලෙස දැක්වේ.

ළමයින්ට එරෙහිව තැනැත්තන් වෙළඳාම නැමැති අපරාධ විමසා බැලීමේ දී 2021 වසරේ අපරාධ 24ක් වාර්තා වූ අතර, 2022 වසරේ වාර්තා වූ ප්‍රමාණය අපරාධ 05කි. එය ප්‍රතිශතයක් ලෙස 76%ක අඩු වීමක් ලෙස දැක්විය හැකිය. විසඳීමේ ප්‍රතිශතය වගුවට අනුව 2022 වසරේ 100%ක මට්ටමක පවතී. වගුවට අනුව ළමයින්ට කෲර ලෙස සැළකීමේ අපරාධ 87ක් 2021 වසරේ වාර්තා වී ඇති අතර, 2022 වසරේ වාර්තා වූ ප්‍රමාණය 83කි. එය 2021 වසරට සාපේක්ෂව 5%ක අඩුවීමකි. විසඳීමේ ප්‍රතිශතය 99%ක් ලෙස දක්වා ඇත.

ළමයින්ට එරෙහි අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ වැරදි වල අඩු වීමක් වගුවට අනුව හඳුනා ගත හැකි අතර 2020 වසරේ වාර්තා වූ අපරාධ 27 ට සාපේක්ෂව 2021 වසරේ මෙම අපරාධ 15 ක් දක්වා 44% ක අඩුවීමක් දක්නට ලැබේ. එමෙන්ම 2022 වසරේ ද අපරාධ 11ක් වාර්තා වී ඇති අතර, එය පෙර වසරට සාපේක්ෂව 27% ක පහත වැටීමක් ලෙස දැක්විය හැකිය.ළමයින්ට එරෙහි අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ අපරාධ වල විසඳිමේ ප්‍රතිශතය 2022 වසරේ 100% ලෙස දක්වා ඇත.

ළමයින්ට එරෙහි සමස්ථ බල අපරාධ වාර්තාවීම් සළකා බැලූ විට, සුළු උච්ඡාවචනයක් වගුවෙහි සඳහන් වසර තුනක කාලයට අදාළව හඳුනාගත හැකිය. 2020 වසරේ වාර්තා වූ සමස්ථ අපරාධ සංඛ්‍යාව 3162 ක් වන විට 2021 වසරේ එම ප්‍රමාණය 3183 ක් දක්වා 1% කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේ වාර්තා වූ ළමයින්ට එරෙහි බල අපරාධ සංඛ්‍යාව 3116 ක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස 2%ක පහළ යාමකි. සමස්ථ අපරාධ විසඳීමේ ප්‍රතිශතය වගුවෙහි සඳහන් පරිදි 100%කි.

2.1.2 සුළු අපරාධ.

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තාවන අපරාධ අතරින් බරපතල නොවන අපරාධ සුළු අපරාධ ලෙස සඳහන් කර ඇත. ඇතැම් තැනෙක සුළු වැරදි ලෙසද සඳහන් වන මෙම අපරාධ පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ සහ දේපළ වලට එරෙහි සුළු අපරාධ ලෙස කොටස් දෙකකට වර්ග කොට දක්වා ඇත. පහත වගුව මගින් සුළු අපරාධ කාණ්ඩ කිහිපයක් යටතේ විග්‍රහ කොට ඇත.

♦ පුද්ගලයන්ට එරෙහි සුළු අපරාධ

පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ කාණ්ඩ 14 ක් යටතේ පහත වගුව මගින් දක්වා ඇති අතර එම අපරාධ වල ඉතා ඉහළ අගයකින් වාර්තා වන සුළු පහරදීම් සළකා බැලීමේදී වගුවෙහි සඳහන් දත්ත වලට අනුව 2021 වසරේ සුළු පහරදීම් 19186ක් වාර්තා වී ඇත. ඊට සාපේක්ෂව 2022 වසරේ සුළු පහරදීම් 22164ක් දක්වා 15% කින් ඉහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 56% සිට 2022 වසරේ 60% දක්වා ඉහළ ගොස් ඇත.

වගු අංක - **06** **පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ**

වරද		2020				2021				2022			
		වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
1	සුළු පහරදීම්	20641	11595	9046	56%	19186	11074	8112	58%	22164	13361	8803	60%
2	නීති විරෝධී ගබ්සා කිරීම්	34	15	19	44%	48	30	18	63%	65	30	35	46%
3	සාපරාධී අයුතු ඇතුළුවීම/ නිවසකට අයුතු ඇතුළුවීම	1702	890	812	52%	1820	964	856	53%	1740	991	749	57%
4	ලිංගික අපයෝජනය	3397	1838	1559	54%	3249	1731	1518	53%	2986	1746	1240	58%
5	අයුතු අවහිරය/ අයුතු සිරකරතැබීම්	142	99	43	70%	191	131	60	69%	217	115	102	53%

	වරද	2020				2021				2022			
		වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තාවූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
6	නීති විරෝධී කාර්යයක් සඳහා යම් ගොඩනැගිල්ලක් ආදියක සිට අසුවීම	4	0	4	0%	15	10	5	67%	56	18	38	32%
7	ප්‍රසිද්ධ සොරකු ගැවසීම	60	20	40	33%	64	18	46	28%	19	17	2	89%
8	ප්‍රසිද්ධ ස්ථානයක කළහ කිරීම	204	166	38	81%	168	124	44	74%	281	219	62	78%
9	සාපරාධී බලහත්කාරය පෑම, සාපරාධී බියගැන්වීම, ඕනෑකමින් කරනු ලබන නින්දාව	1987	1041	946	52%	2095	1050	1045	50%	2583	1649	934	64%
10	පොලිස් නිලධාරියෙකුගේ නීත්‍යානුකූල නියෝගයට අකීකරුවීමක් වශයෙන් පැමිණ නොසිටීම	239	144	95	60%	221	124	97	56%	252	200	52	79%
11	කවර අන්දමක හෝ තුවාල සිදු කිරීමට තැත්කිරීම	700	526	174	75%	610	460	150	75%	727	557	170	77%
12	ඇඟ බැඳීමට ඉල්ලුම් කිරීම	1819	1700	119	93%	2066	1822	244	88%	1368	1183	185	86%
13	අධිකරණයේ බොරු සාක්ෂි දීම හෝ සෑදීම	421	254	167	60%	691	143	548	21%	97	67	30	69%
14	ල.ද.නි.ස. යටතේ කරන වෙනත් සුළු වැරදි	30782	22848	7934	74%	44497	30910	13587	69%	10669	6014	4655	56%
එකතුව		62132	41136	20996	66%	74921	48591	26330	65%	43224	26167	17057	61%

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

(සැ.යු. මෙහි ‘‘විසඳූ’’ යන්නට නඩු පැවරූ සංඛ්‍යාව එනම් අධිකරණයේ විභාග අවසන් නොවූ සංඛ්‍යාව, වෙනත් ආකාරයෙන් අවසන් වූ සංඛ්‍යාව, වැරදිකරුවන් වූ සංඛ්‍යාව, නිදහස්/නිදොස් වූ සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)

නීති විරෝධී ගබිසා කිරීම් වල ක්‍රමික ඉහළ යාමක් වගුවෙහි සඳහන් වසර තුනට අදාළව දක්නට ඇත. 2020 වසරේ වාර්තා වූ මෙම වැරදි ප්‍රමාණය 34 ක් වූ අතර 2021 වසරේ 48 ක් දක්වා 41%කින් ද 2022 වසරේ 65ක් දක්වා 35%කින් ද ක්‍රමිකව ඉහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 63% සිට 2022 වසරේ 46% දක්වා පහළ ගොස් ඇත.

සාපරාධී අයුතු ඇතුළු වීමේ වැරදි 1820ක් 2021 වසරේ වාර්තා වී ඇති අතර, 2022 වසරේ මෙම වැරදි 1740ක් දක්වා 4% කින් පහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 53% ක් වූ අතර, 2022 වසරේ 57%ක් දක්වා ඉහළ ගොස් ඇත.

පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ වල බහුල ලෙස වාර්තා වන වරදක් ලෙස ලිංගික අපයෝජනය දැක්විය හැකිය. වගුවෙහි සඳහන් දත්ත වලට අනුව 2021 වසරේ මෙම වැරදි 3249 ක් වාර්තා වූ අතර, 2022 වසරේ මෙම වැරදි 2986ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 8% කින් අඩුවී ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 සහ 2022 වසර වල පිළිවෙලින් 53% ක් සහ 58% ක් ලෙස දැක්වේ.

සාපරාධී බලහත්කාරය පෑම / බිය ගැන්වීම යන කාණ්ඩයට අයත් සුළු අපරාධ 2095ක් 2021 වසරේ වාර්තා වූ අතර 2022 වසරේ 2583ක් දක්වා 23%කින් ඉහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 56% සිට 2022 වසරේ 79% ක් දක්වා සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

වගුවට අනුව ඇඟ බැඳීමට කරන ලද ඉල්ලීම් 2021 වසරේ 2066 ක් වාර්තා වී ඇති අතර 2022 වසරේ එම ප්‍රමාණය 1368ක් දක්වා 34%කින් පහළ ගොස් ඇත.

අධිකරණයේ බොරු සාක්ෂි දීමේ වැරදි 691ක් 2021 වසරේ වාර්තා වී ඇති අතර, 2022 වසරේ මෙම වැරදි 97ක් දක්වා 86% කින් කැපී පෙනෙන ලෙස පහළ ගොස් ඇත. 2021 වසරේ මෙම බොරු සාක්ෂි දීමේ වැරදි වල විසඳීමේ ප්‍රතිශතය 21%ක් වූ අතර 2022 වසරේ එම ප්‍රමාණය 69%ක් දක්වා ඉහළ ගොස් ඇත.

වගුවෙහි සඳහන් වෙනත් කාණ්ඩයට අයත් සුළු අපරාධ වලද කැපී පෙනෙන පහළ යාමක් 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දක්නට ඇත. එනම් 2021 වසරේ වැරදි 44497 සිට 2022 වසරේ 10669 දක්වා 76% ක් ලෙස මෙම අඩු වීම හඳුනාගත හැකිය.

සමස්ථයක් ලෙස පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ වාර්තා වීම් ගත් විට 2021 වසරේ වාර්තා වූ සමස්ථ පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ 74921ට සාපේක්ෂව 2022 වසරේ 43224ක් දක්වා 42%කින් පහළ ගොස් ඇත. මෙම සමස්ථ පුද්ගලයන්ට එරෙහි සුළු අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 65%ක් සහ 2022 වසරේ 61%ක් ලෙස දැක්විය හැකිය.

♦ කාන්තාවන්ට සහ ළමයින්ට එරෙහි සුළු අපරාධ

ශ්‍රී ලංකා පොලිසිය වෙත වාර්තා වන පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ කාන්තාවන්ට එරෙහි සුළු අපරාධ සහ ළමයින්ට එරෙහි සුළු අපරාධ ලෙස තවදුරටත් බෙදා දක්වනු ලැබේ. එහිදී කාන්තාවන්ට එරෙහි සුළු අපරාධ කාණ්ඩ 15ක් යටතේද, ළමයින්ට එරෙහි සුළු අපරාධ කාණ්ඩ 14ක් යටතේද පහත වගු මගින් දක්වා ඇත.

වගු අංක - 07

කාන්තාවන්ට එරෙහි සුළු අපරාධ

අනු අංකය	වරදේ ස්වභාවය	2020				2021				2022			
		වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
1	ලිංගික අතවර කිරීම	2495	2425	70	97%	2323	2254	69	97%	2024	1930	94	95%
2	ඇතැම් වැරදි වලට අදාල කරුණු පල කිරීම් **1995** අංක **22** දරන ල.ද.නි.ස. සංශෝධන පනත **365** ඇ**(1)(2)(අ)(ඇ)(ඈ)**	5	5	0	100%	0	0	0	0%	1	1	0	100%
3	නොසැලකිලිමත් අන්දමින් මරණය සිදු කිරීම	0	0	0	0%	2	2	0	100%	2	2	0	100%
4	නීත්‍යානුකූල විවහා වූ බවට විශ්වාසය වංචනිකව ඇති කරවමින් සංවාසයේ යෙදීම	1	1	0	100%	0	0	0	0%	0	0	0	0%
5	බහු විවාහ සිදු කිරීම	4	4	0	100%	6	6	0	100%	12	12	0	100%
6	සුළු තුවාල සිදු කිරීම	3541	3531	10	100%	3178	3172	6	100%	3144	3134	10	100%
7	අයුතු අවහිර/අයුතු සිරකර තැබීම	14	14	0	100%	14	13	1	93%	4	4	0	100%
8	අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධී බලහත්කාරකම් පෑම	16	16	0	100%	23	23	0	100%	25	19	6	76%
9	සාපරාධී බිය ගැන්වීම	207	201	6	97%	188	182	6	97%	157	155	2	99%
10	ප්‍රෙකෝප කිරීමේ අයුරින් ඕනෑකමින් කරනු ලබන නින්දාව	1	1	0	100%	0	0	0	0%	1	1	0	100%
11	කලහා කිරීම	0	0	0	0%	1	1	0	100%	1	1	0	100%
12	ලිංගික අතවර කිරීමට තැත් කිරීම	31	31	0	100%	45	45	0	100%	16	16	0	100%
13	ගෘහස්ථ ප්‍රචන්ඩත්ව පනත යටතේ වැරදි	575	575	0	100%	534	534	0	100%	820	820	0	100%
14	වෙනත්	120	119	1	99%	158	156	2	99%	119	118	1	99%
	මුළු එකතුව	7010	6923	87	99%	6472	6388	84	99%	6326	6213	113	98%

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

වගුවට අනුව කාන්තාවන්ට එරෙහි සුළු අපරාධ වල බහුල ලෙස වාර්තා වන වරදක් ලෙස ලිංගික අතවර කිරීම දැක්විය හැකිය. වගුවෙහි සඳහන් වසර තුනට අදාළව සළකා බැලීමේදී මෙම අපරාධ අඩුවීමක් හඳුනාගත හැකිය. 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ අපරාධ 2495 සිට 2323 ක් දක්වා 7% ක අඩුවීමක් දැකිය හැකි අතර, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ ලිංගික අතවර කිරීමේ සුළු අපරාධ 2024 ක් දක්වා 13% කින් පහළ ගොස් ඇත.

කාන්තාවන්ට එරෙහි සුලු අපරාධ වල බහුලවම වාර්තා වන අපරාධ ලෙස සුළු තුවාල සිදු කිරීම දැක්විය හැකිය. මෙම අපරාධ වලද යම් අඩුවීමක් වගුවට අනුව හඳුනාගත හැකිය. ඒ අනුව 2020 වසරේ අපරාධ 3541ක් වාර්තා වූ අතර, 2021 වසරේ 3178ක් දක්වා 10% ක පහත වැටීමක්ද 2022 වසරේ 3144ක් දක්වා 1% ක තවදුරටත් අඩුවීමක්ද වගුවට අනුව දැකිය හැකිය.

වගුවට අනුව සාපරාධී බියගැන්වීමේ සුළු අපරාධ වලද අඩුවීමක් දක්නට ලැබේ. 2020 වසරේ වාර්තා වූ සංඛ්‍යාව 207 ක් වූ අතර, 2021 වසරේ 188 ක් දක්වා 9% ක අඩුවීමක් හඳුනාගත හැකිය. එමෙන්ම 2022 වසරේ 157ක් දක්වා තවදුරටත් 16%ක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

ලිංගික අතවර කිරීමට තැත්කිරීමේ සුළු අපරාධ 2021 වසරේ 45 ක් වාර්තා වූ අතර, 2022 වසරේ අපරාධ 16 ක් දක්වා 64% කින් අඩුවී ඇත.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට අදාළ සුළු අපරාධ 575ක් 2020 වසරේ වාර්තා වී ඇති අතර, එම ප්‍රමාණය 534 ක් දක්වා 7% කින් 2021 වසරේ පහළ ගොස් ඇත. කෙසේ වුවද මෙම සුළු අපරාධවල සැළකිය යුතු වැඩිවීමක් 2022 වසරේ දක්නට ඇති අතර, වාර්තා වූ සිද්ධි ප්‍රමාණය 820 කි. එනම් 2021 වසරට සාපේක්ෂව 54% ක ඉහළ යාමකි.

වගු අංක - 08

ළමයින්ට එරෙහි සුළු අපරාධ

අනු අංකය	වරදේ ස්වභාවය offens	2020				2021				2022			
		වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
1	ලිංගික අතවර කිරීම	1349	1347	2	100%	1341	1338	3	100%	1252	1233	19	98%
2	ඇතැම් වැරදි වලට අදාල කරුණු පල කිරීම 1995 අංක 22 දරන(ල.ද.නි.ස. සංශෝධන පනත 365 ඇ (1)(2)(අ)(ඇ)(ඇ))	1	1	0	100%	1	1	0	100%	12	12	0	100%
3	ළමයින්ට අදාලව කරනු ලබන අසභ්‍ය පළ කිරීම් හා ප්‍රදර්ශණය	15	15	0	100%	10	10	0	100%	9	8	1	89%
4	වයස අවුරුදු 18 ට අඩු ළමයින් සිගමන් යෙදවීමට සැලැස්වීම	4	4	0	100%	6	6	0	100%	9	9	0	100%
5	සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හා යෙදවීම	1	1	0	100%	0	0	0	0%	0	0	0	0%
6	පහරදී තුවාල සිදු කිරීම	531	531	0	100%	422	422	0	100%	566	564	2	100%
7	ගෘහස්ථ ප්‍රචන්ඩත්ව පනත යටතේ අධිකරණයට ඉදිරිපත් කිරීම	0	0	0	0%	6	6	0	100%	3	3	0	100%
8	ලිංගික අතවර කිරීමට තැත් කිරීම	9	9	0	100%	8	8	0	100%	6	6	0	100%
9	ළමුන් මෙහෙකාර සේවයේ යෙදවීම	1	1	0	100%	2	2	0	100%	3	3	0	100%
10	ළමයින් නීති විරෝධී හදා වඩා ගැනීම්	0	0	0	0%	0	0	0	0%	2	2	0	100%
11	ළමුන් අධ්‍යාපන ලබා ගැනීමෙන් වලක්වාලීම	2	2	0	100%	0	0	0	0%	0	0	0	0%
12	ළමුන් සාපරාධී බියගැන්වීම් හා බැන තර්ජනය කිරීම	22	22	0	100%	21	20	1	95%	20	20	0	100%
13	ආරක්ෂාව හා භාරය සඳහා ළමුන් ගැනීම	180	180	0	100%	279	279	0	100%	283	283	0	100%
14	වෙනත්	92	92	0	100%	91	91	0	100%	134	131	3	98%
	එකතුව	2207	2205	2	100%	2187	2183	4	100%	2299	2274	25	99%

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

වගුවෙහි සඳහන් ළමයින්ට එරෙහි සුළු අපරාධ වල විශේෂ අවධානයට ලක් කළ යුතු අපරාධ පිළිබඳ සළකා බැලීමේදි බහුල ලෙසම වාර්තා වන අපරාධය ලෙස ලිංගික අතවර කිරීම දැක්විය හැකිය. එහිදි වගුවෙහි සඳහන් වසර තුනෙහි මෙම අපරාධ වල යම් අඩුවීමක් දක්නට ලැබේ. 2020 වසරෙහි එම අපරාධ 1349 ක් වාර්තා වී ඇති අතර, 2021 වසරෙහි 1341 ක් දක්වා 1% කින්ද 2022 වසරෙහි 1252ක් දක්වා 7% කින්ද පහත වැටී ඇත.

වයස 18 ට අඩු ළමයින් සිඟමනෙහි යෙදවීම ගත් විට එම වැරදි වාර්තා වීම් සුළු ප්‍රමාණයක් වගුවට අනුව දැකිය හැකි උවද, වසර තුනෙහි සුළු ඉහළ යාමක් දක්නට ලැබේ. ඒ අනුව 2020 වසරේ වාර්තා වී ඇති සිදුවීම් 4 ට සාපේක්ෂව 2021 වසරෙහි 6 ක් දක්වා 50% කින්ද 2022 වසරේ සිදුවීම් 9 ක් දක්වා නැවතත් 50% කින්ද ඉහළ යාමක් හඳුනාගත හැකිය.

සැළකිය යුතු මට්ටමින් වාර්තා වන ළමයින්ට එරෙහි සුළු අපරාධයක් වන පහරදී තුවාල සිදු කිරීම් විමසා බැලීමේදි 2020 වසරට සාපේක්ෂව 2021 වසරෙහි 531 සිට 422 දක්වා 21%ක අඩුවීමක් දැකිය හැකි වුවද, 2022 වසරේ 566ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 34%ක ඉහළ යාමක් දැකිය හැකිය.

ළමුන් සාපරාධී බියගැන්වීමේ සුළු අපරාධ වාර්තාවීම් විමසා බැලීමේදී වගුවට අනුව 2020 වසරට සාපේක්ෂව 2021 සහ 2022 වසර වල පිළිවෙලින් 21 ක් සහ 20 ක් ලෙස ක්‍රමික මෙන්ම සුළු පහළ යාමක් දක්නට ලැබේ.

ආරක්ෂාව හා භාරය සඳහා ළමුන් ගැනීමේ සිද්ධි වල යම් ඉහළ යාමක් දක්නට ලැබෙන අතර, 2020 වසරේ වාර්තා වූ සිදුවීම් 180 ට සාපේක්ෂව 2021 වසරේ සිදුවීම් 279ක් දක්වා 55% ක ඉහළ යාමක් දැකිය හැකිය. කෙසේ වුවද 2022 වසරේ ඉහළ යාම 283ක් දක්වා 1% ක මට්ටමේ පවතී.

සමස්ථයක් ලෙස ළමයින්ට එරෙහි සුළු අපරාධ වාර්තා වීම් 2187 ක් 2021 වසරේ වාර්තා වූ අතර, 2022 වසරේ 2299 ක් දක්වා 5% ක වැඩි වීමක් දැකිය හැකිය. ළමයින්ට එරෙහි සුළු අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය සමස්ථයක් ලෙස 95% - 100% ක් අතර පවතින බව වගුවට අනුව දක්නට ලැබේ.

♦ ළමා හා කාන්තා හිංසනය සහ අපරාධ නිවාරණ වැඩසටහන්

ළමා හා කාන්තා හිංසනය සහ ළමයින්ට හා කාන්තාවන්ට එරෙහි අපරාධ අවම කිරීම සඳහා සමාජයේ සෑම පාර්ශවයක්ම දැනුවත් කිරීම අවශ්‍ය වේ. එහිදී ළමයින් සහ වැඩිහිටියන් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශ සහ එහි ප්‍රාදේශීය අංශ මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් 2022 වසරේ පහත පරිදි ක්‍රියාත්මක කර ඇත.

වගු අංක - 09 **නිවාරණ වැඩසටහන්**

අංශය	ළමුන් දැනුවත් කිරීම	වැඩිහිටියන් දැනුවත් කිරීම	පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම	රජයේ නිලධාරීන් දැනුවත් කිරීම	වෙනත් දේශන
ළමා හා කාන්තා කාර්යාංශය මගින්	90	23	15	7	12
කොට්ඨාස හා පොලිස් ස්ථාන කාර්යාංශ මගින්	13871	12173	-	-	-

මූලාශ්‍රය - ළමා හා කාන්තා කාර්යාංශය

♦ දේපළ වලට එරෙහි සුළු අපරාධ

දේපළ සම්බන්ධ සුළු අපරාධ කාණ්ඩ 11 ක් යටතේ පහත වගුව මගින් දක්වා ඇත. පොලීසිය වෙත වාර්තා වන දේපළ සම්බන්ධ සුළු අපරාධ වල විසඳීමේ ප්‍රතිශතය ගත් විට බල අපරාධ, විවිධ පැමිණිලි ආදී ක්ෂේත්‍ර වල විසඳීමේ ප්‍රතිශතයට සාපේක්ෂව තරමක් පහළ අගයක් ගන්නා බව වගුව අනුව පෙනී යයි.

වගු අංක - 10 **දේපළ වලට එරෙහි සුළු අපරාධ**

	වරද	2020				2021				2022			
		වාර්තා ඇති	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා ඇති	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා ඇති	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
1	ගෙවල් බිඳීමේ උපකරණ නීති විරෝධී ලෙස තම ස්වාමීත්වයේ තබා ගැනීම	59	31	28	53%	62	23	39	37%	157	95	62	61%
2	ආගම් වලට / පූජනීය ස්ථාන/ පූජා භාණ්ඩ වලට සිදුකරන හානි පිළිබඳ වැරදි	44	29	15	66%	37	18	19	49%	38	26	12	68%
3	කිරුම් හා මිණුම් පිළිබඳ වැරදි	22	15	7	68%	16	10	6	63%	16	14	2	88%
4	වික්‍රිණීමට හෝ මහජන ප්‍රදර්ශනය සඳහා අසභ්‍ය පොත් ආදිය ළඟ තබා ගැනීම, අසභ්‍ය සඟරා, ඡායාරූප, පොත්පත් වික්‍රිණීම ආදිය	10	7	3	70%	14	6	8	43%	26	9	17	35%
5	සොරකම් කිරීමට හෝ මංකොල්ල කෑමට තැත් කිරීම	969	469	500	48%	1088	461	627	42%	2383	1178	1205	49%
6	අනර්ඨය රුපියල් 50000 ට අඩු	2694	1166	1528	43%	2811	1273	1538	45%	3501	1806	1695	52%
7	සොරකම රුපියල් 50000 ට අඩු	15806	5000	10806	32%	17814	5955	11859	33%	38107	12786	25321	34%
8	සාපරාධී විශ්වාසය කඩ කිරීම / වංචාව/ සාවද්‍ය පරිහරණය රුපියල් 500000 ට අඩු	5899	1967	3932	33%	5316	1815	3501	34%	7596	3029	4567	40%
9	මහජන පීඩා සම්බන්ධයෙන් පැමිණිලි කිරීම	268	155	113	58%	225	178	47	79%	130	67	63	52%
10	අංක 44 දරන ප්‍රාථමික අධිකරණ පනතේ වගන්ති 66 යටතේ කරන ලද ඉල්ලීම	5406	3470	1936	64%	565	229	336	41%	891	630	261	71%
11	වෙනත්	1614	670	944	42%	5872	4176	1696	71%	4351	2294	2057	53%
	එකතුව	32791	12979	19812	40%	33820	14144	19676	42%	57196	21934	35262	38%

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

(**සැ.යු.** මෙහි "විසඳූ" යන්නට නඩු පැවරූ සංඛ්‍යාව එනම් අධිකරණයේ විභාග අවසන් නොවූ සංඛ්‍යාව, වෙනත් ආකාරයෙන් අවසන් වූ සංඛ්‍යාව, වැරදිකරුවන් වූ සංඛ්‍යාව, නිදහස්/නිදොස් වූ සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)

වගුවෙහි සඳහන් දේපළ සම්බන්ධ සුළු අපරාධ සළකා බැලීමේ දී ගෙවල් බිඳීමේ උපකරණ නීති විරෝධී ලෙස තම ස්වාමීත්වයේ තබා ගැනීමේ වැරදි 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ වැරදි 62 සිට 157 ක් දක්වා 153% ක ඉහළ යාමක් දක්නට ලැබේ. ආගමික / පූජනීය ස්ථාන වලට හානි කිරීමේ වැරදි වල 3% ක් වැනි සුළු ඉහළ යාමක් දක්නට ලැබෙන අතර, අසභ්‍ය පොත් ලඟ තබා ගැනීමේ වැරදි වල 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ ඉහළ යාම වැරදි 14 සිට 26 ක් දක්වා 86% ක ප්‍රතිශතයකි.

වගු අංක 10ට අනුව සොරකම් කිරීමට හෝ මංකොල්ල කෑමට තැත් කිරීමේ වැරදි 1088 ක් 2021 වසරේ වාර්තා වී ඇති අතර 2022 වසරේ එම වැරදි 2383 ක් දක්වා 119% කින් ඉහළ ගොස් ඇත. මෙම වරදෙහි විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 42% ක් සහ 2022 වසරේ 49% ක් ලෙස දැක්වේ.

රු 50000/= ට අඩු අනර්ථය නැමැති වැරදි 2811 ක් 2021 වසරේ වාර්තා වී ඇති අතර 2022 වසරේ 3501 ක් දක්වා 25% කින් ඉහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය ඉහත වගුවට අනුව 2021 වසරේ 45% ක් සහ 2022 වසරේ 52% ක් ලෙස දක්නට ලැබේ.

රු 50000/= ට අඩු සොරකම් වාර්තා වීම වගුවට අනුව 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ විශාල ලෙස ඉහළ යාමක් හඳුනාගත හැකිය. 2020 වසරේ වාර්තා වූ වැරදි සංඛ්‍යාව 15806 ක් විය. එය 2021 වසරේ 17814 ක් දක්වා 13% කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේ වාර්තා වූ වැරදි සංඛ්‍යාව 38107 ක් ලෙස දැක්වෙන අතර එය පෙර වසරට සාපේක්ෂව 114% ක ඉහළ යාමකි. විසඳීමේ ප්‍රතිශතය 2021 සහ 2022 වසර වල පිළිවෙලින් 33% සහ 34% මට්ටම් වල පවතී.

රු 500000/= ට අඩු සාපරාධී විශ්වාසය කඩ කිරීම සම්බන්ධ වැරදි සළකා බැලීමේදී 2021 වසරෙහි වාර්තා වූ වැරදි 5316 ට සාපේක්ෂව 2022 වසරේ වැරදි 7596 ක් දක්වා 43% කින් ඉහළ ගොස් ඇත. මෙම වැරදි වල විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 34%ක් සහ 2022 වසරේ 40%ක් ලෙස අඩු මට්ටමක පවතී. මහජන පීඩා සම්බන්ධ පැමිණිළි වල සැළකිය යුතු අඩුවීමක් වගුවට අනුව දක්නට ඇත. 2021 වසරේ මෙම පැමිණිළි 225ක් වාර්තා වූ අතර, 2022 වසරේ පැමිණිළි 130ක් දක්වා 42%කින් පහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතයද 2021 වසරේ 79% සිට 2022 වසරේ 52% දක්වා පහත වැටී ඇත.

සමස්ථයක් ලෙස දේපළ සම්බන්ධ සුළු අපරාධ වල පැහැදිලි ඉහළ යාමක් 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දක්නට ඇත. ඒ අනුව 2021 වසරේ දේපළ සම්බන්ධ සුළු වැරදි 33820ක් වාර්තා වී ඇති අතර, 2022 වසරේ මෙම වැරදි 57196ක් දක්වා 69%කින් විශාල ලෙස ඉහළ ගොස් ඇත. වගුවෙහි දත්ත පරීක්ෂා කිරීමේදී පැහැදිලි වන්නේ 2022 වසරේ රු.50000/=ට අඩු සොරකම් විශාල ලෙස ඉහළ යාම කැපී පෙනෙන ලෙස දේපළ සම්බන්ධ සුළු වැරදි වල මෙම ඉහළ යාම සඳහා හේතු වී ඇති බවයි.

2.1.3 මත්ද්‍රව්‍ය අපරාධ.

වගුවට අනුව කාණ්ඩ 07 ක් යටතේ වර්ගීකරණය කරන ලද නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ ශ්‍රී ලංකා පොලිසිය වෙත වාර්තා වන අතර පහත වගුව මගින් 2020-2022 කාල සීමාවට අයත් නිද්‍රාජනක නැතහොත් මත්ද්‍රව්‍ය අපරාධ පිළිබඳ තොරතුරු දක්වා ඇත. වගුවෙහි සඳහන් වසර තුනට අදාලව නිද්‍රාජනක අපරාධ පිළිබඳව විග්‍රහාත්මකව තොරතුරු පහතින් ඇතුළත් කර ඇත.

වගු අංක - 11

නිද්‍රාජනක ද්‍රව්‍ය

අ.අ	නිදූ ජනක වර්ගය	2020							2021							2022						
		වාර්තා වූ	නඩු පවරන ලද	වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව	නඩු පැවරීමේ ප්‍රතිශතය	අත්අඩංගුවට ගත් ප්‍රමාණය(කි.ග්‍රෑම්/ග්‍රෑම්/මි.ග්‍රෑම්)			වාර්තා වූ	නඩු පවරන ලද	වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව	නඩු පැවරීමේ ප්‍රතිශතය	අත්අඩංගුවට ගත් ප්‍රමාණය(කි.ග්‍රෑම්/ග්‍රෑම්/මි.ග්‍රෑම්)			වාර්තා වූ	නඩු පවරන ලද	වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව	නඩු පැවරීමේ ප්‍රතිශතය	අත්අඩංගුවට ගත් ප්‍රමාණය(කි.ග්‍රෑම්/ග්‍රෑම්/මි.ග්‍රෑම්)		
						කි.ග්‍රෑම්	ග්‍රෑම්	මි.ග්‍රෑම්					කි.ග්‍රෑම්	ග්‍රෑම්	මි.ග්‍රෑම්					කි.ග්‍රෑම්	ග්‍රෑම්	මි.ග්‍රෑම්
1	ගංජා	56486	54484	48847	96%	6791	694	308	46866	42651	37178	91%	9929	71	394	52634	50921	46247	97%	835	119	112
2	අබිං	138	133	134	96%	0	975	245	430	425	152	99%	0	642	824	6	4	4	67%	0	12	150
3	හෂිස්	55	51	42	93%	0	193	149	294	293	207	100%	101	769	288	483	480	416	99%	51	0	16
4	හෙරොයින්	66331	61473	43124	93%	574	445	15	47896	42922	32913	90%	2637	940	818	70599	62941	54236	89%	1445	970	68
5	මෝෆින්	5	5	5	100%	0	1	95	361	361	360	100%	0	90	159	18	17	10	94%	0	2	683
6	කොකේන්	49	46	31	94%	1	250	691	47	39	27	83%	15	260	80	31	31	29	100%	369	898	475
7	වෙනත්	11118	6475	9430	58%	1046	419	774	4077	3928	3605	96%	392	252	604	9053	8741	7612	97%	97	694	20
එකතුව		134182	122667	101613	91%	8414	2979	277	99971	90619	74442	91%	13077	27	167	132824	123135	108554	93%	2799	696	524

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

(සැ.යු. මෙහි " නඩු පැවරූ සංඛ්‍යාව " යන්නට වරදකරු වීමෙන් අවසන්වූ සංඛ්‍යාව, චූදිත නිදොස් හෝ නිදහස් හෝ අන්‍යාකාරයෙන් අවසන් වූ සංඛ්‍යාව සහ අධිකරණයේ විභාග වන සහ රස පරීක්ෂක වාර්තා නොලැබුණු සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)

ගංජා සම්බන්ධ 2021 වසරේ වාර්තා වූ වැරදි සංඛ්‍යාව 46866ක් වූ අතර, එය 2020 වසරේ වාර්තා වූ සංඛ්‍යාවට වඩා 17% ක අඩු වීමක් වේ. 2022 වසරේ 52634 ක් වාර්තා වූ අතර, එය 2021 වසරට සාපේක්ෂව 12% ක ඉහළ යාමක් ලෙස දැක්විය හැකිය. වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව 2021 වසරේ 37178 ක් වූ අතර, 2022 වසරේ 46325 ක් දක්වා 24% කින් වර්ධනය වී ඇත. අත්අඩංගුවට ගත් ප්‍රමාණයන් (කි.ග්‍රෑ) සළකා බැලීමේදී 2021 වසරේ ගංජා කි.ග්‍රෑ. 9929 ක් අත්අඩංගුවට ගෙන ඇති අතර, 2022 වසරේ එම ප්‍රමාණය කි.ග්‍රෑ. 835 ක් දක්වා 92% කින් පහළ ගොස් ඇත.

අබිං සම්බන්ධ වාර්තා වීම් වගුවට අනුව සළකා බැලීමේදී 2020 වසරේ 138 ක් වාර්තා වී ඇති අතර, 2021 වසරේ 430 ක් දක්වා විශාල ලෙස ඉහළ ගොස් ඇත. ඊට සාපේක්ෂව 2022 වසරේ මෙම වැරදි වාර්තා වීම් 6 ක් දක්වා විශාල අඩුවීමක් දක්නට ලැබේ. වාර්තා වීම් අඩුවී ඇති බැවින් අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍යන් හා වැරදි කරුවන් වූ ප්‍රමාණයන්ද 2022 වසරේ විශාල ලෙස අඩු වී ඇත. නඩු පැවරීම් ප්‍රතිශතයක් ලෙස 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ 67% ක් දක්වා පහත වැටී ඇත.

වගුවට අනුව හෂිස් සම්බන්ධ වැරදි දක්වා ඇති වසර තුනෙහි ඉහළ යාමක් දක්නට ලැබේ. 2020 වසරෙහි වැරදි 55 ක් වාර්තා වූ අතර, 2021 වසරෙහි 294 ක් දක්වා විශාල ලෙස ඉහළ යාමක්ද ඊට සාපේක්ෂව 2022 වසරේ 483 ක් දක්වා 2021 වසරට සාපේක්ෂව 64% ක ඉහළ යාමක්ද දැකිය හැකිය. වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාවද පෙර වසර දෙකට සාපේක්ෂව 2022 වසරෙහි 416 ක් දක්වා 100% කින් ඉහළ ගොස් ඇත. කෙසේ උවද අත්අඩංගුවට පත් හෂිස් ප්‍රමාණය කි.ග්‍රෑ.51 ක් දක්වා 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ 50% කින් පහළ ගොස් ඇත.

ඉතා විශාල ලෙස වාර්තා වන නිද්‍රාජනක ද්‍රව්‍යයක් වන හෙරොයින් සම්බන්ධ වැරදි 66331 ක් 2020 වසරේ වාර්තා වී ඇති අතර, 2021 වසරේ 47896ක් දක්වා 28% ක පහළ යාමක් හඳුනාගත හැකිය. ඊට සාපේක්ෂව 2022 වසරේ 70599 ක් දක්වා 47% ක ඉහළ යාමක් දක්නට ඇත. මෙම වරද සම්බන්ධයෙන් 2022 වසරේ වැරදිකරුවන් වූ ප්‍රමාණය 54236 ක් වැනි විශාල සංඛ්‍යාවක් වන අතර එය 2021 වසරේ වරදකරුවන් වූ ප්‍රමාණයට සාපේක්ෂව 65% ක ඉහළ යාමකි. අත්අඩංගුවට පත් හෙරොයින් ප්‍රමාණය ගත් විට 2021 වසරේ කි.ග්‍රෑ.2637 සිට 2022 වසරේ කි.ග්‍රෑ.1445 ක් දක්වා 45% කින් පහළ ගොස් ඇත.

මෝෆින් සම්බන්ධයෙන් වගුවෙහි දත්ත වලට අනුව පැහැදිලි වෙනසක් 2021 සහ 2022 වසර වල දැකිය හැකිය. එනම් 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ මෝෆින් සම්බන්ධ වැරදි වල විශාල අඩුවීමක් හඳුනාගත හැකි වීමයි. ඒ අනුව වාර්තා වූ වැරදි ප්‍රමාණය 2021 වසරේ 361 ක් වූ අතර, එය 2022 වසරේ 18 ක් දක්වා සීඝ්‍රයන් පහත වැටී ඇත. අත්අඩංගුවට ගත් මෝෆින් ප්‍රමාණයද ඉතා අඩු මට්ටමක පවතින අතර, වාර්තා වූ වැරදි සම්බන්ධව නඩු පැවරීමේ ප්‍රතිශතය 94% ක් වැනි ඉහළ මට්ටමක පවතී.

කොකේන් පිළිබඳ වැරදි වාර්තා වීම් වසර තුනෙහිම පහළ යාමක් දක්නට ලැබේ. 2020 වසරේ 49 ක් වාර්තා වූ අතර, එය 2021 වසරේ 47 ක් දක්වා 4% කින්ද 2022 වසරේ 31 ක් දක්වා 13% කින්ද පහත වැටී ඇත. කෙසේ උවද කොකේන් අත්අඩංගුවට ගැනීම් සළකා බැලීමේදී 2022 වසරේ සීඝ්‍ර ඉහළ යාමක් දක්නට ලැබේ. 2021 වසරේ කි.ග්‍රෑ.15 ක් අත්අඩංගුවට ගෙන ඇති අතර, 2022 වසරේ කි.ග්‍රෑ.369 ක් දක්වා විශාල ලෙස ඉහළ ගොස් ඇත.

සමස්ථයක් ලෙස සළකා බැලූ විට නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි වාර්තා වීම 2020 වසරේ 134182 ක් ලෙස දක්වා ඇති අතර, වගුවට අනුව 2021 වසරේ වාර්තා වූ ප්‍රමාණය 99971 ක් දක්වා 25% ක

පහත වැටීමක් පෙන්නුම් කර ඇත. 2022 වසරේ නිද්‍රාජනක වැරදි 2021 වසරට සාපේක්ෂව නැවතත් ඉහළගොස් ඇති අතර, ඒ අනුව 132824 ක් දක්වා 33% ක වැඩිවීමක් 2022 වසරේ දක්නට ඇත.

♦ වෙනත් විශේෂිත නිද්‍රාජනක ද්‍රව්‍ය

වගු අංක 12 මගින් ඉදිරිපත් කර ඇති නිද්‍රාජනක වැරදි මෑත කාලීනව විශාල ලෙස ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන අතර, මෙම මත්ද්‍රව්‍ය සමාජය තුළ සැළකිය යුතු ලෙස සංසරණය වන බවට හඳුනාගෙන ඇත.

වගු අංක - 12 **වෙනත් විශේෂිත නිද්‍රාජනක ද්‍රව්‍ය**

2022								
අනු අංකය		වාර්තා වූ	නඩු පවරන ලද	වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව	නඩු පැවරීමේ ප්‍රතිශතය	අත්අඩංගුවට ගත් ප්‍රමාණය(කි.ග්‍රෑම්/ග්‍රෑම්/මි.ග්‍රෑම්)		
						කි.ග්‍රෑම්	ග්‍රෑම්	මි.ග්‍රෑම්
1	අයිස්	20105	18955	17955	94%	252	420	568.1
2	බාබුල්	97	97	91	100%	2	534	278
3	මාවා	508	415	373	82%	25	46	897
					එකතුව	280	1	743
						ප්‍රමාණයන්		
4	මත්පෙති	27	27	4	100%	48220		
5	මත් මුද්දර	2	2	2	100%	436		
6	වේදනා නාශක පෙති	1	1	1	100%	296		
එකතුව		20740	19497	18426	94%	48952		

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

වගුවෙහි සඳහන් නිද්‍රාජනක වැරදි අතර, බහුල ලෙසම වාර්තා වන අයිස් (මෙත්ඇම්පිටමින්) මත්ද්‍රව්‍ය වැරදි 20105 ක් 2022 වසරේ වාර්තා වූ අතර, ඉන් 18955 ක් එනම් 94% කට නඩු පවරා ඇත. සැළකිය යුතු ප්‍රමාණයක් එනම් පුද්ගලයින් 17955 ක් වරදකරුවන් කර ඇති අතර, අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය කි.ග්‍රෑ. ලෙස ගත් විට 252කි.

මාවා සම්බන්ධ වැරදි 508 ක් වාර්තා වූ අතර, ඉන් 415 කට එනම් 82% කට නඩු පවරා පුද්ගලයන් 373 ක් වැරදිකරුවන් කර ඇත. අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය කි.ග්‍රෑ. ලෙස 25 කි.

බාබුල් නැමැති මත්ද්‍රව්‍ය වැරදි 97 ක් වාර්තා වී ඇති අතර, සියල්ලටම නඩු පවරා ඇත.

මීට අමතරව මත්පෙති, මත් මුද්දර සහ වේදනානාශක පෙති සම්බන්ධ වැරදි ද වාර්තා වී ඇති අතර, ඉන් මත්පෙති සම්බන්ධ වැරදි 27 ක් වාර්තා වූ අතර, නඩු පැවරීමේ ප්‍රතිශතය 100% කි. එහිදී මත්පෙති 48220 ක් අත්අඩංගුවට ගෙන ඇත.

♦ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය සිදුකළ වැටලීම් ඡායා රූප



2022.05.21 වන දින කැළණිය ගෝනවලදී ගංජා කිලෝ **249** ග්‍රෑම් **96** ක් අත්අඩංගුවට ගැනීම.



2022.11.07 වන දින බෙරුවල දී හෙරෝයින් කිලෝ **08** ග්‍රෑම් **304** ක් අත්අඩංගුවට ගැනීම.



2022.11.19 රාජගිරියේ දී කොකේන් ග්‍රෑම් **03** මිලි ග්‍රෑම් **820** ක් අත්අඩංගුවට ගැනීම.



2022.08.30 වන දින ග්‍රෑන්ඩ්පාස් හිදී නීති විරෝධී මත් පෙති **80**ක් (ග්‍රෑම් **20**) අත්අඩංගුවට ගැනීම.



2022.07.10 හැඳල ඇලකන්දේ දී අයිස් කිලෝ **04** ග්‍රෑම් **329** ක් අත්අඩංගුවට ගැනීම.



2022.07.22 ආමර්විදියේ දී මෙතැම්පිටමින් කිලෝ **04** ග්‍රෑම් **38** ක් අත්අඩංගුවට ගැනීම.

2.1.4 සුරාබදු වැරදි

ශ්‍රී ලංකා පොලිසිය වෙත වාර්තා වන සුරා බදු වැරදි කාණ්ඩ 12 ක් යටතේ වර්ග කොට පහත වගුව මගින් දක්වා ඇති අතර බහුල ලෙස වාර්තා වන සහ වගුවෙහි සඳහන් කාල සීමාව තුළ වාර්තා වීමේ සුවිශේෂී ලක්ෂණ පෙන්නුම් කරන සුරාබදු වැරදි පිළිබඳ සරළ විග්‍රහයක් පහතින් ඉදිරිපත් කර ඇත.

වගු අංක - 13

සුරා බදු වැරදි

අනු අංකය	වරද	2020				2021				2022			
		වාර්තා කරුණු ලද සංඛ්‍යාව	නඩු පවරන ලද සංඛ්‍යාව	වැරදිකරුවන් ඇසුරුගලයින් සංඛ්‍යාව	නඩු පැවරීමේ ප්‍රතිශතය	වාර්තා කරුණු ලද සංඛ්‍යාව	නඩු පවරන ලද සංඛ්‍යාව	වැරදිකරුවන් ඇසුරුගලයින් සංඛ්‍යාව	නඩු පැවරීමේ ප්‍රතිශතය	වාර්තා කරුණු ලද සංඛ්‍යාව	නඩු පවරන ලද සංඛ්‍යාව	වැරදිකරුවන් ඇසුරුගලයින් සංඛ්‍යාව	නඩු පැවරීමේ ප්‍රතිශතය
1	නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය කිරීම හෝ පෙරීම	18166	15650	11827	86%	17478	13247	9100	76%	17499	15859	12051	91%
2	බලපත්‍රයක් නොමැතිව මහ රා නිෂ්පාදනය කිරීම	214	187	156	87%	126	103	109	82%	125	125	116	100%
3	නීති විරෝධී ලෙස රජයේ අරක්කු නිෂ්පාදනය කිරීම	118	113	97	96%	110	98	53	89%	113	111	104	98%
4	නීති විරෝධී ලෙස ස්ප්‍රිතු වර්ග නිෂ්පාදනය කිරීම හෝ පෙරීම	714	657	494	92%	742	685	448	92%	507	466	392	92%
5	නීති විරෝධී මත්පැන් විකිණීම / ළඟතබා ගැනීම	102965	89887	88040	87%	106415	84158	63931	79%	106286	95972	77798	90%
6	නීති විරෝධී මහ රා විකිණීම / ළඟතබා ගැනීම	12742	11851	10036	93%	2612	2175	1746	83%	2404	2292	2028	95%
7	බලපත්‍රයක් නොමැතිව රජයේ අරක්කු විකිණීම හෝ ලීටර් 7.5 කට වඩා ළඟතබා ගැනීම	3953	3709	3243	94%	4272	3686	2928	86%	3068	2958	2667	96%
8	බලපත්‍රයක් නොමැතිව බියර් වර්ග හා අනෙකුත් මත්පැන් වර්ග විකිණීම / විකිණීම සඳහා ළඟතබා ගැනීම	804	720	601	90%	865	762	646	88%	913	890	768	97%
9	නීති විරෝධී ලෙස නිෂ්පාදනය කළ ස්ප්‍රිතු වර්ග ලඟතබා ගැනීම හා විකිණීම	1337	1206	938	90%	1974	1732	1679	88%	566	557	468	98%
10	නීති විරෝධී මත්පැන් හෝ බලපත්‍රයක් නොමැතිව මහ රා / අනෙකුත් ස්ප්‍රිත්තු වර්ග / රජයේ අරක්කු ප්‍රවාහනය කිරීම	701	663	548	95%	293	244	206	83%	106	94	68	89%
11	නීති විරෝධී මත්පැන් / ස්ප්‍රිත්තු වර්ග / මහ රා නිෂ්පාදනයට ගන්නා උපකරණ ලඟතබා ගැනීම	837	779	632	93%	744	620	420	83%	397	391	307	98%
12	සුරාබදු ආඥාපනත යටතට වැටෙන අනෙකුත් වැරදි	5010	4117	3258	82%	2948	2417	1610	82%	2387	2079	1606	87%
	එකතුව	147561	129539	119870	88%	138579	109927	82876	79%	134371	121794	98373	91%

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

(සැ.යු. මෙහි " නඩු පැවරූ සංඛ්‍යාව " යන්නට වරදකරුවූ සංඛ්‍යාව, නිදොස් හෝ නිදහස් වූ සංඛ්‍යාව, අධිකරණයේ විභාග අවසන් නොවූ සංඛ්‍යාව සහ රස පරීක්ෂක වාර්තා නොලැබුණු සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)

නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය කිරීම හෝ පෙරීම සම්බන්ධ වැරදි 2020 වසරේ 18166 ක් වාර්තා වී ඇති අතර, එය 2021 වසරේ 17478 ක් දක්වා 4% ක සුළු පහළ යාමක් දක්නට ඇත. 2022 වසරේ වාර්තා වූ ප්‍රමාණය17499 කි. එය පෙර වසරට සාපේක්ෂව ඉතා සුළු වැඩි වීමකි. නඩු පැවරීම 2021 වසරේ 76% ක් වූ අතර, 2022 වසරේ 92% ක් දක්වා වර්ධනය වී ඇත. වරදකරුවන් වූ සංඛ්‍යාව 2021 වසරේ 9100 සිට 2022 වසරේ 12051 ක් දක්වා 32% කින් වැඩි වී ඇත.

බලපත්‍රයක් නොමැතිව මහ රා නිෂ්පාදනය කිරීමේ වැරදි වල අඩු වීමක් වගුවේ සඳහන් වසර තුනෙහි හඳුනාගත හැකිය. ඒ අනුව 2020 වසරේ වැරදි 214 ක් වාර්තා වී ඇති අතර, 2021 වසරේ 126ක් දක්වා 36% කින් පහත වැටී ඇත. නැවත 2022 වසරේ 125 ක් දක්වා තවදුරටත් අඩු වී ඇත.

නීති විරෝධී ලෙස රජයේ අරක්කු නිෂ්පාදනය කිරීමේ වැරදි 118 ක් 2020 වසරේ වාර්තා වී ඇති අතර, 2021 වසරේ මෙම වැරදි 110 ක් දක්වා 7% ක අඩු වීමක් දක්නට ඇත. නැවත 3% ක ඉහළ යාමක් පෙන්නුම් කරමින් 2022 වසරේ වැරදි 113 ක් දක්වා වර්ධනය වී ඇත. නඩු පැවරීම් 2021 වසරේ 89% සිට 2022 වසරේ 98% ක් දක්වා වර්ධනය වී ඇත.

නීති විරෝධී ස්ප්‍රීතු වර්ග නිෂ්පාදනය හෝ පෙරීම සළකා බැලීමේදී 2021 වසරේ වැරදි 742 ක් වාර්තා වූ අතර, 2022 වසරේ 32% ක සැළකිය යුතු පහත වැටීමක් දක්නට ඇත. එනම් වාර්තා වූ සංඛ්‍යාව 507 කි. නඩු පැවරීමේ ප්‍රතිශතය 2021 සහ 2022 දෙවසරෙහිම 92% ක් ලෙස නොවෙනස්ව පවතී.

සුරාබදු වැරදි වල ඉහළම ප්‍රමාණයකින් වාර්තා වන වැරදි ලෙස මෙම නීති විරෝධී මත්පැන් විකිණීම, ලඟ තබා ගැනීම සැළකිය හැකිය. 2020 වසරේ වාර්තා වූ සංඛ්‍යාව 102965 ක් වූ අතර, 2021 වසරේ 106415 ක් දක්වා 3% කින් ඉහළ ගොස් ඇත, 2022 වසරේ නැවතත් 106286 ක් දක්වා සුළු අඩු වීමක් පෙන්නුම් කරයි. වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව ගත් විට 2021 වසරට සාපේක්ෂව 22% ක ඉහළ යාමක් 2022 වසරේ දක්නට ඇත. එනම් 2021 වසරේ පුද්ගලයින් 63931 සිට 2022 වසරේ 77798 ක් දක්වා මෙම ඉහළ යාම සිදු වී ඇත.

නීති විරෝධී මහ රා විකිණීමේ, ලඟ තබා ගැනීමේ වැරදි වගුවෙහි සඳහන් වසර තුනෙහිම අඩු වීමක් දක්නට ඇත. වැරදි 12742 ක් 2020 වසරේ වාර්තා වූ අතර, 2021 වසරේ විශාල අඩු වීමක් පෙන්නුම් කරමින් 2612 ක් දක්වා 80% කින් පහළ ගොස් ඇත. 2022 වසරේ වැරදි 2404 ක් වාර්තා වූ අතර, එය 2021 වසරට සාපේක්ෂව තවදුරටත් 8 % ක අඩුවීමක් ලෙස දැක්විය හැකිය.

බලපත්‍රයක් නොමැතිව රජයේ අරක්කු විකිණීම හෝ ලීටර් 7.5 කට වඩා ළඟතබා ගැනීමේ වැරදි 3953 ක් 2020 වසරේ වාර්තා වූ අතර, 4272 ක් දක්වා 8%ක වැඩිවීමක් 2021 වසරේ දැකිය හැකිය. 2022 වසරේ වාර්තා වූ වැරදි සංඛ්‍යාව 3068 ක් විය. එය පෙර වසරට සාපේක්ෂව 28% ක පහත වැටීමකි. නඩු පැවරීමේ ප්‍රතිශතය 86% සිට 96% ක් දක්වා 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ ඉහළ ගොස් ඇත.

බලපත්‍රයක් නොමැතිව බියර් වර්ග හා අනෙකුත් මත්පැන් වර්ග විකිණීම/ විකිණීම සඳහා ළඟතබා ගැනීම සම්බන්ධ වැරදි වසර තුනෙහිම යම් ඉහළ යාමක් දක්නට ඇත. 2020 වසරේ වැරදි 804 ක් වාර්තා වූ අතර, 2021 වසරේ වාර්තා වූ සංඛ්‍යාව 865 කි. වැඩිවීමේ ප්‍රතිශතය 8% කි. ඊට සාපේක්ෂව 2022 වසරේ 913 ක් දක්වා 6% කින් ඉහළ ගොස් ඇත. නඩු පැවරීමේ ප්‍රතිශතය 2021 වසරේ 88% සිට 2022 වසරේ 97% දක්වා වැඩි වී ඇත.

නීති විරෝධී ලෙස නිෂ්පාදනය කළ ස්ප්‍රීතු වර්ග ලඟතබා ගැනීම හා විකිණීම පිළිබඳ වැරදි වාර්තා වීම 2021 වසරේ 1974 කි. එම ප්‍රමාණය 2022 වසරේ 566 ක් දක්වා 71% කින් කැපී පෙනෙන ලෙස පහත වැටී ඇත. නඩු පැවරීමේ ප්‍රතිශතය 2021 වසරේ 88% සිට 2022 වසරේ 98% ක් දක්වා වර්ධනය වී ඇත.

නීති විරෝධී මත්පැන් හෝ බලපත්‍රයක් නොමැතිව මහ රා / අනෙකුත් ස්ප්‍රීත්තු වර්ග / රජයේ අරක්කු ප්‍රවාහනය කිරීමේ වැරදි සළකා බැලීමේදි වගුවෙහි සඳහන් වසර තුනට අදාළව පහළ යාමක් දක්නට ඇත. වැරදි 701 ක් 2020 වසරේ වාර්තා වූ අතර, 2021 වසරේ 293ක් දක්වා 58% කින් අඩු වී ඇත. 2022 වසරේ වාර්තා වූ සංඛ්‍යාව 106 කි. එනම් පෙර වසරට සාපේක්ෂව 64% ක පහළ යාමකි. නඩු පැවරීම ගත් විට 2021 වසරේ 83% සිට 2022 වසරේ 89% ක් දක්වා වර්ධනය වී ඇත.

නිති විරෝධී මත්පැන් / ස්ප්‍රීතු / මහ රා / නිෂ්පාදනයට ගන්නා උපකරණ ළඟ තබා ගැනීමේ වැරදි 2020 වසරේ 837 සිට 2021 වසරේ 744ක් දක්වා 11%කින් අඩු වී ඇත. එය තවදුරටත් 397ක් දක්වා 2022 වසරේ අඩු වී ඇති අතර, අඩු වීමේ ප්‍රතිශතය 47% කි.

සමස්ථයක් ලෙස සුරාබදු වැරදි සළකා බැලීමේදි වගුවෙහි සඳහන් වසර තුනෙහිම සුළු අඩු වීමක් පෙන්නුම් කර ඇත. 2020 වසරේ වාර්තා වූ වැරදි 147561ට සාපේක්ෂව 2021 වසරේ 138579 ක් දක්වා 6% කින්ද, ඊට සාපේක්ෂව 2022 වසරේ 134371ක් දක්වා 3% කින්ද පහත වැටී ඇත. වැරදිකරුවන් වූ සමස්ථ පුද්ගලයින් සංඛ්‍යාව 2021 වසර හා සැසඳීමේදී 2022 වසරේ 19% කින්

ඉහළ යාමක්ද හඳුනාගත හැකිය. නඩු පැවරීම 2021 වසරේ 79% ක් වූ අතර, 2022 වසරේ 91% ක් දක්වා ඉහළ ගොස් ඇත.

2.1.5 ව්‍යවස්ථාපිත වැරදි.

විවිධ ව්‍යවස්ථාපිත පනත් මගින් තහනම් කරන ලද වැරදි කාණ්ඩ 31 යටතේ පහත වගුව මගින් දක්වා ඇති අතර බහුල ලෙස වාර්තා වන සහ සමාජයේ විශේෂ අවධානයට පාත්‍රවන වැරදි සම්බන්ධයෙන් විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත.

වගු අංක - 14 **ව්‍යවස්ථාපිත වැරදි**

අ.අ	වරද	2020				2021				2022			
		වාර්තා ය	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා ය	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා ය	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
1	**2009** අංක **20** දරන විදුලිබල පනත - වංචනික ලෙස විදුලිය ලබා ගැනීම	420	379	41	90%	446	365	81	82%	293	236	57	81%
2	අයාල ආඥාපනත යටතේ කරනු ලබන වැරදි	524	498	26	95%	389	377	12	97%	315	289	26	92%
3	සත්ත්ව වධහිංසා පනත යටතේ කරනු ලබන වැරදි	687	647	40	94%	538	497	41	92%	483	443	40	92%
4	බලපත්‍ර නොමැතිව ඉන්ධන ලබාගැනීම හෝ විකිණීම	29	28	1	97%	35	29	6	83%	1166	1102	64	95%
5	පුරාවස්තු සොරකම් කිරීම හෝ විනාශ කිරීම හෝ ළඟ තබා ගැනීම	241	182	59	76%	228	192	36	84%	212	183	29	86%
6	සූදු ආඥාපනත යටතේ කරන ලද වැරදි	1468	1336	132	91%	1283	1115	168	87%	1244	1185	59	95%
7	රේගු ආඥාපනත යටතේ කරනු ලබන වැරදි	68	39	29	57%	103	87	16	84%	19	18	1	95%
8	තේ හා රබර් ආඥාපනත යටතේ කරනු ලබන වැරදි	53	33	20	62%	64	60	4	94%	27	21	6	78%
9	**1981** අංක **87** හා **1988** අංක **64** දරණ පනතින් සංශෝධනය වූ වෙරළ සංරක්ෂණ පනත යටතේ කරන ලද වැරදි	208	193	15	93%	90	82	8	91%	95	93	2	98%
10	වියාජ ලෙස සී.ඩී/ වී.සී.ඩී/ ඩී.වී.ඩී තැටි නීති විරෝධී ලෙස සකස් කිරීම	27	24	3	89%	40	31	9	78%	22	20	2	91%
11	පාරිසරික පනත් යටතේ කරන ලද වැරදි	2138	1987	151	93%	1583	1418	165	90%	1606	1465	141	91%
12	තහනම් පිඟිය ළඟතබා ගැනීම	211	196	15	93%	180	154	26	86%	205	195	10	95%
13	බලපත්‍රයක් නොමැතිව ගිනිකෙළි භාණ්ඩ ළඟතබා ගැනීම හා ප්‍රදර්ශණය කිරීම	13	11	2	85%	15	14	1	93%	8	8	0	100%
14	බලපත්‍රයක් නොමැතිව පුපුරණ ද්‍රව්‍ය ළඟතබා ගැනීම/ ප්‍රවාහනය කිරීම/ විකිණීම	153	119	34	78%	206	165	41	80%	110	93	17	85%
15	බලපත්‍රයක් නොමැතිව පතොරම් ළඟතබා ගැනීම/ ප්‍රවාහනය කිරීම/ විකිණීම	215	196	19	91%	64	49	15	77%	34	27	7	79%
16	සීමත්ව කරන ලද වැරදි - **1979** අංක **41** දරන පනත	8199	7659	540	93%	4315	3950	365	92%	5698	5385	313	95%
17	බලපත්‍රයක් නොමැතිව තුවක්කු නිෂ්පාදනය කිරීම/ ළඟ තබා ගැනීම/ ප්‍රවාහනය කිරීම/ විකිණීම	2236	1911	325	85%	1934	1633	301	84%	1685	1526	159	91%
18	ධීවර ආඥාපනත යටතේ කරන ලද වැරදි	282	256	26	91%	152	140	12	92%	185	174	11	94%
19	ඩයිනමයිට්/ පුපුරණ ද්‍රව්‍ය දමා මසුන් ඇල්ලීම	10	7	3	70%	12	8	4	67%	10	10	0	100%
20	ලයිට්කෝස් ක්‍රමය භාවිතාකර මසුන් ඇල්ලීම	38	35	3	92%	7	3	4	43%	0	0	0	0%
21	**1970** අංක **01** දරන සංශෝධිත වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ පනත යටතේ වැරදි	691	606	85	88%	486	395	91	81%	540	497	43	92%

		2020				2021				2022			
		වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
22	ආරක්ෂිත සතුන් දඩයම් කිරීම	90	85	5	94%	88	81	7	92%	72	65	7	90%
23	බලපත්‍රයක් නොමැතිව සත්ත්ව කොටස් ළඟතබා ගැනීම	269	242	27	90%	156	139	17	89%	133	119	14	89%
24	දඩමස් ළඟතබා ගැනීම	483	451	32	93%	575	512	63	89%	595	528	67	89%
25	1966 අංක 13 දරන වන ආඥාපනත යටතේ කරන ලද වැරදි	385	342	43	89%	353	289	64	82%	208	165	43	79%
26	රක්ෂිත වනය විනාශ කිරීම, හානි කිරීම හෝ ගස්කැපීම	288	260	28	90%	519	350	169	67%	291	222	69	76%
27	නීති විරෝධී ලෙස වැලි / පස් ගොඩදැමීම හෝ ප්‍රවාහනය	7665	7205	460	94%	8826	8310	516	94%	4718	4461	257	95%
28	නීති විරෝධී ලෙස දැව ප්‍රවාහනය කිරීම	816	693	123	85%	868	622	246	72%	691	570	121	82%
29	මැණික් හා ස්වර්ණාභරණ ආඥාපනත යටතේ කරන ලද වැරදි	259	223	36	86%	195	155	40	79%	239	175	64	73%
30	නීති විරෝධී මැණික් ගැරීම	665	587	78	88%	571	519	52	91%	1122	1027	95	92%
31	වෙනත්	2491	2319	172	93%	4761	3281	1480	69%	1717	1546	171	90%
එකතුව		31322	28749	2573	92%	29082	25022	4060	86%	23743	21848	1895	92%

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

(සැ.යු. මෙහි විසඳූ යන්නට නඩු පැවරූ සංඛ්‍යාව එනම් අධිකරණයේ විභාග වෙමින් පවතින සංඛ්‍යාව, නිදොස් හෝ නිදහස් වූ සංඛ්‍යාව, වැරදිකරු වූ සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)

වගු අංක 14ට අනුව වංචනික ලෙස විදුලිය ලබා ගැනීමේ අවස්ථා 420 ක් 2020 වසරේ වාර්තා වී ඇති අතර, එය 446 ක් දක්වා 6% කින් 2021 වසරේ ඉහළ ගොස් ඇත. 2022 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණය 293 කි. එය 2021 වසරට සාපේක්ෂව 34% ක පහළ යාමකි.විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 82% ක් ද, 2022 වසරේ 81% ක් ද වේ.

අයාල ආඥා පනත යටතේ කරනු ලබන වැරදි වල යම් ක්‍රමානුකූල පහළ යාමක් වගුවට අනුව දක්නට ඇත. 2020 වසරේ වාර්තා වූ වැරදි 524ට සාපේක්ෂව 2021 වසරේ වැරදි 389 ක් දක්වා 26% කින් පහත වැටී ඇත. 2022 වසරේ වැරදි 315 ක් වාර්තා වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 19% ක අඩුවීමකි. විසඳීමේ ප්‍රතිශතය වසර තුනෙහිම 90% ඉක්මවා ඇත.

සත්ත්ව වද හිංසා පනත යටතේ වූ වැරදි 2020 වසරේ 687 ක් ද 2021 වසරේ 538 ක් ද 2022 වසරේ 483 ක් ද ලෙස යම් පහළ යාමක් හඳුනාගත හැකිය. 2022 වසරේ අඩුවීමේ ප්‍රතිශතය 2021 වසරට සාපේක්ෂව 10% කි. විසඳීමේ ප්‍රතිශතය වසර තුනෙහිම 90% ඉක්මවා ඇත.

පුරාවස්තු සොරකම් කිරීම, විනාශ කිරීම සම්බන්ධව වැරදි 241 ක් 2020 වසරේ වාර්තා වූ අතර, 2021 වසරේ එම වැරදි 228 ක් දක්වා 5% කින් පහළ ගොස් ඇත. 2022 වසරේ මෙම වැරදි 212 ක් වාර්තා වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 7% ක පහත වැටීමකි. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 84% ක් ද, 2022 වසරේ 86% ක් ද ලෙස දක්වා ඇත.

සැළකිය යුතු මට්ටමකින් වාර්තා වන සුදු ආඥා පනත යටතේ ගැනෙන වැරදි 1468 ක් 2020 වසරේ වාර්තා වූ අතර, 2021 වසරේ එම වැරදි 1293 ක් දක්වා 13 % කින් පහළ ගොස් ඇත. 2022 වසරේ මෙම වැරදි 1244 ක් වාර්තා වී ඇති අතර, එය 2021 වසරට සාපේක්ෂව 3 % ක පහළ යාමකි. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 87% සිට 2022 වසරේ 95% ක් දක්වා වර්ධනය වී ඇත.

තේ හා රබර් ආඥා පනත යටතේ ගැනෙන වැරදි 53ක් 2020 වසරේ වාර්තා වූ අතර, 2021 වසරේ 64 ක් දක්වා 21% කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේ නැවත 58% කින් පහළ යාමක් පෙන්නුම් කරන අතර, වාර්තා වූ සංඛ්‍යාව 27 කි.විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 60% සිට 2022 වසරේ 78%ක් දක්වා ඉහළ ගොස් ඇත.

රේගු ආඥා පනතට ගැනෙන වැරදි වලද විශාල අඩු වීමක් 2022 වසරේ හඳුනාගත හැකිය. ඒ අනුව 2021 වසරේ වාර්තා වූ සංඛ්‍යාව 103 ක් වූ අතර, 19 ක් දක්වා 82% කින් 2022 වසරේ පහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2022 වසරේ 95% වැනි ඉහළ මට්ටමක පවතී.

1981 අංක 87 හා 1988 අංක 64 දරණ පනතින් සංශෝධනය වූ වෙරළ සංරක්ෂණ පනත යටතේ ගැනෙන වැරදි 90ක් 2021 වසරේ වාර්තා වූ අතර, 2022 වසරේ 9 5ක් දක්වා 6% කින් ඉහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 සහ 2022 වසර වල පිළිවෙලින් 91% ක් සහ 98% ක් ලෙස වගුවෙහි දක්වා ඇත.

බුද්ධිමය දේපළ පනත යටතේ ගැනෙන වැරදි වාර්තා වීම පහළ අගයක් ගෙන ඇති අතර, 2021 වසරේ වාර්තා වූ වැරදි 40 ට සාපේක්ෂව 2022 වසරේ වැරදි 22 ක් දක්වා 45% කින් අඩුවී ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 78% සිට 2022 වසරේ 91% ක් දක්වා වර්ධනය වී ඇත.

පාරිසරික පනත යටතේ ගැනෙන වැරදි සැලකිය යුතු ප්‍රමාණයක් වාර්තා වන අතර, 2020 වසරේ 2138 ක් වාර්තා වි ඇත. 2021 වසරේ 1583ක් දක්වා 26% කින් පහළ ගොස් ඇත. 2022 වසරේ 1606ක් දක්වා 1% ක පමණ සුළු ඉහළ යාමක් දක්නට ඇත. 2021 සහ 2022 වසර වල විසඳීමේ ප්‍රතිශතය පිළිවෙලින් 90% ක් සහ 91% මට්ටමේ පවතී.

වගුවෙහි සඳහන් වැරදි වල බහුලවම වාර්තා වන බීමත්ව කරන ලද වැරදි 8199 ක් 2020 වසරේ වාර්තා වූ අතර, 2021 වසරේ සීග්‍ර පහළ යාමක් පෙන්නුම් කරමින් වැරදි 4315 ක් දක්වා 47% කින් අඩු වී ඇත. 2022 වසරේ නැවත 32% ක ඉහළ යාමක් පෙන්නුම් කරමින් වැරදි 5698 ක් වාර්තා වී ඇත.

රක්ෂිත වනය විනාස කිරීමේ හානි කිරීමේ හෝ ගස් කැපීමේ වැරදි 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ සැලකිය යුතු ඉහළ යාමක් පෙන්නුම් කළද වගුවට අනුව 2022 වසරේ 291ක් දක්වා පෙර වසරෙහි වාර්තා වූ 519 ට සාපේක්ෂව 44% කින් පහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 67% සිට 2022 වසරේ 76 ක් දක්වා වර්ධනය වී ඇත.

බහුල ලෙස වාර්තා වන වරදක් වන නීති විරෝධී ලෙස වැලි / පස් ගොඩ දැමීමේ හෝ ප්‍රවාහනය කිරීමේ සිදුවීම් 7665ක් 2020 වසරේ වාර්තා වූ අතර, එය 2021 වසරේ 8826ක් දක්වා 15% කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේ මෙම වැරදි වාර්තා වීම් 4718ක් දක්වා 47% කින් අඩුවී ඇත. විසඳීමේ ප්‍රතිශතය වසර තුනෙහිම 94% මට්ටමේ පවතී.

නීති විරෝධී දැව ප්‍රවාහන සිදුවීම් 816 සිට 868 දක්වා 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ ඉහල ගොස් ඇති අතර, 2022 වසරේ 691ක් දක්වා 20% කින් පහත වැටී ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 72% ක්ද 2022 වසරේ 82% ක්ද ලෙස දැක්වේ.

නීති විරෝදි මැණික් ගැරීම් සළකා බැලීමේදී 2021 වසරට වඩා ඉහළ යාමක් 2022 වසරේ හඳුනාගත හැකිය. 2021 වසරේ වාර්තා වූ සංඛ්‍යාව 571ක් වන විට 2022 වසරේ 1122ක් දක්වා 96% කින් ඉහළ ගොස් ඇත. වසර දෙකෙහිම විසඳීමේ ප්‍රතිශතය 91% කි.

සමස්ථ ව්‍යවස්ථාපිත වැරදි සළකා බැලීමේදී 2020 වසරට සාපේක්ෂව 2021 සහ 2022 වසර වල අඩු වීමක් වගුව මගින් හඳුනාගත හැකිය. 2020 වසරේ 31322ක් වාර්තා වූ අතර, 2021 වසරේ 29082ක් දක්වා 7% කින් ද 2022 වසරේ 23743ක් දක්වා 18% කින් ද අඩු විමක් දැකිය හැකිය.

2.1.6 දූෂණ වැරදි.

වගු අංක - 15

දූෂණ වැරදි

අනු අංකය	වරද	2020					2021					2022				
		වාර්තා වූ	නඩු පවරන ලද සංඛ්‍යාව	නඩු පැවරීමේ ප්‍රතිශතය	නඩු පවරන ලද පුද්ගලයින් සංඛ්‍යාව		වාර්තා වූ	නඩු පවරන ලද සංඛ්‍යාව	නඩු පැවරීමේ ප්‍රතිශතය	නඩු පවරන ලද පුද්ගලයින් සංඛ්‍යාව		වාර්තා වූ	නඩු පවරන ලද සංඛ්‍යාව	නඩු පැවරීමේ ප්‍රතිශතය	නඩු පවරන ලද පුද්ගලයින් සංඛ්‍යාව	
					පුරුෂ	ස්ත්‍රී				පුරුෂ	ස්ත්‍රී				පුරුෂ	ස්ත්‍රී
1	වෛශ්‍යා වෘත්තිය	466	438	94%	7	493	203	185	91%	17	206	145	145	100%	13	336
2	ගණිකා නිවාස	446	412	92%	276	712	199	182	91%	136	360	355	325	92%	195	730
3	පෙළඹවීම් (වයස 18 ට අඩු ළමයෙක් ලිංගික අපයෝජනය සඳහා)	1	1	100%	0	1	7	7	100%	0	7	116	101	87%	27	182
4	සමලිංගික සම්බන්ධතා	1	1	100%	1	0	12	11	92%	11	0	0	0	0%	0	0
5	සෙළුව පෙන්වීම, කාමුක ලෙස එබීබැලීම සහ හිරිඔතප් බිඳීම	17	13	76%	16	0	37	37	100%	29	5	28	18	64%	16	0
6	අසභ්‍ය කාඩ්පත්, ඡායාරූප හා පත්‍රිකා විකිණීම	70	65	93%	49	7	29	29	100%	28	6	27	27	100%	20	6
එකතුව		1001	930	93%	349	1213	487	451	93%	221	584	671	616	92%	271	1254

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

(**සැ.යු.** මෙහි නඩු පැවරූ සංඛ්‍යාව යනු පොලීසිය විසින් විමර්ශන අවසන් කර අධිකරණයේ නඩු පැවරූ සංඛ්‍යාව වේ.)

වෛශ්‍යා වෘත්තිය සම්බන්ධ වැරදි 466 ක් 2020 වසරේ වාර්තා වී ඇත. 2021 වසරේ වාර්තා වූ ප්‍රමාණය 203 කි. එය පෙර වසරට සාපේක්ෂව 56% ක පහළ යාමකි. 2022 වසරේ වාර්තා වූ සංඛ්‍යාව 145 කි. එනම් 2021 වසරට සාපේක්ෂව 29% ක පහළ යාමකි. 2021 වසරේ ස්ත්‍රීන් 206 දෙනෙකුට නඩු පවරා ඇති අතර, 2022 වසරේ ස්ත්‍රීන් 336 දෙනෙකුට නඩු පවරා ඇත. නඩු පැවරීමේ ප්‍රතිශතය 90%ඉ ඉක්මවා ඇති අතර, 2022 වසරේ 100% ක ප්‍රතිශතයක් අත්කරගෙන ඇත.

ගණිකා නිවාස පවත්වාගෙන යාම පිළිබඳ වැරදි 2020 වසරේ 446 සිට 2021 වර්ෂයේ 199ක් දක්වා 55% කින් අඩු වී තිබුනද 2022 වසරේ 355 ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 78% කින් වැඩි වී ඇත. 2021 වසරෙහි නඩු පවරන ලද පුද්ගලයින්ගෙන් 73% ක් ස්ත්‍රීන් වූ අතර, 2022 වසරේ 79% ක් ස්ත්‍රීන් වේ. නඩු පැවරීමේ ප්‍රතිශතය 90% ඉක්මවා ඇත.

පෙළඹවීම් සම්බන්ධ වැරදි ඉතා අවම මට්ටමකින් 2020 සහ 2021 වසර වල වාර්තා උවද 2022 වසරේ 116 ක් දක්වා සැලකිය යුතු ඉහළ යාමක් දක්නට ඇත. මෙම වැරදි සම්බන්ධ නඩු පැවරීම් ප්‍රතිශතය 2021 වසරේ 100% ක් උවද 2022 වසරේ 87% ක් දක්වා පහත වැටී ඇත.

වගුවට අනුව සෙළුව පෙන්වීම, කාමුක එබී බැලීම, හිරි ඔතප් බිඳීම යන කාණ්ඩයේ වැරදි 2021 වසරෙහි 37 ක් වාර්තා වී ඇති අතර, එය 2022 වසරේ 28ක් දක්වා 24% කින් අඩු වී ඇත. නඩු පැවරීමේ ප්‍රතිශතය 2021 වසරේ 100% සිට 2022 වසරේ 64% ක් දක්වා පහළ ගොස් ඇත.

අසභ්‍ය කාඩ්පත් විකිණීම සම්බන්ධ වැරදි 2020 වසරේ 70 ක් සහ 2021 වසරේ 29 ක් වාර්තා වී ඇති අතර, අඩු වීමේ ප්‍රතිශතය 59% කි. 2022 වසරේද මෙම වැරදි 27ක් දක්වා 7% ක සුළු අඩුවීමක් දැකිය හැකිය. 2022 වසරේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම 26 දෙනෙකුට නඩු පවරා ඇති අතර, නඩු පැවරීමේ ප්‍රතිශතය 2021 සහ 2022 වසර වල 100% ක මට්ටමක පවතී.

සමස්ථයක් ලෙස දූෂණ වැරදි වාර්තා වීම් සළකා බැලූ විට 2021 වසරේ 487ක් වාර්තා වී ඇති අතර, 2022 වසරේ 671 ක් දක්වා 38% කින් වර්ධනය වී ඇත. නඩු පවරන ලද පුද්ගලයින් සංඛයාව 2021 වසරට සාපේක්ෂව ඉහළ ගොස් ඇති අතර, 2021 වසරේ ස්ත්‍රීන් 584කට නඩු පවරා ඇති අතර, 2022 වසරේ ස්ත්‍රීන් 1254 දෙනෙකුට නඩු පවරා ඇත. එය පෙර විරට සාපේක්ෂව 115% ක වර්ධනයකි.

2.1.7 අපරාධ විමර්ශනය සහ නිවාරණය සඳහා ඇඟිලි සටහන් සහ නව තාක්ෂණය භාවිත කිරීමේ ප්‍රගතිය

අපරාධ විමර්ශන කාර්යයෙහිලා ඇඟිලි සටහන් හඳුනා ගැනීම මගින් ලැබෙන දායකත්වය සුළුපටු නොවේ. අදවන විට මේ ක්ෂේත්‍රයේ විශාල දියුණුවක් ශ්‍රී ලංකා පොලිසිය විසින් අත්කරගෙන ඇති අතර නව තාක්ෂණය භාවිතා කිරීම මගින් අපරාධ විමර්ශන කාර්යය වඩා වේගවත් වී ඇත. 2022 වසරේ මේ ක්ෂේත්‍රයේ ප්‍රගතිය පහත අයුරින් දැක්වේ.

- සෝදිසි කිරීම සඳහා යොමු කළ ඇඟිලි සටහන් අයවුම්පත් 182,265 කින් 15,263 ක් අපරාධමය වාර්තා ඇති බවට හඳුනාගෙන ඇති අතර, 167,002 ක් අපරාධ චෝදනා නොමැති බවට තහවුරු කරගෙන ඇත.
- අධිකරණ මගින් යොමුකර ඇති දි.ලි.අ. ඇතුළු අපරාධ තරුවන් 46,038 කගේ වාර්තා ලේඛනගත කර ඇත. දි.ලි.අ. 1369 කගේ හා ලියාපදිංචි අපරාධකරුවන් 5477 කගේ වාර්තා අවලංගු කර ඇත.
- දිවයිනේ සියළු පොලිස් කොට්ඨාස ආවරණය කරමින් පිහිටුවා ඇති ඇ.ස. ඒකක 27 ක් මගින් 2022 වර්ෂයේ අපරාධ ස්ථාන 11,073 ක් පරීක්ෂා කර ස්ථාන 5307 කදී සැකකරුවන්ගේ ඇඟිලි සටහන් 15,182 ක් සොයාගෙන ඇත.
- ගොනු කැර ඇති ඇඟිලි සටහන් විශාල ප්‍රමාණයක් අතරින් දිවයිනේ වාර්තා වූ අපරාධයන්හී සැකකරුවන් 300 දෙනෙකු ස්වෝත්සාහයෙන් හඳුනාගෙන විමර්ශනය සඳහා ලබා දී ඇති අතර, අපරාධයන්ට සම්බන්ධ බවට යෝජනා කර පොලිස් ස්ථාන මගින් යොජනා කල සැකකරුවන් 84 දෙනෙකු හඳුනාගෙන පැය 04 ක් වැනි කෙටි කාලයකින් විමර්ශකයින් වෙත ලබා දී ඇත.
- ළමයින්ට හා කාන්තාවන්ට එරෙහි අපරාධ නිවාරණය සඳහා ජංගම දුරකථන ඔස්සේ කෙටි පණිවුඩ මගින් ජනතාව දැනුවත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
- අපරාධ විමර්ශන පුහුණුවලත් නිල සුනඛයින් යොදාගෙන පහත පරිදි 2022 වසරේ වැටලීම් සිදුකර ඇත.

වගු අංක - **16**

නිල සුනඛ වැටලීම්

අනු අංකය	රාජකාරී ස්වභාවය	වැටලීම් සංඛ්‍යාව	සාර්ථක වූ සංඛ්‍යාව
01	මත්ද්‍රව්‍ය පරීක්ෂණ රාජකාරී	2887	838
02	අපරාධ පරීක්ෂණ රාජකාරී	2611	567

මූලාශ්‍රය - පොලිස් නිල සුනඛ කොට්ඨාසය

2.2 පොලිස් විශේෂ කාර්ය බලකා වැටලීම්.

ශ්‍රී ලංකා පොලිසිය මගින් සිදුකරනු ලබන මත්ද්‍රව්‍ය, සුරාබදු, අවි ආයුධ, පාරිසරික විනාශයන් සම්බන්ධ වැටලීම් සහ වෙනත් සියළුම වැටලීම් සඳහා විශේෂ කාර්ය බලකායේ දායකත්වය ද හිමිවේ. ඒ යටතේ ඉහත දක්වන ලද ක්ෂේත්‍රයන්ට අදාළව 2022 වසරේ විශේෂ කාර්ය බලකාය මගින් සිදුකරන ලද සමස්ථ වැටලීම් පහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක - **17**

විශේෂ කාර්ය බලකා වැටලීම්

අනු අංකය	වැටලීම් ක්ෂේත්‍රය	වැටලීම් ගණන	සැකකරුවන් ගණන
1	අවි ආයුධ සහ පුපුරණ ද්‍රව්‍ය	361	256
2	මත්ද්‍රව්‍ය වැටලීම්	1955	1926
3	සුරාබදු වැටලීම්	712	726
4	පාරිසරික විනාශයන් සම්බන්ධ වැටලීම්	1103	1337
5	වෙනත් වැටලීම්	555	833
එකතුව		**4686**	**5078**

මූලාශ්‍රය - පොලිස් විශේෂ කාර්ය බලකාය

- **පොලිස් විශේෂ කාර්ය බලකාය මඟින් සිදුකරන ලද වැටලීම් දැක්වෙන ඡායා රූප**



2022.01.07 දින හබරාදුවේ දී අත්අඩංගුවට ගත් නීති විරෝධී ගිණි අවියක්



2022.02.23 වත්තල දී අත්අඩංගුවට ගත් කේරළ ගංජා තොගයක්



2022.07.10 දින වත්තල දී අත් අඩංගුවට ගත් අයිස් මත්ද්‍රව්‍ය



2022.12.08 දින කොක්නහර දී අත්අඩංගුවට ගත් නීතිවිරෝධී මත්පැන්



2022.12.07 දින වාලවිවේන දී අත්අඩංගුවට ගත් වැලි ප්‍රවාහන රථ



2022.05.28 දේවාලහිඳ දී අත්අඩංගුවට ගත් ගජමුතු

2.3 විවිධ පැමිණිලි

වගු අංක - 18

විවිධ පැමිණිලි

වාර්තා කරන ලද පැමිණිල්ලේ ස්වභාවය		2020				2021				2022			
		වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා වූ	විසඳූ	විමර්ශනය වෙමින් පවතින	විසඳීමේ ප්‍රතිශතය
1	පහරදීම	191438	178759	12679	93%	183709	165193	18516	90%	196751	181087	15664	92%
2	බැන තර්ජනය කිරීම	186198	175283	10915	94%	180632	164311	16321	91%	179651	166811	12840	93%
3	පවුල් ආරවුල්	99025	92924	6101	94%	105469	95511	9958	91%	111709	103553	8156	93%
4	පුරුෂයාගෙන්/ භාර්යාවගෙන් හිරිහැරවීම හෝ නොසැළකීම, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය	19258	17707	1551	92%	20500	18443	2057	90%	22358	20442	1916	91%
5	අනියම් සබඳතා නිසා ඇති වන ආරවුල්	9599	8851	748	92%	9250	8159	1091	88%	9636	8751	885	91%
6	ඉඩම් ආරවුල්	101533	95627	5906	94%	106307	96960	9347	91%	92294	84369	7925	91%
7	සාමය කඩවීමේ ගැටළු	2292	2017	275	88%	1679	1454	225	87%	2316	2101	215	91%
8	විශ්වාසය/ පොරොන්දු කඩ කිරීම	8995	7538	1457	84%	8000	6282	1718	79%	10964	8907	2057	81%
9	මුදල් හා භාණ්ඩ පිළිබඳ ආරවුල්	87804	78311	9493	89%	74359	63023	11336	85%	88691	78050	10641	88%
10	දෙමාපියන්ට නොසැළකීම/ හිරිහැරවීම	9589	6537	3052	68%	8007	7130	877	89%	9648	8821	827	91%
11	කුලී නිවැසියන් හා අයිතිකරු අතර ආරවුල්	8206	7020	1186	86%	7321	6024	1297	82%	6639	5680	959	86%
12	සේවකයා හා ස්වාමියා අතර ඇති ආරවුල්	3273	2703	570	83%	2630	2205	425	84%	2453	2141	312	87%
13	අලාභ හානි සිදුවීම පිළිබඳව ගැටළු	16625	15135	1490	91%	17030	14887	2143	87%	18157	16375	1782	90%
14	මානසික පීඩාවන් ඇතිකිරීම සම්බන්ධ ගැටළු	6929	6469	460	93%	7453	6779	674	91%	10070	9513	557	94%
15	අතුරුදහන් වීම් පිළිබඳ පැමිණිලි	2921	2427	494	83%	2443	1785	658	73%	2345	1840	505	78%
16	වෙනත් පැමිණිලි	200614	183675	16939	92%	191097	171290	19807	90%	168432	154987	13445	92%
එකතුව		**954299**	**880983**	**73316**	**92%**	**925886**	**829436**	**96450**	**90%**	**932114**	**853428**	**78686**	**92%**

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

(**සැ.යු.** මෙහි "විසඳූ" යන්නට පොලීසිය මගින් සමථයට පත්වූ සංඛ්‍යාව, සමථ මණ්ඩලයේදී සමථවූ සංඛ්‍යාව, පැමිණිලිකරුගේ කැමැත්ත පරිදි ඉල්ලා අස්කරගත් සංඛ්‍යාව යන සියල්ල ඇතුළත් වේ.)

වගුවෙහි සඳහන් කාල පරිච්ඡේදයට අදාළව විවිධ පැමිණිලි පිළිබඳව සළකා බැලීමේදී මෙම පැමිණිලි වල උච්ඡාවචනයක් දක්නට ලැබේ. 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ මෙම විවිධ පැමිණිළි වල අඩුවීමක් මෙන්ම 2022 වසරේ යම් ඉහළ යාමක්ද දක්නට ලැබේ.

විවිධ පැමිණිලි වල විශාල ලෙස වාර්තා වන පහර දීම් සළකා බැලීමේදි 2020 වසරේ 191438ක් වාර්තා වූ අතර, 2021 වසරේ 183709ක් එනම් 4% ක පහළ යාමක් දක්නට හැකිය. නැවත 2022 වසරේ 196751 ක් දක්වා 7% ක ඉහළ යාමක් දක්නට ඇත. වසර තුනෙහිම විසඳීමේ ප්‍රතිශතය 90% කට වඩා ඉහළ මට්ටමක පවතී.

විවිධ ආරවුල් මත පදනම්ව සිදු වන බැන තර්ජනය කිරීම්ද විශාල ප්‍රමාණයක් වාර්ෂිකව පොලීසිය වෙත වාර්තා වේ. වගුවට අනුව 2020 වසරේ 186198 ක් සිට 2021 වසරේ 180632 ක් දක්වා 3% ක අඩුවීමක්ද 2022 වසරේ 179651 ක් දක්වා 1% ක පමණ සුළු ඉහළ යාමක්ද හඳුනාගත හැකිය. විසඳීමේ ප්‍රතිශතය වසර තුනෙහිම 90% ඉක්මවා ඇත.

පවුල් ආරවුල් සම්බන්ධ විවිධ පැමිණිලිද සැළකිය යුතු ප්‍රමාණයක් වාර්තා වන අතර, වගුවට අනුව මෙම පවුල් ආරවුල් සම්බන්ධ පැමිණිලි වල වසර තුනෙහිම ඉහළ යාමක් දක්නට ලැබේ. 2020 වසරේ 99025 සිට 2021 වසරේ 105469 දක්වා 7% ක ඉහළ යාමක් දක්නට ඇති අතර, 2022 වසරේ 111709 ක් දක්වා 2021 වසරට සාපේක්ෂව 6% ක ඉහළ යාමක්ද දක්නට ලැබේ. විසඳීමේ ප්‍රතිශතය වසර තුනෙහිම 90% කට වඩා ඉහළ මට්ටමක පවතී.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යටතේ එන පවුල් ආරවුල් සම්බන්ධ පැමිණිලි වලද වසර තුනෙහිම ඉහළ යාමක් දක්නට ඇත. 2021 වසරේ පැමිණිලි 20500 ක් වාර්තා වී ඇති අතර, එය 2020 වසරේ වාර්තා වූ පැමිණිලි 19258 ට සාපේක්ෂව 6% ක ඉහළ යාමකි. 2021 වසරට සාපේක්ෂව 22358 ක් දක්වා 9% ක ඉහළ යාමක් 2022 වසරේ දැකිය හැකිය. විසඳීමේ ප්‍රතිශතය වසර තුනෙහිම 90% ට වඩා ඉහළ ගොස් ඇත.

අනියම් සබඳතා නිසා ඇති වන ආරවුල් 9599 ක් 2020 වසරේ වාර්තා වි ඇති අතර, 2021 වසරේ වාර්තා වූ ප්‍රමාණය 9250 ක් එනම් 4% ක පහළ යාමකි. කෙසේ උවද 2022 වසරේ 9636 ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 4% ක ඉහළ යාමක් හඳුනාගත හැකිය. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 88% සිට 2022 වසරේ 91% ක් දක්වා ඉහළ ගොස් ඇත.

විවිධ පැමිණිලි වල බහුල ලෙස වාර්තා වන පැමිණිලි වර්ගයක් ලෙස ඉඩම් ආරවුල් දැකිය හැකිය. 2020 වසරේ ඉඩම් ආරවුල් 101533ක් වාර්තා වී ඇති අතර, 2021 වසරේ 106307ක් දක්වා 5% කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේ මෙම ඉඩම් ආරවුල් 92294 ක් වාර්තා වී ඇති අතර, එය 2021 වසරට සාපේක්ෂව 13% ක පහළ යාමක් ලෙස හඳුනාගත හැකිය. විසඳීමේ ප්‍රතිශතය 90% ඉක්මවා ඇත.

විශ්වාස / පොරොන්දු කඩවීම් සම්බන්ධ පැමිණිලි වගුවට අනුව 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ 11% ක අඩු වීමක් 8995 සිට 8000 දක්වා වාර්තා වී ඇති අතර, 2022 වසරේ යලි 10964 දක්වා 37% ක ඉහළ යාමක් සටහන් වී ඇත. සාමාන්‍යයෙන් මේ ක්ෂෙත්‍රයේ පැමිණිලි සම්බන්ධ විසඳීමේ ප්‍රතිශතය තරමක් පහළ අගයක් ගෙන ඇති බව දැකිය හැකිය.

මුදල් හා භාණ්ඩ පිළිබඳ ආරවුල්ද විශල ලෙස වාර්තා වන අතර, පැමිණිලි 87804 ක් 2020 වසරේ වාර්තා වී ඇත. ඊට සාපේක්ෂව 74359 ක් දක්වා 15% ක අඩු වීමක් 2021 වසරේ සටහන් වී ඇත. 2022 වසරේ මෙම පැමිණිලි වල ඉහළ යාමක් දක්නට ඇති අතර, 2021 වසරට සාපේක්ෂව 88691 ක් දක්වා 19% කින් මෙම වැඩි වීම සිදු වී ඇත. විසඳීමේ ප්‍රතිශතය වසර තුනෙහිම 85% ට වඩා ඉහළ මට්ටමක පවතී.

දෙමාපියන්ට නොසැලකීම පිළිබඳ පැමිණිලි 9589 සිට 8007ක් දක්වා 2021 වසරේ පහළ ගියද, 2022 වසරේ 9648 ක් දක්වා 20% කින් නැවත ඉහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය වසර තුනෙහි ක්‍රමානුකූලව ඉහළ ගොස් 2022 වසරේ 91% ක මට්ටමට ලභා වී ඇත.

කුලී නිවැසියන් හා අයිතිකරු අතර ආරවුල්, සේවකයා හා ස්වාමියා අතර ආරවුල් යන ක්ෂේත්‍රවල පැමිණිලි වසර තුනෙහිම පහළ යාමක් දක්නට ඇති අතර, වගුවට අනුව විසඳීමේ ප්‍රතිශතය 80% ට වඩා ඉහළ මට්ටමක පවතී.

අලාභහානි පිළිබඳ පැමිණිලි වල ඉහල යාමක් වගුවට අනුව දක්නට ඇත. 2020 වසරේ 16625 ක් වාර්තා වී ඇති අතර. 2021 වසරේ 17030 ක් දක්වා 2% කින් ඉහළ ගොස් ඇත. ඊට සාපේක්ෂව 2022 වසරේ 18157ක් දක්වා 7% කින් ඉහළ ගොස් ඇත. විසඳීමේ ප්‍රතිශතය 2021 වසරේ 87% සිට 2022 වසරේ 90% දක්වා වර්ධනය වී ඇත.

සමස්ථයක් ලෙස විවිධ පැමිණිලි වාර්තා වීම සළකා බැලීමේදී 2020 වසරේ පැමිණිලි 954299 ක් වාර්තා වූ අතර, 2021 වසරේ ඉහළ යාමේ ප්‍රතිශතය 3% කි. එනම් වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව 925886 කි. 2022 වසරේ සමස්ථ පැමිණිලි 932114 ක් දක්වා 2021 වසරට සාපේක්ෂව 1% කින් ඉහළ ගොස් ඇත. සමස්ථ විසඳීමේ ප්‍රතිශතය 90% ඉක්මවා ඇත.

2.4 රිය අනතුරු.

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන රිය අනතුරු, මාරක අනතුරු, බරපතල තුවාල අනතුරු, සුළු තුවාල අනතුරු, දේපළ අලාභ අනතුරු ලෙස කාණ්ඩ 04 කට බෙදා දත්ත ඉදිරිපත් කරනු ලැබේ. පහත වගුව මගින් 2020, 2021 සහ 2022 වසර වල දත්ත පදනම් කරගෙන රිය අනතුරු පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇත.

වගු අංක - 19 **රිය අනතුරු**

වර්ෂය	මාරක අනතුරු	බරපතල තුවාල අනතුරු	සුළු තුවාල අනතුරු	දේපළ අලාභ අනතුරු	මුළු අනතුරු ගණන	මිය ගිය සංඛ්‍යාව	වාහන සංඛ්‍යාව	වාහන **1000** කට අනතුරු සංඛ්‍යාව
2020	2040	6619	8909	5847	23415	2144	8297852	3
2021	2414	6401	8070	5434	22319	2513	8331702	3
2022	2395	6231	8209	5118	21953	2515	8021953	3

මූලාශ්‍රය - රථවාහන පොලිස් මූලස්ථානය

සැ.යු. - මෙහි ඇතැම් දත්ත වෙනස් විමට භාජනය විය හැක.

වගුවෙහි සඳහන් වසර තුනට අදාළව රිය අනතුරු සම්බන්ධයෙන් සළකා බැලීමේදී අවස්ථා කීපයකදී හැරුණුකොට රිය අනතුරු වල අඩුවීමක් දක්නට ලැබේ.

මාරක අනතුරු ගත් විට 2020 වසරේ 2040 ක් සිදු වී ඇති අතර, 2021 වසරේ 2414 ක් දක්වා 18% කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේ මාරක අනතුරු 2395 ක් දක්වා 1% ක පමණ සුළු අඩුවීමක් දක්නට ඇත.

බරපතල තුවාල අනතුරු වලද පහළ යාමක් දැකිය හැකි අතර, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ 6401 ක් දක්වා 3% කින්ද 2021 වසරේ 6231 ක් දක්වා නැවතත් 3% කින්ද අඩුවී ඇත.

සුළු තුවාල රිය අනතුරු 2020 වසරේ වාර්තා වූ ප්‍රමාණය 8909ක් වූ අතර, 2021 වසරේ 8070ක් දක්වා 9% කින් පහළ ගොස් ඇත. කෙසේ උවද 2022 වසරේ සුළු තුවාල අනතුරු වල 2% ක පමණ ඉහළ යාමක් දැකිය හැකිය.

දේපළ අලාභ අනතුරු සම්බන්ධයෙන් සළකා බැලීමේදි 2020 වසරේ වාර්තා වූ අනතුරු 5847 ට සාපේක්ෂව 2021 වසරේ 5434 ක් දක්වා 7% කින්ද, 2022 වසරේ 5118ක් දක්වා 6% කින්ද පහළ ගොස් ඇත.

සමස්ථ රිය අනතුරු වලද පහළ යාමක් හඳුනාගත හැකි අතර, 2020 වසරේ වාර්තා වූ රිය අනතුරු 23415 ට සාපේක්ෂව 22319 ක් දක්වා 5% ක අඩුවීමක් 2021 වසරේ දක්නට ඇත. 2022 වසරේ වාර්තා වූ අනතුරු ප්‍රමාණය 21953 කි. එය පෙර වසරට සාපේක්ෂව 2% ක පහත වැටීමකි.

වගුවට අනුව රිය අනතුරු වල අඩුවීමක් හඳුනාගත හැකි උවද රිය අනතුරු හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව ඉහළ ගොස් තිබේ. රිය අනතුරු හේතුවෙන් 2144 දෙනෙකු 2020 වසරේ මිය ගොස් ඇති අතර, ඊට සාපේක්ෂව 2513 ක් 2021 වසරේ මිය ගොස් ඇත. එය පෙර වසර හා සැසඳූ කළ 17% ක ඉහළ යාමකි. 2022 වසරේද මිය ගිය සංඛ්‍යාව 2515 ක් දක්වා තවදුරටත් ඉහළ ගොස් ඇත.

වාහන ආනයන සීමා හේතුවෙන් වාහන සංඛ්‍යාව 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ පහළ ගොස් ඇති අතර, වාහන 1000 කට අනතුරු සංඛ්‍යාව 2022 වසරේද 3 ක් ලෙස නොවෙනස්ව පවතී.

2.4.1 අධිවේගී මාර්ග ආශ්‍රිත රිය අනතුරු.

වගු අංක - 20 අධිවේගී මාර්ග රිය අනතුරු

අනු අංකය	අනතුරු වර්ගය	වර්ෂය		
		2020	2021	2022
01	මාරක අනතුරු	9	7	14
02	බරපතල තුවාල අනතුරු	8	9	7
03	සුළු තුවාල අනතුරු	60	95	81
04	දේපළ අලාභ අනතුරු	231	350	428
	එකතුව	**308**	**461**	**530**

මූලාශ්‍රය - රථවාහන පොලිස් මූලස්ථානය

වගුවට අනුව අධිවේගී මාර්ග ආශ්‍රිත සමස්ථ රිය අනතුරු වල ඉහළ යාමක් 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දක්නට ඇත. වගුවෙහි දත්ත වලට අනුව බරපතල තුවාල අනතුරු සහ සුළු තුවාල අනතුරු 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ පිළිවෙලින් 22% කින් සහ 15% කින් අඩු වී ඇති අතර, මාරක අනතුරු 100% කින් සහ දේපළ අලාභ අනතුරු 22% කින් 2022 වසරේ ඉහළ ගොස් ඇත.

සමස්ථ අනතුරු වල ඉහළයාම ගත් විට 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ 461 සිට 530ක් දක්වා 15% කින් ඉහළ ගොස් ඇත.

2.4.2 රිය අනතුරු වැළැක්වීමේ ක්‍රියාමාර්ග.

රිය අනතුරු වැළැක්වීම සඳහා නිලධරයන් මාර්ග ආශ්‍රිතව රාජකාරි වල නියුක්ත කිරීමට අමතරව දැණුවත් කිරීමේ ක්‍රියාමාර්ග ද ශ්‍රී ලංකා පොලීසිය විසින් අනුගමනය කරනු ලබයි. එහිදී මාර්ගය භාවිතා කරන සමාජයේ විවිධ පාර්ශ්වයන් දැනුවත් කිරීම ඉතා වැදගත් පියවරක් ලෙස සැලකේ. ඒ සඳහා දැනුවත් කිරීමේ දේශන, වැඩසටහන් සහ ප්‍රදර්ශන කුටි භාවිතා කරනු ලබයි. පහත වගුව මගින් මේ පිළිබඳ තොරතුරු දක්වා ඇත.

වගු අංක - 21 වර්ෂය තුළ සිදු කළ දැනුවත් කිරීමේ වැඩසටහන්

අනු අංකය	අධ්‍යාපන වැඩසටහන්	මුළු වැඩසටහන් ගණන	සහභාගි වූ ප්‍රමාණය
1	පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම්	24	1223
2	රාජ්‍ය ආයතන නිලධාරීන් දැනුවත් කිරීම	8	395
3	රාජ්‍ය ආයතන දේශන	6	326
4	පුද්ගලික ආයතන දේශන	5	912
5	පුද්ගලික ආයතන රියදුරු දේශන	7	509
6	බස්රථ රියදුරන් දැනුවත් කිරීම	11	1301
7	ත්‍රීරෝද රථ රියදුරන් දැනුවත් කිරීම	1	90
8	යතුරුපැදි කරුවන් දැනුවත් කිරීම	4	339
9	වෙනත් රියදුරන් දැනුවත් කිරීම	2	273
10	රථවාහන සංදර්ශන	7	3290
11	මූලස්ථාන පාඨමාලා වෙනත්	4	201
12	ජ්‍යෙෂ්ඨ රථවාහන කලමනාකරණ පාඨමාලා	1	136
13	කණිෂ්ඨ රථවාහන කලමනාකරණ පාඨමාලා	1	81
14	ගුවන් හමුදා නිලධාරීන් දැනුවත් කිරීම	2	76
15	නාවික හමුදා නිලධාරීන් දැනුවත් කිරීම	1	45
16	මාධ්‍ය වැඩසටහන්	5	
17	ප්‍රදර්ශන කුටි	2	10000 ට වැඩි
18	පාසල් දේශන	21	1127
19	රිය නියාමක දේශන	19	1635

මූලාශ්‍රය - රථ වාහන පොලිස් මූලස්ථානය

2.4.3. රථවාහන වැරදි සඳහා දඩපත් මගින් සහ අධිකරණයෙන් උපයා දෙනලද ආදායම.

වගු අංකය - 22

දඩපත් ආදායම්

වරද		අනාවරණය කළ නඩු සංඛ්‍යාව	දඩපත් නිකුත් කළ සඛ්‍යාව	දඩපත් වලින් ලැබූ ආදායම	අධිකරණය මගින් ලැබූ ආදායම
1	අනතුරුදායක හා අපරික්ෂාකාරී ලෙස රිය පැදවීම	8296	0	0	80,320,720.00
2	අධික වේගයෙන් රිය පැදවීම	10832	10011	28,235,800.00	14,817,050.00
3	බීමත්ව රිය පැදවීම	25038	0		621,818,255.00
4	පහන් නැති මෝටර් වාහන	117946	43728	43,124,000.00	3,890,500.00
5	මාර්ග නීති උල්ලංඝනය කිරීම	87851	80671	141,236,300.00	9,178,300.00
6	ප්‍රවීණතා සහතික නොමැතිව රිය ධාවනය	25969	10711	12,822,000.00	261,849,050.00
7	කළුදුම් සහිත ධාවනය	530	265	138,000.00	7,542,500.00
8	ආරක්ෂක හිස් වැසුම් නොමැතිව පැදවීම	203586	191899		6,803,000.00
9	රතු එළියට විරුද්ධව ධාවනය	55107	48699	49,108,600.00	722,500.00
10	පදික මාරුවේ නොනැවැත්වීම	30030	27942	28,792,500.00	2,269,200.00
11	රක්ෂණ සහතික නොමැතිව පැදවීම	78039	0	0	63,492,700.00
12	හඳුනාගැනීමේ තහඩු පිළිබඳ වැරදි	12791	9159	9,237,800.00	1,143,500.00
13	ආදායම් බලපත්‍ර නොමැතිව පැදවීම	93596	77744	76,877,250.00	18,878,800.00
14	මෝටර් වාහන නැවැත්වීමේ වැරදි	77912	72889	79,588,500.00	1,688,600.00
15	මාර්ගයේ පාවිච්චියට නුසුදුසු වාහන	413	118	124,000.00	214,000.00
16	පොලිස් සංඥා සහ විධාන නොපිලිපැදීම	9124	8093	16,613,950.00	3,724,000.00
17	අන්තරාදායක ලෙස භාණ්ඩ පැටවීම හා ප්‍රවාහනය	2861	2377	1,714,600.00	653,000.00
18	වංචා සහගත ලෙස අංක තහඩු ආදායම් බලපත්‍ර හා වෙනත් ලේඛන පාවිච්චි කිරීම	132	79	102,000.00	848,500.00
19	වෙනත් වැරදි	760562	582046	598,986,230.00	158,434,644.00
මුළු එකතුව		**1600615**	**1166898**	**1,296,617,530.00**	**1,258,288,819.00**

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

2.5 වෙනත් මහජන සේවාවන්.

ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රමුඛතම කාර්යභාරයට අමතරව මහජනතාව වෙත ලබා දෙන විශේෂිත සේවාවන්ද දක්නට ලැබේ. ඒ යටතේ මහජන පැමිණිලි සෘජුවම පොලිස් මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීමේ සේවාවන් ද, 119 හදිසි ඇමතුම් සේවාවද මහජනතාව වෙත නිෂ්කාශන වාර්තා නිකුත් කිරීමේ සේවාව ද, පොලිස් කටයුතු සඳහා මහජන සහය සෘජුවම ලබා ගැනීමේ ප්‍රජා පොලිස් සේවාවද දැක්විය හැකිය. මීට අමතරව විවිධ විරෝධතා ව්‍යාපාර සහ මහජන කැළඹිලි පවතින අවස්ථා වල පොදු ජනතාවගේ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමේ කැරළි මර්දන සේවාවන්ද ක්‍රියාත්මක කරනු ලබයි.

2.5.1 මහජන පැමිණිළි විසඳීමේ විශේෂිත සේවා.

මහජන පැමිණිළි විසඳීම වඩාත් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා මහජන පැමිණිලි භාර ගැනීමේ සහ විසඳීමේ සේවාවන් පළාත් මට්ටමින් සහ පොලිස් මූලස්ථානය ආශ්‍රිතව ක්‍රියාත්මක වේ. මේ තුළින් ජනතාවට සිය පැමිණිලි සෘජුවම පොලිස්පතිවරයාට හෝ වෙනත් ඉහළ පොලිස් නිලධාරියෙකුට යොමු කොට සහනයක් ලබා ගත හැකිය. මෙම සේවාව සඳහා ලද මහජන පැමිණිළි පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු පහත වගුව මගින් දක්වා ඇත.

වගු අංක - 23 **වාර්තා වූ මහජන පැමිණිළි**

අ. අ.	පැමිණිලි වර්ගය	2020				2021				2022			
		වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව	විසඳූ පැමිණිලි සංඛ්‍යාව	විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව	විසඳූ පැමිණිලි සංඛ්‍යාව	විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව	විසඳීමේ ප්‍රතිශතය	වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව	විසඳූ පැමිණිලි සංඛ්‍යාව	විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව	විසඳීමේ ප්‍රතිශතය
1	පොලිස්පති මහජන සහන දිනය	315	280	35	89%	16	7	9	44%	33	17	16	52%
2	පොලිස් නිලධාරීන් ගේ සහන දිනය	2050	2050	0	100%	2900	2893	7	100%	3091	2893	198	94%
3	"පොලිස්පති ට කියන්න" වැඩසටහන	2908	2046	862	70%	3432	1841	1591	54%	2750	1290	1460	47%
4	මහජන සහන මැදිරිය	1725	1086	639	63%	2095	1282	813	61%	2110	876	1234	42%
එකතුව		**6998**	**5462**	**1536**	**78%**	**8443**	**6023**	**2420**	**71%**	**7984**	**5076**	**2908**	**64%**

මූලාශ්‍රය - පොලිස් මූලස්ථානය

පොලිස්පති මහජන සහන දිනය සඳහා මහජනතාවට පෞද්ගලිකව සහභාගි වී සිය ගැටළු ඉදිරිපත් කළහැකි අතර පසුගිය කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ජනතාව සහභාගි කර ගැනීම සෞඛ්‍ය හේතූන් මත අත්හිටුවීමට සිදු විය. ඒ අනුව දිගින් දිගටම පොලිස්පති මහජන සහන දිනය සඳහා ලැබෙන පැමිණිළි වල අඩු වීමක් වගුවේ දත්ත අනුව දක්නට ඇත. කෙසේ උවද 2021 වසරේ පැමිණිළි 16 ක් වාර්තා වූ අතර 2022 වසරේ එම ප්‍රමාණය 33 ක් දක්වා 106% ක ඉහළ යාමක් දැකිය හැකිය. විසඳීමේ ප්‍රතිශතය 2022 වසරේ 52%කි.

පොලිස් නිලධාරීන්ගේ සහන දිනය සඳහා ලැබෙන පැමිණිළි වල ඉහල යාමක් වගුවෙහි සඳහන් වසර තුනෙහි දක්නට ඇත. 2021 වසරේ ලද පැමිණිළි සංඛ්‍යාව 2900ක් වූ අතර, 2022 වසරේ 3091ක් දක්වා 7% කින් ඉහළ ගොස් ඇත. මෙම පැමිණිළි වල විසඳීමේ ප්‍රතිශතය 94% ක් වැනි ඉහළ මට්ටමක පවතී.

අන්තර්ජාලය ඔස්සේ පැමිණිලි ඉදිරිපත් කිරීම දිරිමත් කිරීම හේතුවෙන් ‘‘පොලිස්පතිට කියන්න’’ වැඩසටහනට ලද පැමිණිලි වල ඉහළ යාමක් වගුවේ දත්ත වලට අනුව දක්නට හැකිය. කෙසේ උවද 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ පැමිණිළි 3432 සිට 2750ක් දක්වා 20% ක පහළ යාමක් හඳුනාගත හැකිය. 2022 වසරේ විසඳීමේ ප්‍රතිශතය 47% ක් වැනි අඩු මට්ටමක පවතී.

මහජන සහන මැදිරිය සඳහා ලද පැමිණිලි සළකා බැලීමේදී වගුවෙහි සඳහන් වසර තුනෙහිම සුළු ඉහළ යාමක් දක්නට ලැබේ. 2021 වසරේ ලද පැමිණිලි සංඛ්‍යාව 2095කි. 2022 වසරේ එම සංඛ්‍යාව 2110ක් දක්වා 1% කින් ඉහළ ගොස් ඇත. මෙම පැමිණිළි වලද විසඳීමේ ප්‍රතිශතය 42% ක් වැනි අඩු මට්ටමක පවතී.

සමස්ථයක් ලෙස මෙම විශේෂිත සේවාවන් සඳහා ලද පැමිණිළි වල යම් අඩු වීමක් 2022 වසරේ දක්නට ලැබේ. ඒ අනුව 2021 වසරේ වාර්තා වූ සමස්ථ පැමිණිළි 8443 ට සාපේක්ෂව 2022 වසරේ 7984 ක් දක්වා 5% ක අඩුවීමක් හඳුනාගත හැකිය. සමස්ථ විසඳීමේ ප්‍රතිශතය 2022 වසරේ 64% කි.

- **119 හදිසි ඇමතුම් සේවාව.**

119 පොලිස් හදිසි ඇමතුම් සේවාව මහජනතාව අතර ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ සේවාවක් ලෙස දැක්විය හැකිය. මෙම සේවාව සඳහා ලැබෙන පැමිණිලි සංඛ්‍යාත්මකව ඉතා ඉහළ අගයක් ගනී. එම පැමිණිලි ලද වහාම අදාළ පොලිස් ස්ථානය වෙත බැහැර කරනු ලබන අතර අදාළ පොලිස් ස්ථානය මගින් කඩිනමින් විමර්ශන ආරම්භ කරනු ලැබේ.

වගු අංක - 24 **119 වෙත වාර්තා වූ පැමිණිළි**

වර්ෂය	වාර්තා වූ පැමිණිළි සංඛ්‍යාව	බැහැර කළ පැමිණිළි සංඛ්‍යාව
2020	1,232,272	1,232,272
2021	1,073,917	1,073,917
2022	962642	962642

මූලාශ්‍රය - පොලිස්පති අණදෙන තොරතුරු කොට්ඨාසය

2020 වසරේ මෙම 119 හදිසි ඇමතුම් සේවාව සඳහා පැමිණිළි 1,232,272 ක් ලැබී තිබූ අතර 2021 වසරේ එම සංඛ්‍යාව 1,073,917 ක් දක්වා 2020 වසරට සාපේක්ෂව 13% කින් පහළ ගොස් ඇත. 2022 වසරේ ලද පැමිණිළි සංඛ්‍යාව 962642 ක් වූ අතර එය 2021 වසරට සාපේක්ෂව 10% ක පහළ යාමකි. වසර තුනෙහිම ලද සියළුම පැමිණිලි අදාළ පොලිස් ස්ථාන වෙත ක්ෂණිකව යොමු කර විමර්ශන කටයුතු සඳහා සහාය ලබා දී ඇත.

2.5.2 නිෂ්කාශන වාර්තා.

දේශීය හා විදේශීය නිෂ්කාශන අයදුම්පත් සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම ශ්‍රී ලංකා පොලීසිය විසින් සිදුකරනු ලබන ඉතා වැදගත් කාර්යයක් ලෙස සැළකේ. 2022 වසරේ නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම සම්බන්ධ ප්‍රගතිය පහත වගුව මගින් දක්වා ඇත.

වගු අංක - 25 **නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම.**

අයදුම්පත් වර්ගය	ලද අයදුම්පත් ප්‍රමාණය	නිකුත් කළ වාර්තා ප්‍රමාණය	විසඳීමේ ප්‍රතිශතය	නිකුත් කිරීමට ඇති වාර්තා ප්‍රමාණය	ලද මුදල (රුපියල්)
දේශීය නිෂ්කාශන වාර්තා (Online)	156580	151974	97%	4606	234870000
විදේශීය නිෂ්කාශන වාර්තා (තානාපති කාර්යාල මගින්)	425	375	88%	50	637500
එකතුව	**157005**	**152349**	**97%**	**4656**	**235507500**

මූලාශ්‍රය - පොලිස් මූලස්ථානය

වගුවෙහි දත්ත වලට අනුව 2022 වසරේ ශ්‍රී ලංකා පොලීසිය වෙත දේශීය නිෂ්කාශන වාර්තා සඳහා අයදුම්පත් 156580 ක් ලැබී තිබූ අතර ඉන් අයදුම්පත් 151974 ක් සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කර ඇත. ප්‍රතිශතයක් ලෙස එය 97% කි.

වගුවට අනුව විදේශීය නිෂ්කාශන වාර්තා අයදුම්පත් 425 ක් ලැබී තිබූ අතර ඒ සඳහා නිකුත් කළ වාර්තා ප්‍රමාණය 375 කි. ප්‍රතිශතයක් ලෙස 88% කි. ඒ අනුව ලද සමස්ථ අයදුම්පත් ප්‍රමාණය සඳහා වාර්තා නිකුත් කිරීම 97% ක ප්‍රතිශතයකි. නිෂ්කාශන වාර්තා මගින් උපයාගෙන ඇති ආදායම රු.235,507,500.00 ක් එනම් රුපියල් මිලියන 235 කට අධික මුදලකි.

2.5.3 ප්‍රජා පොලිස් සේවය.

2022 වසරේ ප්‍රජා පොලිස් කමිටු පැවැත්වීම සම්බන්ධයෙන් වගුවෙහි ඇතුළත් තොරතුරු අනුව පොලිස් ස්ථාන 607 කට අදාළ දත්ත පහතින් ඉදිරිපත් කර ඇත.

වගු අංක - 26 **ප්‍රජා පොලිස් කමිටු පැවැත්වීම.**

අනු අංකය	කොට්ඨාස සංඛ්‍යාව	පිහිටුවා ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව	පිහිටුවා ඇති කමිටු සංඛ්‍යාව	පැවැත්විය යුතු කමිටු සංඛ්‍යාව	පවත්වා ඇති කමිටු සංඛ්‍යාව	සහභාගි වූ සාමාජික සංඛ්‍යාව	ස්ථානාධිපති සහභාගි වීම් ගණන	දිස්ත්‍රික් හාර පො.අ./ස.පො.අ. සහභාගි වීම් ගණන	කොට්ඨාසභාර නිලධාරි සහභාගි වීම් ගණන
2022 වර්ෂයේ ප්‍රජා පොලිස් උපදේශන සභාව පැවැත්වීම									
1	45	602	602	7189	4620	45334	4398	2554	284
2022 වර්ෂයේ ප්‍රජා පොලිස් ස්ථානීය මහජන ආරක්ෂක කමිටු පැවැත්වීම									
2	45	602	602	7188	4523	126477	5920	2289	221
- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවධානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව, සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන ව්‍යදම්

බැඳීම් ප්‍රකාශය සටහන (iv) අනුව වැය විෂයය අංක 225-1-1-0-1204 මගින් වෛද්‍ය සැපයුම් කොට්ඨාශයේ (ඖෂධ මිලදී ගැනීම සඳහා) බැඳීම් හා බැරකම් වටිනාකම රු.15,678,982 ක් වුව ද, එය ඉක්මවා රු.323,489,273 ක් ගෙවා තිබුණි.

1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට අනුව 2022 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂය රු.763,726,013 ක් වුව ද, එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු එකතුව රු.684,016,443 ක් වූයෙන් රු.79,709,570 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් වටිනාකම සහ ACA – 6 අනුව දේපල පිරියත හා උපකරණ වර්ෂය අග වටිනාකම රු.58,202,144,773 ක් වුව ද, මෙම මුළු වත්කම් වටිනාකම සනාථ කරගැනීමට අවශ්‍ය පොලිස් කොට්ඨාශ වාර්තා ඒකාබද්ධ කළ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ව්‍යදම් කළමනාකරණය

මූලධන වැය විෂයයක් සඳහා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 555.95 ප්‍රතිපාදනය කර තිබූ අතර, වර්ෂය තුළ මුදල් රෙගුලාසි 66 මඟින් රු. මිලියන 325 ක් මාරු කරගෙන තිබුණ ද, වර්ෂය අවසානයේ රු.මිලියන 880.95 ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

2.2 හිඟ හිටි ණයශේෂ

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයේ අයවිය හිඟ හිටි තිබුණු නිලධාරීන් 2,720 ක ගෙන් අයවිය යුතු ශේෂවල එකතුව රු.63,242,416 ක් වූ අතර වර්ෂ 05 ට වැඩි හිඟ හිටි ණයශේෂවල එකතුව රු44,875,995 ක් වී තිබුණි.

2.3 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
(අ) 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතන පනතේ V කොටස	'මුදල්' සම්බන්ධ කටයුතුවලට අදාළ "ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අරමුදල" පිහිටුවීම හා පනතේ ඊට අදාළ 22 සිට 28 දක්වා වූ කාර්යයන් හා කර්තව්‍යයන් සිදුව නොතිබුණි.
(ආ) 2009 මැයි 01 දිනැති රාජ්‍ය පරිපාලන වක්‍රලේඛ අංක 11/2009 යෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6.1 වගන්තිය	ගම්පහ පොලිස් කොට්ඨාශයට අයත් රජයේ නිවාස නිලධාරීන්ට ලබා දීමේදී වක්‍රලේඛ විධිවිධාන අනුගමනය කර නොතිබුණි.
(ඇ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් වක්‍රලේඛ අංක 01/2020 ප්‍රකාශයට පත්කර තිබූ නව මුදල් රෙගුලාසි 876 අනුව	වක්‍රලේඛ ප්‍රකාරව පොලිස් ක්‍රීඩා අරමුදල නීතිගත කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 තැන්පතු

2013 වර්ෂයේ දී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු.45, 837,000 ක පරිත්‍යාග මුදලින් ඉතිරිව පවතින රු. 11,503,192 ක මුදලක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන පවතින අතර ඒ සඳහා ඉදිරි වැඩපිළිවෙලක් ද නොවීය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) 1865 අංක 16 දරන පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. සංශෝධන සිදුකළ යුතු ක්ෂේත්‍ර 16 ක් ද හඳුනාගෙන තිබුණි. වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් යාවත්කාලීන කර සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබුණ ද 2023 මැයි මාසය වන විටත් පනත සංශෝධනය වී නොතිබුණි.

(ආ) දඩමුදල් අයකර ගැනීම වේගවත් කිරීමත් රාජ්‍ය ආදායමට එකතුවන දඩ මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමත් මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණින් රථ වාහන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් (Spot Fine Information System) ස්ථාපිත කිරීම සඳහා 2014 වර්ෂයේ සිට සැලසුම් කරමින් පැවතියද මේ දක්වා අදාළ ක්‍රමය ස්ථාපිතව නොතිබුණි.

(ඇ) 2019 අංක 10 දරන මෝටර් වාහන (සංශෝධන) පනත මඟින් හඳුන්වා දුන් මෝටර් රථ වාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අයකිරීමේ ක්‍රමය 2019 ජූනි 20 දින සිට ක්‍රියාත්මක වන නමුත් රථවාහන වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් එකම වරද සිදුකරන වාර ගණන පැහැදිලිව හඳුනාගත හැකි පරිදි තොරතුරු පද්ධතියක් ශ්‍රී ලංකා පොලිසිය ක්‍රියාත්මක නොකිරීම නිසා එකම වරද කිහිප අවස්ථාවක් සිදුකරන වරදකරුවන්ගෙන් නිවැරදි දඩ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

3.1.2 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කළයුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලධාරීන් සඳහා හිස්වැසුම් 75,000 ක් රු.93,455,119 කට මිලදී ගැනීමට 2011 වර්ෂයේ ආරම්භ කර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී, සිදුව තිබූ අවිධිමත් කරුණු නිසා බෙරුම්කරණයේ දී 2017 ජනවාරි 21 දින ලබා දී තිබූ තීන්දුව වූ හිස්වැසුම් 75,000 සඳහා වූ මුදල සහ ඒ සඳහා වන අනෙකුත් ගාස්තු ගෙවීම ශ්‍රී ලංකා පොලිසිය විසින් ප්‍රතික්ෂේප කරමින් අබණ්ඩව අධිකරණ ක්‍රියාමාර්ගයක යෙදී තිබුණි. සැපයුම්කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු හා විනිමය අනුපාත වැඩිවීමේ අවාසියද ශ්‍රී ලංකා පොලිසිය දැරිය යුතු බවට සැපයුම්කරු ඉල්ලා තිබුණි. 2023 ජනවාරි 25 දින වන විට රු. 219,357,715 ක් ගෙවීමට සිදුවෙතැයි ඇස්තමේන්තු කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අවිධිමත්භාවයට හා දීර්ඝ කාලයක් ගතවීමෙන් පසු සමතයකට එකඟවීම යන කරුණු සම්බන්ධයෙන් වගකිවයුත්තන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) හබරාදුව "නිල සෙවන" යෝජනා ක්‍රමයෙන් නිවසක් රු. මිලියන 3.8 බැගින් රු. මිලියන 729.6 කට නිවාස 192 ක් මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2019 අප්‍රේල් 02 දින වන විට රු. මිලියන 500 ක අත්තිකාරම් ගෙවා තිබුණු අතර මෙම නිල නිවාස අවශ්‍යතාවය හා ඉල්ලුම පිළිබඳ නිවැරදි අධ්‍යනයක් සිදු නොකර මිලදී ගැනීමට ගිවිසුම්ගතව තිබුණි. අදාළ පොදු පහසුකම් ද ඇතුළුව නිවාස 192 ක් විධිමත් පරිදි පවරා ගැනීමේ කටයුතු ද 2023 මාර්තු මාසය වන විටත් අවසන්ව නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 ඉඩම් හා ගොඩනැගිලි පවරාගැනීම

(අ) පහත සඳහන් ඉඩම් හා ගොඩනැගිලි ශ්‍රී ලංකා පොලිසියට පවරා ගැනීමේ කටයුතු 2017 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණද 2023 මාර්තු මාසය වන විටත් අවසන්ව නොතිබුණි.

i. පොලිස් අධ්‍යයන ආයතනයක් පිහිටුවීමට යෝජිත අක්කර 12 රූඩ් 01 පර්චස් 08 ක ප්‍රමාණයකින් යුත් මල්වානේ පිහිටි ඉඩම

ii. පොලිස් අශ්වාරෝහක කොට්ඨාශය හා පොලිස් රණවිරු සුරැකුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට යෝජිත අක්කර 75 ක් වූ හොරණ ඇල්ලකන්ද වත්ත ඉඩම

(ආ) ඉංගිරියේ උසස් පුහුණු පොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ වැඩ ආරම්භ කර රු. මිලියන 8.8 ක් වැයකර ඉදිකිරීම් අතරමඟ නවතා තිබුණි. මෙම ඉදිකිරීම් පිහිටි අක්කර 06 ක පමණ භූමියද නිරවුල්ව පවරා ගැනීමක් සිදුවී නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් මස එකක් රු. මිලියන 3.3 බැගින් රු. මිලියන 333 කට ගාල්ල, වැකුණගොඩ "නිල සෙවන" නිවාස ව්‍යාපෘතියෙන් මිලදී ගත් නිවාස 100 ට අදාළ පැවරුම් ඔප්පු 2023 මාර්තු මාසය වන විටත් ලබාගෙන නොතිබුණි.

3.4 පාඩු හා හානි

(අ) පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාශයට අයත් නාරාහේන්පිට පොලිස් රෝහලේ ගබඩාවල පැවති 2018 -2022 කාලපරිච්ඡේදය තුළ කල් ඉකුත් වූ ඖෂධ හා ශල්‍ය උපකරණවල වටිනාකම රු.6,896,457 ක් විය. නිවැරදි තොග පාලන ක්‍රමයක් හා යාවත්කාලීන වූ ගබඩා තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක නොවීම නිසා මෙම කල් ඉකුත්වීම් සිදුව තිබුණි.

(ආ) අලාභ හානි අවස්ථා 42 කට අදාළ රු.33,092,970 ක් වාර්තා වී 2023 මැයි මාසය වන විට වසර 05 ක් ඉක්මවා පැවතියද මේ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ගගෙන නොතිබුණි.

(ඇ) වාහන දෙකකට අදාළව 2016 වර්ෂයේ සිදුව තිබූ අනතුරක අලාභය වූ රු.9,780,583 ක වටිනාකමින් රු.4,818,554 ක් රක්ෂණ වන්දි ලෙස අයවී පැවති බැවින් ඉතිරි අලාභයේ වටිනාකම රු.4,962,029 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම(i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ අයවිය යුතු අලාභයේ වටිනාකම ලෙස රු.7,190,583 ක් දක්වා තිබුණි.

(ඈ) 2005, 2006 යන වර්ෂවල අම්පාර පොලිස් ස්ථානයේ සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේ දී අනාවරනය වූ රු.6,297,306 ක භාණ්ඩ ඌනතාවය මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (i) හී පාඩු හා අත්හැරීම පිළිබඳ ප්‍රකාශනයේ රු.2,725,203 ක් ලෙස දක්වා තිබුණි.

3.5 අනාර්ථික ගනුදෙනු

(අ) අලුතින් ආරම්භ කිරීමට යෝජිතව පැවති මාබෝදල හා රංචල පොලිස් ස්ථාන සඳහා ගොඩනැගිලි දෙකක් කුලියට ලබාගැනීම සඳහා සැලසුම්කර තිබුණද, බදු ගිවිසුමකට එළඹ නොතිබියදී හා ඒ සඳහා දේපළ කළමනාකරණ කොට්ඨාශයේ නිසි අනුමැතියකින් තොරව එම ගොඩනැගිලි දෙකෙහි වැසිකිලියට අදාළ ඉදිකිරීම් කිරීම, තින්ත ආලේප කිරීම හා ගරාජයක් ඉදිකිරීම වැනි කටයුතු සඳහා රු.900,144 ක් ගම්පහ පොලිස් කොට්ඨාශය මගින් වැයකර තිබුණි. පොලිස් ස්ථාන අලුතින් ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය නතර කර ඇති බැවින් මෙම වියදම අනාර්ථික වියදමක් විය.

(ආ) ත්‍රස්ත මර්ධන හා විමර්ශණ කොට්ඨාශය හා අලුතින් පිහිටුවන ලද පොලිස් කොට්ඨාස 04 ක් පවත්වාගෙන යාම සඳහා 2020 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා මසකට රු. 9,775,000 බැගින් රු. 234,600,000 (VAT රහිත) කට කිරුලපන ඇවනියු, කොළඹ 05 ස්ථානයේ පිහිටි භූටානි කැපිටල් ගොඩනැගිල්ල කුලියට ලබාගෙන තිබුණි.

i. 2022 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වසර 02 ක් සඳහා මෙම ගොඩනැගිල්ල මසකට රු. 10,400,000 බැගින් එකතුව රු. 249,600,000 කට නැවත කුලියට ලබාගෙන තිබුණි.

ii. මෙම ගොඩනැගිල්ල සඳහා බාහිර රථ ගාලක් නොමැති අතර මහල් 06 ක් වැනි සැලකිය යුතු ඉඩකඩක් රථ ගාල සඳහා නිර්මාණය කර ඇත. එහි මෝටර් රථ හැර යතුරුපැදි, ත්‍රිරෝද රථ වැනි වාහන නවතා තැබීමට නොහැකි අතර එහි මෝටර් රථ

ඉහළ, පහළ ගෙන යාම සඳහා අධික විදුලි පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. 2023 මාර්තු මාසය වන විට රු. 3,000,000 ක් ඉක්ම වූ මාසික විදුලි පිරිවැයක් මෙම ගොඩනැගිල්ල සඳහා වැය කිරීමට සිදු වී තිබුණි.

3.6 **කලමනාකරණ දුර්වලතා**

(අ) **පොලිස් මධ්‍යම අවි ගබඩාවේ පවතින අඩුපාඩු**

i. මධ්‍යම අවි ගබඩාව, කැරලි මර්ධන ඒකක, පොලිස් විද්‍යාල, කොට්ඨාස හා පොලිස් ස්ථානය යටතේ පවතින අවි ගබඩාවල ලැබීම්, නිකුත් කිරීම්, ආපසු භාරගැනීම් හා තොග මට්ටම් යනාදිය ක්ෂණිකව හඳුනාගත හැකි තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මකව නොපැවතිණි.

ii. භාවිතයට ගත නොහැකි අවි, පතරොම්, කැරලි මර්ධන උපකරණ හා සංග්‍රාමික උපකරණ විශාල ප්‍රමාණයක් විනාශ කරන තෙක් කන්ටේනර් පෙට්ටි 09 ක අවධිමත් හා ගණනය කළ නොහැකි ලෙස ගොඩ ගසා තිබුණි.

iii. බඩු වට්ටෝරු ලේඛනයට අනුව භාවිත කිරීමට නොහැකි C S Tear Gas (shells) උණ්ඩ 4,844 ක් හා C S Tear Gas (Grenades) 4,992 ක් තිබිය යුතු වුව ද, ගබඩාවේ පැවති 1,056 (893 ක් හා 163 ක්) ක ප්‍රමාණය හැර ඉතිරි ප්‍රමාණය පිළිබඳ ලේඛනගත තොරතුරු අසම්පූර්ණ ඒවා විය. කෙසෙල්වත්ත හා නාරාහේන්පිට පොලිස් ස්ථාන දෙකෙහි පැවති Tear Gas 871 ක ප්‍රමාණය 2004, 2005 හා 2012 වර්ෂවල නිෂ්පාදිත ඒවා විය. මේ අනුව කල් ඉකුත් වූ Tear Gas තොග පොලිස් ස්ථාන සතුව පැවති අතර ඒවා නිකුත් කිරීමේ ඉඩකඩක් ද පැවතුණි.

(ආ) රථ වාහන වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ අවසන් වරට මිලදී ගෙන තිබුණේ 2016 වර්ෂයේ දී වූ අතර මිලදී ගත් ප්‍රමාණය 25 ක් පමණක් විය. ඊට පෙර 2014 වර්ෂයේ දී 30 ක් ද, 2010 දී 100 ක් ද, මිලදී ගෙන තිබුණි. මෙම උපකරණ අතරින් ද විශාල ප්‍රමාණයක් වර්තමානය වන විට අක්‍රිය තත්ත්වයේ පැවතුණි. 2018 - 2022 කාල පරිච්ඡේදයේ වාර්ෂිකව වේග මාපක යන්ත්‍ර (Automatic Speed Trap) 500 බැගින් රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව පිළිබඳ කොට්ඨාශය විසින් ඉල්ලුම් කර තිබුණද ඒවා ලැබී නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා පොලිසිය මගින් අධිකරණ වෙත යොමු කෙරෙන අපරාධ හෝ වැරදිවලට අදාළව තවදුරටත් පවත්වාගෙන යන අධිකරණ කටයුතු සම්බන්ධ තොරතුරු, තීන්දු ලබාදුන් නඩු පිළිබඳ විස්තර, බහා තැබීම් හෝ නිශ්ප්‍රභාවීම් වූ නඩු යන විස්තර ඇතුළත් යාවත්කාලීන තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය කැපී පෙනෙන අතර ශ්‍රී ලංකා පොලිසියේ කාර්ය සාධනය පිළිබඳව සමාලෝචනයේ දී එවැනි පද්ධතියක අවශ්‍යතාවය වැදගත්වන නමුත් එවැනි පද්ධතියක් පවතින බව සනාථ නොවීය.

(ඈ) අම්පාර පොලිස් ස්ථානයේ දිසා ගබඩාවේ අබලි භාණ්ඩ ගබඩාකර තිබූ තාවකාලික මඩුව ගින්නෙන් විනාශ වී 2013 වර්ෂයේදී රු.2,760,885 ක අලාභයක් සිදුවී තිබුණි. මෙම අලාභය මුදල් රෙගුලාසි 109 යටතේ කපා හැරීමට නිර්දේශකර තිබුණ ද, පොතෙන් කපා හැරීමට කටයුතු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන තුළ තවදුරටත් පැවතුණි.

4. තිරසර සංවර්ධන

4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටුකිරීමේ ප්‍රගතිය

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පැවති අතර, ශ්‍රී ලංකා පොලිසිය තිරසර සංවර්ධනය අරමුණු 04 ක් යටතේ ඉලක්ක 08 ක් හඳුන්වාගෙන තිබුණි. පාදක වර්ෂය 2016 යොදාගනිමින් දර්ශකයන් ගොඩනැගීම සිදුකරමින් පැවතිය ද, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේ දී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි.

05. මානව සම්පත් කළමනාකරණය කිරීම

පොලිසියේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට නිල ඇදුම් කාර්ය මණ්ඩලය සහායක සේවය හා සිවිල් කාර්ය මණ්ඩලයේ මුළු අනුමත, තථ්‍ය, පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ.

	සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
(i)	ජ්‍යෙෂ්ඨ මට්ටම	917	671	258	12
(ii)	කෘතීයික මට්ටම	4,352	4,472	274	394
(iii)	ද්විතීක මට්ටම	101,611	83,255	18,714	358
(iv)	ප්‍රාථමික මට්ටම	7,147	2,297	5,081	231
	එකතුව	114,027	90,695	24,327	995

දිගු කාලයක සිට නිලධාරීන්ට උසස්වීම් නොලැබීමේ ගැටළුවට විසඳුම් ලෙස පොලිසියේ නිල ඇදුම් කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා 2019 ජනවාරි 01, 2019 ජූලි 01, 2020 ජනවාරි 01 හා 2020 පෙබරවාරි 08 යන දිනවල එක් එක් තනතුරේ අනුමත සංඛ්‍යාව නොසලකා දරන්නාට පුද්ගලික වන සේ උසස්වීම් ලබාදීම නිසා ඉහත පුරප්පාඩු හා අතිරික්ත තත්ත්වය පෙන්නුම් කළ ද, නිල ඇදුම් කාර්ය මණ්ඩලයේ මුළු පුරප්පාඩු සේවක සංඛ්‍යාව 19,334 ක් විය. ඉහත තොරතුරු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොලිස් නිලධාරීන්ට උසස්වීම් ලබාදීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් පොලිස් කොස්තාපල් තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුර දක්වා වූ කාන්තා හා පිරිමි පොලිස් නිලධාරීන්ට සිදුව තිබූ අසාධාරණය ඉවත් කිරීමට 2019 2020 කාල පරිච්ඡේදයේ අවස්ථා 04 කදී පැවති පුරප්පාඩු සංඛ්‍යාව නොසලකා උසස්වීම් ලබා දී තිබුණි. ඒ අනුව නිල ඇදුම් කාර්ය මණ්ඩලයේ 2019.01.01 දින 6,055 ක්ද, 2019.07.01 දින 3,800 ක්ද, 2020.01.01 දින 16,983 ක් හා 2020.02.08 දින 7,413 ක්ද වශයෙන් එකතුව 34,251 කට දරන්නාට පුද්ගලික වන සේ උසස්වීම් ලබා දී තිබුණි. මේ අනුව මෙම ක්‍රමය අබණ්ඩව ක්‍රියාත්මක නොකර අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටී අනුව පුරප්පාඩු සංඛ්‍යාව මත පදනම්ව උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) අනුමත නොවූ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටී.

සහායක සේවයට අයත් විවිධ තනතුරු නාම 110 ක් අනුමතව පැවති අතර එයින් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටී අනුමතව පැවතියේ තනතුරු නාම 34 කට අදාළව පමණි. බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටී මේ දක්වා අනුමත කර නොගත් තනතුරු නාම 76 ක් අතර වෛද්‍ය නිලධාරී - 76 ක්, පශු වෛද්‍ය - 03 ක්, කාර්මික නිලධාරී - 36 ක්, සැලසුම් ශිල්පී - 09 ක්, පරිගණක ක්‍රියාකරු 554 ක්, පරිගණක කාර්මික 25 ක්, හා කාර්මික 329 ක් වැනි වෛද්‍ය, ගොඩනැගිලි, ප්‍රවාහන, අශ්වාරෝහක හා තොරතුරු තාක්ෂණ යනාදී ක්‍රියාකාරී පොලිස් කොට්ඨාශයන්ට අයත් අත්‍යවශ්‍ය තනතුරු ඒ අතර විය.

(ඇ) පොලිස් කොට්ඨාස හා පොලිස් ස්ථානවල අනුමත වූ කාර්ය මණ්ඩලයක් නොතිබීම.

පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථානවල රාජකාරී ස්වභාවය පිළිබඳ අධ්‍යනයකින් පසු නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්ය මණ්ඩලයක් නොතිබීම මත එම කොට්ඨාශය හා පොලිස් ස්ථානවල පුරප්පාඩු පවතී ද, අතිරික්තයක් පවතී ද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ

නොහැකි විය. මෙම තත්ත්වය තුළ කාර්ය මණ්ඩලය ස්ථානගත කිරීම නිසි ක්‍රමවේදයකින් නොරව ක්‍රියාත්මක වී තිබුණි.

(ඇ) ගම්පහ පොලිස් කොට්ඨාශයේ නිල ඇඳුම් කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් 50 ක් අවුරුදු 10 සිට 24 දක්වා කාල පරාසයක් තුළ එකම ස්ථානයේ සේවයේ යෙදී සිටින අතර සිවිල් කාර්ය මණ්ඩලයේ 10 ක් අවුරුදු 10 සිට 17 දක්වා කාල පරාසයක් තුළ එකම ස්ථානයේ සේවයේ යෙදී සිටී.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වගු අංකය - 49 ආයතනයේ කාර්ය සාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% 90%	75% - 89%	50% - 74%
අපරාධ විසඳීමේ ප්‍රතිශතය		76%	
විශේෂ කාර්ය බලකාය දායකත්වය සැපයූ වැටලීම් ගණන	95%		
ක්‍රියාකාරී සිවිල් ආරක්ෂක කමිටු හා ක්‍රියාත්මක කළ දැනුවත් කිරීම් වැඩසටහන් ගණන			58%

මූලාශ්‍රය- පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

පරිච්ඡේදය 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු.

වගු අංක - 50

අරමුණු	ඉලක්කය	ජයග්‍රහණ දර්ශකය	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
03.නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේ ම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම	**3.4** 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදු වන අකල් මරණ, ප්‍රතිකාර මගින් වළක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධන කිරීම	**3.4.2** සියදිවි නසා ගැනීමේ මරණ අනුපාතය (සම්පූර්ණ ජනගහණය මත පදනම්ව)	15%		
	3.6 2030 වන විට මහාමාර්ගවල සිදු වන අනතුරු වලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව	**3.6.1** පසුගිය මාස 12ක කාල සීමාව තුළ මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ සංඛ්‍යාව (අනුපාතය)	11%		
08. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	**8.7** බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම	**8.7.1** අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදාගෙන ඇති සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස අනුව	**0.07%**		

16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගවීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම	**16.1** 2030 වන විට විශේෂයෙන්ම කාන්තාවන්ට සහ ළමුන්ට, වයස්ගත පුද්ගලයින්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ආරක්ෂාකාරී වන, සියලු දෙනාටම එක්ව සලකන සහ පහසුවෙන් පිවිසිය හැකි පොදු හරිත අවකාශයන් ලබා දීම	**16.1.1** පසුගිය මාස 12ක කාල සිමාව තුළ වාර්තා වී ඇති රටේ ජනගහනයන් පුද්ගලයන් 100000කට චේතනාන්විත මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය හා වයස අනුව	3%		
		16.1.2 පසුගිය මාස 12ක කාල සිමාව තුළ වාර්තා වී ඇති ජනගහනයන් පුද්ගලයන් 100000කට ගැටුම් හා සම්බන්ධ හේතු නිසා සිදුවන මරණ සංඛ්‍යාව,ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ සිදු වීම සිදු වූ කොට්ඨාස අනුව			
		16.1.3 පසුගිය මාස 12ක කාල සිමාව තුළ වාර්තා වී ඇති කායික, මානසික හෝ ලිංගික හිංසනයට ගොදුරු වූ විත්දිතයන්ගේ සංඛ්‍යාව ජනගහණයට අනුපාතය	27%		
	16.2 ළමුන් කෲර වධහිංසා කිරීම්වලට සහ අපයෝජනයට, සූරාකෑමට, කුට්ටනයට සහ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට ලක් වීම අවසන් කිරීම	**16.2.1** පසුගිය මාස 12ක කාල සිමාව තුළ වාර්තා වී ඇති භාරකරුවන්/ රැකවලුන් /මෙහෙකරුවන් අතින් කායික දඩුවම් හෝ මානසික ප්‍රචණ්ඩත්වයන් අත්විඳීමට සිදු වූ වයස අවු 1 -17 දක්වා වන ළමුන්ගේ සංඛ්‍යාව			
		16.2.2 පසුගිය මාස 12ක කාල සිමාව තුළ වාර්තා වී ඇති ජනගහනයේ පුද්ගලයන් 100000ක් අතරින් මිනිස් ජාවාරමෙහි ගොදුරු බවට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය හා වයස සහ අපයෝජනයේ ස්වරූපය අනුව	0.04%		

		16.2.3 පසුගිය මාස 12ක කාල සීමාව තුළ වාර්තා වී ඇති වයස අවු 18 වන විට ලිංගික හිංසනය අත්විඳ ඇති වයස අවු 18-29 වයස් කාණ්ඩයේ තරුණ කාන්තාවන් සහ පිරිමින්ගේ සංඛ්‍යාව (ජනගහනයට අනුපාතය)			
	16.3 සියලුම දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටම්න් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම	**16.3.3** ජනගහනයට සාපේක්ෂව: i. ලංකා පොලිසිය විසින් ම පසුගිය මාස 12ක කාල සීමාව ඇතුළත විසඳන ලද ආරවුල් සංඛ්‍යාව ii. සමථ මූල මණ්ඩල මගින් පසුගිය මාස 12ක කාල සීමාව ඇතුළත විසඳන ලද ආරවුල් සංඛ්‍යාව			
	16.4 2030 වන විට නීති විරෝධී මූල්‍ය සහ ආයුධ ප්‍රවාහයන් කැපී පෙනෙන ලෙස අඩු කිරීම, සොරකම් කරන ලද වත්කම් නැවත ලබා ගැනීම ශක්තිමත් කිරීම සහ සියලුම ආකාරයේ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීම	**16.4.2** පසුගිය මාස 12ක කාලය තුළ වාර්තා වී ඇති ජාත්‍යන්තර ප්‍රමිතිය / ක්‍රියාදාමයට අනුකූලව නිසි බලධාරියෙකු විසින් නීති විරෝධී සම්භවය හෝ පසුබිම සොයා ගැනීම හෝ ස්ථාපිත කර ඇති අත් අඩංගුවට ගත්, සොයා ගත් හෝ භාර දුන් ආයුධවලට අදාළ සිද්ධි සංඛ්‍යාව හා එයට අදාළ ආයුධ සංඛ්‍යාව			
	16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තින්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම	**16.10.1** පසුගිය මාස 12 තුළ වාර්තා වී ඇති මාධ්‍යවේදීන්, මාධ්‍යවේදි ආශ්‍රිතයන්, වෘත්තීය සමිති සාමාජිකයින් සහ මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින්නන් ඝාතනය කිරීම, පැහැරගෙන යාම, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම, අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම සහ වධහිංසා පැමිණවීම් පිළිබඳ සත්‍යාපිත සිද්ධීන් සංඛ්‍යාව	**0**		

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය.

වගු අංක - 51 විවිධ මට්ටම් අනුව **2022.12.31** දිනට - සාමාන්‍ය පොලිස් සේවයේ සේවක සංඛ්‍යාව

A	B	C	D	E	F
				B–C = E	B-C-D= F
සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව		පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
		අනුමත සංඛ්‍යාව තුළ	අධිසේවක පදනම මත		
ජ්‍යෙෂ්ඨ මට්ටම	742	607	0	135	0
තෘතියික මට්ටම	3811	2325	1880	1486	394
ද්විතික මට්ටම	97544	66486	13846	31058	0
ප්‍රාථමික මට්ටම	0	0	0	0	0
එකතුව	**102097**	**69418**	**15726**	**32679**	**394**
	102097	**85144**		**16953**	

***තෘතීයික සහ ද්විතික මට්ටමේ තනතුරුවලට අදාලව පුරප්පාඩු ගණනය කිරීමේදී දරන්නාට පුද්ගලික වන සේ උසස් කර ඇති නිලධරයන් සංඛ්‍යාව ඉවත් කර පුරප්පාඩු ගණනය කර ඇත.**

සැ.යු :- තෘතියික සහ ද්විතීක මට්ටමේ තනතුරුවලට 2019.01.01, 2019.07.01, 2020.01.01 හා 2020.02.08 දිනට එක් එක් තනතුරේ අනුමත සංඛ්‍යාව නොසළකා දරන්නාට පුද්ගලික වන සේ උසස් වීම් ලබා දී ඇත. එබැවින් ශ්‍රී ලංකා පොලිසියේ සියළුම තනතුරුවල අනුමත සංඛ්‍යාව 102097 වන හෙයින් අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි අවසන් පුරප්පාඩු 16953 ක සංඛ්‍යාවට පමණක් නව බඳවා ගැනීම් ලෙස සිදු කළ යුතුවේ.

මූලාශ්‍රය - පොලිස් මානව සම්පත් කළමණාකරණ කොට්ඨාසය

වගු අංක - 52 විවිධ මට්ටම් අනුව **2022.12.31** දිනට - සහායක සේවයේ සේවක සංඛ්‍යාව

A	B	C	D	E
			B-C=D	
සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	104	7	97	**0**
තෘතියික මට්ටම	534	266	268	**0**
ද්විතික මට්ටම	2296	999	1297	**0**
ප්‍රාථමික මට්ටම	**0**	**0**	**0**	**0**
එකතුව	**2934**	**1272**	**1662**	**0**

මූලාශ්‍රය - පොලිස් මානව සම්පත් කළමණාකරණ කොට්ඨාසය

වගු අංක - 53 විවිධ මට්ටම් අනුව **2022.12.31** දිනට - විශේෂ කාර්ය බලකායේ සේවක සංඛ්‍යාව

A	B	C		D	E	F
					B-C=E	B-C-D=F
සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව			පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
		අනුමත සංඛ්‍යාව තුළ		දරන්නාට පුද්ගලික වන සේ		
ජ්‍යෙෂ්ඨ මට්ටම	68	54		0	14	0
තෘතියික මට්ටම	346	294		114	52	62
ද්විතික මට්ටම	10329	7689		121	2640	0
ප්‍රාථමික මට්ටම	**0**	**0**		**0**	0	0
එකතුව	**10743**	**8037**		**235**	**2706**	**62**
	10743	**8272**			**2471**	

*** තෘතීයික මට්ටමේ සහ ද්විතික මට්ටමේ තනතුරු වලට අදාලව පුරප්පාඩු ගණනය කිරීමේදී දරන්නාට පුද්ගලික වන සේ උසස් කර ඇති නිලධාරීන් ඉවත් කර ගණනය කර ඇත.**

සැ.යු :- තෘතියික හා ද්විතීක මට්ටමේ තනතුරුවලට **2019.01.01, 2019.07.01** හා **2020.01.01** දිනට එක් එක් තනතුරේ අනුමත සංඛ්‍යාව නොසළකා දරන්නාට පුද්ගලික වන සේ උසස් වීම් ලබා දී ඇත. එබැවින් විශේෂ කාර්ය බලකායේ සියළුම තනතුරුවල අනුමත සංඛ්‍යාව **10743** වන හෙයින් අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි අවසන් පුරප්පාඩු **2471** ක සංඛ්‍යාවට පමණක් නව බදවා ගැනීම් ලෙස සිදු කල යුතු වේ.

මූලාශ්‍රය - පොලිස් මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය

- **සිවිල් කාර්ය මණ්ඩලය (දෙපාර්තමේන්තුගත නොවන නිලධරයන්)**

වගු අංක - **54**

අනු අංකය	තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු
1	ශ්‍රී ලංකා පරිපාලන සේවය I - අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන)	1	1	0
2	ශ්‍රී ලංකා පරිපාලන සේවය II/III නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන)	2	1	1
3	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I - ප්‍රධාන ගණකාධිකාරි	7	7	0
4	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය I - ප්‍රධාන අභ්‍යන්තර විගණන	1	1	0
5	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය III - සහකාර අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)	1	0	1
6	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය III - ගණකාධිකාරී	54	45	9
7	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය - ඉංජිනේරු	1	0	1
8	ශ්‍රී ලංකා වෛද්‍ය සේවය - වෛද්‍ය නිලධාරී	2	0	2
9	කළමනාකරණ සේවා නිලධාරී සේවය අධිශ්‍රේණිය - පරිපාලන නිලධාරී	11	6	5
10	භාෂා පරිවර්ථක සේවය - භාෂා පරිවර්ථක	6	5	1
11	කළමනාකරණ සේවා නිලධාරී සේවය I/II/III - කළමනාකරණ සේවා නිලධාරී	1639	1456	183
12	කාර්යාල සේවක සේවය I/II/III - කාර්යාල සේවක සේවය	1706	1491	215
13	සංවර්ධන නිලධාරී සේවය III - සංවර්ධන නිලධාරී	0	103	0
14	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර සේවය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	3	2	1
එකතුව	**එකතුව**	**3434**	**3118**	**419**

මූලාශ්‍රය - සිවිල් පරිපාලන අධ්‍යක්ෂ / පොලිස් මූලස්ථානය

- **සිවිල් කාර්ය මණ්ඩලය (දෙපාර්තමේන්තුගත නිලධරයන්)**

වගු අංක - 55

	තනතුර	අනුමත	තථ්‍ය	පුරප්පාඩු
1	අපරාධ විද්‍යාඥ	1	1	0
2	පර්යේෂණ නිලධාරී	1	1	0
3	සංවර්ධන සහකාර නිලධාරී	117	96	21
4	සිවිල් සහායක	0	255	0
5	ප්‍රවෘත්ති සංස්කාරක	2	2	0
6	ස්ථාන කම්කරු	503	405	98
7	අස්ගොව්	55	53	2
8	අලි බලන්නා	2	2	0
9	උපස්ථායක/ උපස්ථායිකා	183	89	94
10	පොලිස් ආරක්ෂක සහායක	0	219	0
11	අරක්කැමි	1169	5	1164
12	මුළුතැන්ගෙයි සහයක	1169	21	1148
13	විදුලි කාර්මික (මෝටර් රථ)	42	0	42
14	මෝටර් කාර්මික	210	0	210
15	පෑස්සුම් කාර්මික	22	0	22
16	ඉංජෙක්ටර් පොම්ප කාර්මික	10	0	10
17	බැටරි කාර්මික	12	0	12
18	සේවා කාර්මික	32	0	32
19	පින්තාරු කාර්මික	22	0	22
20	යතුරුපැදි කාර්මික	40	0	40
21	ටින්කර් කාර්මික	70	0	70
22	දුරකථන හා අභ්‍යන්තර පද්ධති අළුත්වැඩියාකරු	10	0	10
23	ගෑස් වෑල්ඩින්කරු	2	0	2
24	පින්තාරුකරු	34	0	34
25	වඩු කාර්මික	344	0	344
26	පෙදරේරු	344	0	344
27	විදුලි කාර්මික (ගෘහස්ථ)	225	0	225
28	ජලනල කාර්මික	182	0	182
29	කරණවෑමි	503	0	503
30	උද්‍යාන පාලක	27	0	27
31	වේටර්	217	0	217
32	ටයර් මාරුකරන්නා	12	0	12
33	අනියම් / තාවකාලික කම්කරු	0	12	0
එකතුව		**5562**	**1161**	**4887**

මූලාශ්‍රය - සිවිල් පරිපාලන අධ්‍යක්ෂ / පොලිස් මූලස්ථානය

6.2 ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලබන ආකාරය.

ශ්‍රී ලංකා පොලිස් සේවයේ මානව සම්පත් අතිරික්තයක් නොපවතින අතර, එහි හිඟයක් පවතින බැවින්, මානව සම්පත් හිඟය කාර්ය සාධනයට පහත ආකාරයට බලපෑම් සිදු කරනු ලබයි.

i. එක් එක් විෂය පථයට අදාල රාජකාරි සඳහා යෙදවීමට ප්‍රමාණවත් නිලධරයන් පිරිසක් නොමැති බැවින්, එක් නිලධරයෙකුගෙන් සේවයේ අවශ්‍යතාවය මත බහුවිධ රාජකාරි ඉටු කර ගැනීමට සිදුවේ.

ii. එක් එක් අංශයන්හි රාජකාරි වලට අදාල පාඨමාලාවන් හදාරා සිටින විවිධ දක්ෂතාවයන් ඇති නිලධරයන් සිටියද, ඔවුන් හට වෙනත් අංශයන්ට අදාල අධික රාජකාරි ප්‍රමාණයක් ඉටු කිරීමට සිදුවීම තුළින් ඇති වන මානසික පීඩනය මත ඔවුන්ගෙන් වඩාත් ඵලදායී රාජකාරියක් ඉටු කරවා ගැනීමට ඇති හැකියාව අවම වීම.

iii. මානසික පීඩනයට ලක් විය හැකි එම නිලධරයන්ගෙන් සමාජයට ගම්‍ය වන පණිවුඩය මඟින් නවක නිලධරයන් බඳවා ගැනීමේදී පොලිස් සේවයට එක් වන ප්‍රමාණය අඩුවීමේ හා ඔවුන් ඒ සඳහා මැළිකමක් දැක්වීමේ ඉඩකඩක් පැවතීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

වගු අංක - 56 **පොලිස් විදුහල මඟින් සිදු කරන ලද පුහුණු වැඩ සටහන්**

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (මාස)	සමස්ථ ආයෝජනය (රු. 000)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම.
				දේශීය	විදේශීය		
1	ආධුනික පොලිස් කොස්තාපල් පාඨමාලා	3478	මාස 06 යි			දේශීය	මනා ලෙස පුහුණුව ලත් පොලිස් නිලධරයන් බිහිවීම
2	ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් පාඨමාලා	610	මාස 06 යි			දේශීය	මනා ලෙස පුහුණුව ලත් පොලිස් නිලධරයන් බිහිවීම
3	ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු පාඨමාලා	205	මාස 06 යි			දේශීය	මනා ලෙස රිය පැදවීමට පුහුණුව ලත් නිලධරයන් බිහිවීම
4	කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ මූලික පරිගණක පුහුණු පාඨමාලා	131	දින 05 යි			දේශීය	නවීන පරිගණක දැනුම ලත් නිලධාරියකු බිහිවීම
5	ආධුනික නිලධාරීන් සඳහා මූලික පරිගණක පුහුණු පාඨමාලා	706	දින 05 යි			දේශීය	නවීන පරිගණක දැනුම ලත් නිලධාරියකු බිහිවීම
6	පුහුණු කරන්නන් පුහුණු කිරීමේ පාඨමාලා	270	දින 10 යි			දේශීය	මනා දැනුම ඇති උපදේශකයන් බිහිවීම
7	පොලිස් සැරයන් තනතුරට උසස්වීම් ලද නිලධාරීන් තනතුරට හැඩගැස්වීමේ පුහුණු පාඨමාලා	3255	මාස 01 යි			දේශීය	නිලධාරීන්ගේ තනතුරට අදාළව නීතිය හා පෙළපාලි දැනුම වර්ධනය වීම
8	ධාරිතා සංවර්ධන පාඨමාලා	692	මාස 01 යි			දේශීය	දැනුම යාවත්කාලීන වීම
9	අවි පරිහරණ පාඨමාලා	30	සති 01 යි			දේශීය	අවි හා උණ්ඩ පරිහරණය හා ගබඩා කිරීම පිළිබඳ දැනුම වර්ධනය වීම

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (මාස)	සමස්ථ ආයෝජනය (රු. 000)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම.
				දේශීය	විදේශීය		
10	සොකෝ පාඨමාලා	21	සති 21 යි			දේශීය	අදාළ ක්ෂේත්‍රෙය් විද්‍යාත්මක දැනුම වර්ධනය වීම
11	ආධුනික උ.පො.ප. පුහුණු පාඨමාලා	167	මාස 09 යි			දේශීය	මනා ලෙස පුහුණුව ලත් පරීක්ෂක ශ්‍රේණියේ පොලිස් නිලධරයන් බිහිවීම
12	ආධුනික කා.උ.පො.ප. පුහුණු පාඨමාලා	22	මාස 09 යි			දේශීය	මනා ලෙස පුහුණුව ලත් පරීක්ෂක ශ්‍රේණියේ පොලිස් නිලධරයන් බිහිවීම

මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය

වගු අංක - 57 **කටාන පොලිස් අභ්‍යාස ආයතනය මගින් සිදු කරන ලද පුහුණු වැඩ සටහන්**

අනු අංකය	වැඩසටහනේ නම	පවත්වා ඇති පාඨමාලා සංඛ්‍යාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (මාස)	වැඩ සටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	සමස්ථ ආයෝජනය	නිමැවුම/ ලබාගත් දැනුම.
1.	නඩු මෙහෙයුම් පුහුණු පාඨමාලාව	2	56	සති 02	දේශීය	200,000.00	නඩු මෙහෙයවීම පිලිබඳ න්‍යායාත්මක හා ප්‍රා යෝගික දැනුම
2.	මානව සම්පත් කළමණාකරනය පුහුණු පාඨමාලව	2	39	සති 02	දේශීය	200,000.00	මානව සම්පත් කලමනාකරණය පිලිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම
3.	මූලික පරිගණක පුහුණු පාඨමාලාව	5	127	සති 03	දේශීය	300,000.00	පරිගණක භාවිතය සඳහා අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම
4.	ප්‍ර.පො.ප තනතුරට හැඩ ගැස්වීමේ පුහුණු පාඨමාලාව	4	185	සති 03	දේශීය	300,000.00	ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන්ගේ කාර්ය භාරය සහ රාජකාරි වගකීම් පිලිබඳ දැනුම සහ තනතුරට හැඩගැස්වීම
5.	ප්‍ර.පො.ප තනතුරට හැඩ ගැස්වීමේ පුහුණු පාඨමාලාව (මාර්ගගත)	4	231	සති 03	දේශීය	300,000.00	ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන්ගේ කාර්ය භාරය සහ රාජකාරි වගකීම් පිලිබඳ දැනුම සහ තනතුරට හැඩගැස්වීම
6.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පුහුණු පාඨමාලාව	2	64	සති 02	දේශීය	200,000.00	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිලිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම
7.	පුහුණු කරන්නන් පුහුණු කිරීමේ පාඨමාලාව	1	28	සති 02	දේශීය	200,000.00	පුහුණුකරුවන්ගේ කුසලතා වර්ධනය කිරීම
8.	ප්‍රජා උපදේශන මනෝවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලා	1	44	වසර 01 (සති අන්ත)	දේශීය	600,000.00	ප්‍රජා මනෝ උපදේශනය පිලිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම
9.	පොලිස් විද්‍යාව උසස් ඩිප්ලෝමා පාඨමාලාව	1	40	වසර 02 (සති අන්ත)	දේශීය	1,250,000.00	අදාල ක්ෂේත්‍ර වල න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම
	එකතුව	22	814			3,550,000.00	

මූලාශ්‍රය - ජාතික පොලිස් අභ්‍යාස ආයතනය

වගු අංක - 58 **කටාන පොලිස් අභ්‍යාස ආයතන බාහිර පාඨමාලා**

අනු අංකය	පාඨමාලාවේ නම	පවත්වා ඇති පාඨමාලා සංඛ්‍යාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (වසර)	වැඩ සටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	සමස්ථ ආයෝජනය	නිමැවුම / ලබාගත් දැනුම .
1	ළමා අයිතිවාසිකම් හා රැකවරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	1	1	1	දේශීය	88,000.00	ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුම ලබා දීම
2	මාධ්‍යකරණය පිළිබඳ උසස් උපාධි පාඨමාලාව	1	1	2	දේශීය	150,000.00	ජනමාධ්‍ය හැසිරවීම පිළිබඳ දැනුම ලබා දීම .
3	මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	1	1	1	දේශීය	186,000.00	මානව සම්පත් කළමනාකරණය පිළිබඳ දැනුම ලබා දීම .
4	මානව හිමිකම් පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව	1	5	1	දේශීය	607,500.00	මානව හිමිකම් පිළිබඳ දැනුම ලබා දීම.
5	ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව	1	1	1	දේශීය	102,500.00	සිංහල භාෂාව පිළිබඳ දැනුම ලබා දීම .
6	ආර්ථික සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව	1	1	1	දේශීය	102,900.00	ආර්ථික සංවර්ධනය පිළිබඳ දැනුම ලබා දීම
7	අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය උපාධි පාඨමාලාව	1	24	3	දේශීය	18,000,000.00	අපරාධ විද්‍යාව පිළිබඳ දැනුම ලබා දීම.
8	පොලිස් විද්‍යාව උපාධි පාඨමාලාව	1	38	3	දේශීය	19,000,000.00	අපරාධ විද්‍යාව , අපරාධ නීතිය පිළිබඳ දැනුම ලබා දීම .
9	අන්තර්ජාතික සබඳතා හා උපායක්‍රමික කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	1	3	2	දේශීය	540,000.00	අන්තර්ජාතික සබඳතා හා උපායක්‍රමික තළමනාකරණය පිළිබඳ දැනුම ලබා දීම .
10	නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	1	1	1	දේශීය	350,000.00	නීතිය පිළිබඳ දැනුම ලබා දීම .
11	සිවිල් ඉංජිනේරු පාඨමාලාව	1	1	4	දේශීය	585,000.00	සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ දැනුම ලබාදීම .
12	එකතුව	**11**	**77**	**20**		**39,711,900.00**	

මූලාශ්‍රය - ජාතික පොලිස් අභ්‍යාස ආයතනය

වගු අංක - 59 **සේවාස්ථ පුහුණු කොට්ඨාසය මගින් සිදු කරන ලද පුහුණු වැඩ සටහන්**

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)	වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම.
			(මාස)	දේශීය		
1	ඩිප්ලෝමා පාඨමාල	0	0	0	0	
2	පුහුණු පාඨමාලා (සහතිකපත් පාඨමාලා)	17598	සති 1, සති 2, සහ පැය 150, 200	8,699,079.00	දේශීය	පොලිස් නිලධරයන්ගේ දැනුම, කුසලතා, ආකල්ප හා භාෂා ප්‍රවීණතාවය වර්ධනය සහ පරිගණක සාක්ෂරතාවය වර්ධනය
3	පරිගණක පුහුණු පාඨමාලා	549	සති 6	3,847,920.00	දේශීය	
4	වැඩමුළු	9037	එක් දින සහ දෙදින	20,500.00	දේශීය	
එකතුව		**27184**		**12,567,499.00**		

මූලාශ්‍රය - සේවාස්ථ පුහුණු කොට්ඨාසය

වගු අංක - 60 **පරිගණක පුහුණු මධ්‍යස්ථානය මගින් සිදු කරන ලද පුහුණු වැඩ සටහන්**

අනු අංකය		ප්‍ර.පොප.	කා.ප්‍ර.පොප.	පොප.	කා.පොප.	උ.පොප.	කා.උ.පොප.	පොසැ.	කා.පොසැ.	පොකො.	කා.පොකො.	පොකොවි.	එකතුව
1	කාණ්ඩ අංක 01	0	0	1	0	1	1	6	2	19	4	0	**34**
2	කාණ්ඩ අංක 02	1	1	1	0	1	1	4	3	16	10	0	**38**
3	කාණ්ඩ අංක 03	1	0	0	0	1	0	5	2	18	7	0	**34**
4	කාණ්ඩ අංක 04	1	0	3	0	2	0	12	1	39	2	0	**60**
5	කාණ්ඩ අංක 05	0	0	0	0	4	0	7	3	35	13	1	**63**
6	කාණ්ඩ අංක 06	3	0	3	0	3	0	17	1	44	5	0	**76**
7	කාණ්ඩ අංක 07	3	0	1	0	3	0	14	3	42	8	0	**74**
8	කාණ්ඩ අංක 08	2	0	2	1	1	0	14	4	41	10	0	**75**
එකතුව		**11**	**1**	**11**	**1**	**16**	**2**	**79**	**19**	**254**	**59**	**1**	**454**

මූලාශ්‍රය - තොරුතුරු තාක්ෂණ කොට්ඨාසය

- **ආයතනයේ කාර්ය සාධනය සඳහා පුහුණු වැඩසටහන් වල දායකත්වය.**

ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය භාරය සාර්ථකව ඉටු කිරීම තුළින් එහි කාර්ය සාධනය ඉහළ නංවා ගැනීම සඳහා අවශ්‍ය න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම නිලධරයන්ට ලබාදීම පුහුණු වැඩසටහන් මගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව 95000 කට ආසන්න මානව සම්පත සඳහා විධිමත් පුහුණුවක් ශ්‍රී ලංකා පොලීසිය සතු පොලිස් විද්‍යාල, පොලිස් අභ්‍යාස ආයතන සහ සේවස්ථ පුහුණු ඒකක මගින් ලබාදෙනු ලබන අතර නව තාක්ෂණික දැනුම, භාෂා දැනුම මෙන්ම නීතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තුළින් අපරාධ මැඩලීම සහ සමාජ සුරක්ෂිත භාවය ගොඩනැගීමට මෙම පුහුණු වැඩ සටහන් මගින් ප්‍රබල දායකත්වයක් සපයනු ලබයි.

එමෙන්ම නිරවුල්ව රාජකාරී ඉටුකිරීම සඳහා අවශ්‍ය මානසික මට්ටම වර්ධනය කිරීම සඳහා අදාලවන පාඨමාලා ද පුහුණු වැඩ සටහන් වලට ඇතුළත් වේ. ඊට අමතරව සමාජ විද්‍යාත්මක දැනුම ලබාදීම තුළින් ද සමාජය පිළිබඳව නිලධරයන්ගේ දැනුම සහ ආකල්ප ඉහළ නැංවීම ද ආයතනයේ කාර්ය සාධනය සඳහා ඉවහල් වේ.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

වගු අංක - 61

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**	අනුකූල වේ		
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	භානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

3	**මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA 1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	කොට්ඨාස කාර්යාල වලින් පිළිතුරු ලබා දීමේ ප්‍රමාදයක් පවතී.	සිහිකැඳවීම් කරමින් නියමිත දිනට පිළිතුරු සැපයීමට උනන්දු කරවීම.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01-2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රේ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයොජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		

12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචින වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට මහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන්කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියේල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**	අනුකූල වේ		
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

මූලාශ්‍රය - ප්‍රධාන අභ්‍යන්තර විගණක පොලිස් මූලස්ථානය